ප්‍රගති වාර්තාව 2024

ධීවර,ජලජ හා සාගර සම්පත් අමාත්‍යාංශය

මාලිගාවත්ත, කොළඹ 10

අන්තර්ගතය

		පිටු අංකය
01	ධීවර,ජලජ හා සාගර සම්පත් අමාත්‍යාංශය	03-27
02	ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව	28 -67
03	ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය	68 - 74
04	ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිත ආයතනය	75 - 102
05	ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව	103 - 113
06	ලංකා ධීවර සංස්ථාව	114 - 120
07	සී/ස සීනෝර් පදනම	121 - 123
08	නෝත්සී ලිමිටඩ්	124 - 130
09	පැලියගොඩ මධ්‍යම මත්ස්‍ය වෙළඳ සංකීර්ණය	131 - 132

01
ධීවර,ජලජ හා සාගර සම්පත් අමාත්‍යාංශය

දැක්ම

ධීවර හා ජලජ සම්පත් සංරක්ෂණය සහ තිරසර භාවිතය පිළිබඳ දකුණු ආසියානු කලාපයේ ප්‍රමුඛයා වීම.

මෙහෙවර

වර්තමාන හා අනාගත පරපුරේ යහපත උදෙසා ධීවර හා ජලජ සම්පත් භාවිතය කළමනාකරණය කිරීම.

ප්‍රතිපත්තිමය අරමුණු

- විද්‍යානුකූල පදනමකින් යුත් (scientific base) තොරතුරු භාවිත කරමින් සම්පත් තිරසර ලෙස කළමනාකරණය කිරීම.
- ධීවර කර්මාන්තය කලාපීය හා ජාත්‍යන්තර බැඳීම්වලට අනුකූල වීම.
- සමුද්‍රීය ධීවර නිෂ්පාදනය ඉහළ නැංවීම.
- ජලජීවී වගා සහ මිරිදිය ධීවර නිෂ්පාදනය ඉහළ නැංවීම.
- පසු අස්වනු හානි අවම කිරීම සහ අගය එකතු කිරීම ඉහළ නැංවීම.
- ඒක පුද්ගල මත්ස්‍ය පරිභෝජනය ඉහළ නැංවීම.
- අපනයන ආදායම් ඉහළ නැංවීම.
- විනෝදාත්මක ක්‍රියාකාරකම්, රැකියා හා ව්‍යාපාරික සංවර්ධනය සඳහා පවතින අවස්ථා ඉහළ නැංවීම.
- ධීවර ප්‍රජාවන්ගේ සමාජ ආර්ථික ක්‍රියාකාරකම් වැඩිදියුණු කිරීම.

ප්‍රධාන කාර්යයන්

- සාගර, කිවුල් දිය හා අභ්‍යන්තර ධීවර කර්මාන්තය සංවර්ධනය කිරීම
- ප්‍රතිපත්ති හා වැඩසටහන් විධිමත්ව සකස් කිරීම
- ජාතික ජලජ සම්පත් සංවර්ධනය හා තිරසර භාවිතය
- නිෂ්පාදන අන්තර්ජාතික තත්ත්වයට උසස් වන පරිදි වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- පාරිභෝගික අවශ්‍යතා තෘප්තිමත් කරමින් මත්ස්‍ය නිෂ්පාදන දරාගත හැකි මිලකට සැපයීම
- මත්ස්‍ය නිෂ්පාදන අපනයනය සඳහා පහසුකම් සැලසීම

ධීවර අංශයට දායකත්වය සපයන ආයතන හා අරමුණු

ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව (DFAR)	**අපේක්ෂිත අරමුණු** - ශ්‍රී ලංකාවේ ධීවර හා ජලජ සම්පත් කළමනාකරණය, සංවර්ධනය හා සංරක්ෂණය. **වගකීම්** - කලාපීය සහ අන්තර්ජාතික සම්මුතීන්ට හා රෙගුලාසිවලට අනුකූලව 1996 අංක 02 දරන ධීවර හා ජලජ සම්පත් පනත ක්‍රියාත්මක කිරීම සහ ධීවර කළමනාකරණ කටයුතු හා නෛතික විධිවිධාන යාවත්කාලීන කිරීම.
ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනය(NARA)	**අපේක්ෂිත අරමුණු** - ජලජ සම්පත් පිළිබඳ පර්යේෂණ, ජලජ සම්පත් සංවර්ධනය, සංරක්ෂණය හා කළමනාකරණය. **වගකීම්** - 1981 අංක 54 දරන ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතන පනත යටතේ ස්ථාපිත මෙම ආයතනය මගින් ජලජ සම්පත් හා ජලජීවී වගාව, ධීවර තාක්ෂණය, මත්ස්‍ය හා පසුඅස්වනු තාක්ෂණය, පාරිසරික අධ්‍යයනය, සමුද්‍ර ජීව විද්‍යාව, ජල ශාස්ත්‍රය හා සාගර අධ්‍යයන කටයුතු සිදුකිරීම.
ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය (NAQDA)	**අපේක්ෂිත අරමුණු** - වගා කිරීම මත පදනම් වූ මිරිදිය ධීවර කර්මාන්තය හා ජලජීවී වගාව ප්‍රවර්ධනය, කළමනාකරණය සහ නියාමනය. **වගකීම්** - 1998 අංක 53 දරන ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරී පනත යටතේ ස්ථාපිත කරන ලද මෙම ආයතනය මඟින් මිරිදිය ධීවර කර්මාන්තය සහ ජලජීවී වගාවට අවශ්‍ය බීජ සැපයීම හා ව්‍යාප්ති සේවය ලබාදීම, මිරිදිය හා ජලජීවී වගා කටයුතු අධීක්ෂණය, ජලජීවී වගා පුහුණු කටයුතු සැපයීම.
ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව (CFHC)	**අපේක්ෂිත අරමුණු -** ධීවර වරායන්, නැංගුරම්පොළවල් සැලසුම් කිරීම, ඉදිකිරීම හා පවත්වාගෙන යාම. **වගකීම්** - 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික සංස්ථා පනත යටතේ පිහිටුවනු ලැබූ මෙම ආයතනය මගින් වර්තමානයේ ධීවර වරායන් 23ක් හා නැංගුරම්පොළවල් 58ක් පවත්වාගෙන යාම.
ලංකා ධීවර සංස්ථාව (CFC)	**අපේක්ෂිත අරමුණු** - මත්ස්‍ය නිෂ්පාදකයාට හා පාරිභෝගිකයාට උපරිම වාසි සැලසෙන අයුරින් මත්ස්‍ය වෙළඳපොළ සඳහා දායක වීම. **වගකීම් -** 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික සංස්ථා පනත යටතේ ස්ථාපිත මෙම ආයතනය මගින් මාළු මිලදී ගැනීම හා විකිණීම, අයිස් නිපදවීම හා විකිණීම, ශීතාගාර පහසුකම් පවත්වාගෙන යාම හා මත්ස්‍ය අතුරු නිෂ්පාදන විකිණීම සිදුකරයි.
සීමාසහිත සීනෝර් පදනම	**අපේක්ෂිත අරමුණු** - ධීවර කර්මාන්තයට අදාළ වන්නා වූ යෙදවුම් හා සැපයුම් ලබාදීම. **වගකීම්** - 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි කර ඇති මෙම ආයතනය මගින් ෆයිබර් ග්ලාස් ආශ්‍රිත උපකරණ හා ඔරු, බෝට්ටු නිෂ්පාදනය කරන අතර අනිකුත් සියලුම ධීවර ආම්පන්න අළෙවිය සිදු කරයි.
නෝත්සී ලිමිටඩ්	**අපේක්ෂිත අරමුණු** - දේශීය ධීවර කාර්මිකයින් ගේ අවශ්‍යතා පිරිමසමින් උසස් ප්‍රමිතියකින් යුත් මාළු දැල් හා ධීවර ආම්පන්න සැපයීම. **වගකීම් -** 1982 අංක 17 දරණ සමාගම් පනත යටතේ ආරම්භ කර, 2007 අංක 7 දරණ නව සමාගම් පනත යටතේ නැවත ලියාපදිංචි කරමින් පිහිටුවන ලද මාළු දැල් නිෂ්පාදනය කරන සමාගමකි.
පෑලියගොඩ මධ්‍යම මත්ස්‍ය වෙළඳ සංකීර්ණය	අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 10/0958/438/001 මගින් කළමනාකරණ භාරයක් පිහිටුවීම **වගකීම** - මත්ස්‍ය වෙළඳ සංකීර්ණයේ කළමනාකරණ හා මෙහෙයුම් ක්‍රියා පිළිබඳ අදාල ප්‍රතිපත්ති සකස් කිරීම

ජාතික ආර්ථිකයේ වර්ධනයට ධීවර අංශයේ දායකත්වය

2024 වර්ෂයේ ධීවර අංශයේ සමස්ත ප්‍රගතිය

ශ්‍රී ලංකාවේ ධීවර සම්පත් පදනම වර්ග කිලෝමීටර් 517,000 ක අනන්‍ය ආර්ථික කලාපයකින්ද, වර්ග කිලෝ මීටර් 21,500 ක දේශීය ජල තීරයකින්ද, වර්ග කිලෝ මීටර් 1,580 ක කලපු හා ගං මෝයවල් වලින්ද, වර්ග කිලෝ මීටර් 2,600 ක මිනිසා විසින් සාදන ලද ජලාශ වලින්ද සමන්විත වේ. බොකු, කලපු, ජලාශ සහ වෙරළබඩ මෙන් ම ජලාශ ආශ්‍රිතව පිහිටා ඇති ඉඩම් ද ජලජීව්වගා සංවර්ධනය සඳහා අවශ්‍ය සම්පත් පදනම නිර්මාණය කරයි.

ධීවර අමාත්‍යාංශයේ සංඛ්‍යාලේඛන වලට අනුව මෙරට ධීවරයින් සංඛ්‍යාව 318,470 ක් වන අතර මින් 223,720ක් කරදිය ධීවර අංශයේ ක්‍රියාවේ නියුක්ත වී සිටින අතර ඉන් 85% ක් පමණ වෙරළාසන්න ධීවරයින් වන අතර 34,550ක් බහු දින ධීවර යාත්‍රා වලින් අක්වෙරළ හා ගැඹුරු මුහුදේ ධීවර කර්මාන්තයෙහි නිරතවේ. මෙරට ධීවර පවුල් සංඛ්‍යාව 273,240 ක් වන අතර ධීවර කර්මාන්තයෙන් සෘජුවම යැපෙන්නන් සංඛ්‍යාව 1,123,000 ක් පමණ වේ. ධීවර කර්මාන්තය හා ආශ්‍රිත වෙනත් යැපීම් සලසා ගන්නා පිරිස මිලියන 2.7 ක් පමණ වන බවට ඇස්තමේන්තු කර ඇත. ඒ අනුව, ශ්‍රී ලංකාවේ සමස්ථ ජනගහනයෙන් 18% ක් පමණ ධීවර කර්මාන්තය ආශ්‍රිතව ජීවනෝපාය සලසා ගනියි.

2024 ජනවාරි සිට නොවැම්බර් මාසය දක්වා කාලපරිච්ඡේදය තුලදී කරදිය ධීවර කර්මාන්තය මගින් මෙ.ටො 279,260 ක හා මිරිදිය ධීවර කර්මාන්තය තුළින් මෙ.ටො.96,415 ක මත්ස්‍ය අස්වැන්නක් ලැබී ඇත. ඒ අනුව එම කාලපරිච්ඡේදය තුල සමස්ත මත්ස්‍ය නිෂ්පාදනය මෙ.ටො 375,675 කි.

මහජනතාවගේ සත්ත්ව ප්‍රෝටීන ප්‍රධාන ප්‍රභවය ලෙස මත්ස්‍ය පරිභෝජනය ප්‍රචලිතය. 2024 වර්ෂයේ ජනවාරි සිට නොවැම්බර් මාසය දක්වා කාලපරිච්ඡේදය තුලදී ඒක පුද්ගල මත්ස්‍ය පරිභෝජනය දිනකට ග්‍රෑම් 36.85 කි. එය පසුගිය වර්ෂයට සාපේක්ෂව 7.4% ක වැඩිවීමකි. දැනට මෙරට පරිභෝජනයට අවශ්‍ය සමස්ථ මත්ස්‍ය ප්‍රමාණයෙන් 72% ක් පමණ දේශීය මත්ස්‍ය නිෂ්පාදනයෙන් සපයයි.

2024 වර්ෂයේ ජනවාරි සිට නොවැම්බර් මාසය දක්වා කාලපරිච්ඡේදය තුලදී මත්ස්‍ය අපනයනවල වටිනාකම රු.මි 78,969 කි. (ඇ.ඩො.මි. 260.2) ජාතික අපනයන ආදායමට ධීවර අංශයේ දායකත්වය 2.3% ක් පමණ වේ. අපනයන දත්තවලට අනුව, ශ්‍රී ලංකාවේ මත්ස්‍ය නිෂ්පාදනවලින් 42.9% ක් යුරෝපය වෙත අපනයනය කරන අතර ඉන් 29.3% ක් යුරෝපා සංගමය වෙත ද, ඉතිරි 13.6% ක් යුරෝපා සංගමය නොවන රටවල් වෙත ද අපනයනය කරයි. මීට අමතරව, එම කාලපරිච්ඡේදය තුළදී විසිතුරු මත්ස්‍ය අපනයනය මගින් රු.මි. 6,812.8 ක ආදායමක් ලබාගැනිමට හැකිවී ඇත.

2024 වර්ෂය සඳහා 151 වැය ශීර්ෂය යටතේ ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යාංශය සඳහා රු. මි. 7,173.41 ප්‍රාග්ධන ප්‍රතිපාදන හා රු.මි. 1,981.99 ක පුනරාවර්තන ප්‍රතිපාදන වෙන් කල අතර එහි මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් රු.මි.6,057.44 (84%) හා රු.මි. 1,828.20 (92.24%) කි. 2024 වර්ෂය සඳහා 290 වැය ශීර්ෂය යටතේ ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව වෙත රු. මි. 102.08ක ප්‍රාග්ධන ප්‍රතිපාදන හා රු.මි. 1,657.99 ක පුනරාවර්තන ප්‍රතිපාදන වෙන් කල අතර එහි මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් රු.මි.36.42 (36%) හා රු.මි. 875.38 (53%) කි.

ධීවර ජනතාවගේ ජීවන තත්ත්වය උසස් කරලීම හා මත්ස්‍ය පසු අස්වනු හානි අවම කිරීම මගින් ගුණාත්මකභාවයෙන් ඉහළ මත්ස්‍ය නිෂ්පාදනයක් අරමුණු කරගනිමින් ධීවර වරායන් සංවර්ධනය කිරීම

2024 වසරේදී ක්‍රියාත්මක වූ ප්‍රමුඛ වැඩසටහනකි. මෙමගින් ගන්දර ධීවර වරායේ ගොඩබිම ආශ්‍රිත ඉදිරි වැඩකටයුතු නිමකිරීම හා මයිලඩ්ඩි ධීවර වරායේ දෙවන අදියරේ වැඩකටයුතු අවසන් කර ඇත. 2024 අයවැය යෝජනාව යටතේ උතුරු පළාත් ධීවර තොටුපලවල් හා නැංගුරම්පොල සංවර්ධනයට අවශ්‍ය අනුමැතීන් ලබාගෙන අඛණ්ඩව ක්‍රියාත්මක වෙමින් පවතී. හික්කඩුව, අම්බලන්ගොඩ, වාලච්චේන හා දොඩංදූව ධීවර වරායන් සංවර්ධනය කිරීම සඳහා අදාල මූලික පාරිසරක වාර්තා මේ වනවිට සකස් කරමින් පවතී. කලපු හා අභ්‍යන්තර ජලාශ ආශ්‍රිත ජලජ පරිසර සංරක්ෂණය හා සංවර්ධනය තුලින් ජලජීවී නිෂ්පාදනය ඉහල නැංවීම ප්‍රධාන අරමුණ කරගනිමින් නන්දිකඩාල් කලපුව පිරිසිදු කිරීමේ කටයුතු රාජ්‍ය හා පෞද්ගලික හවුල්කාරීත්වයක් යටතේ සම්පූර්ණ කිරීමට අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කර ඇත. නයාරු කලපුව පිරිසිදු කිරීම සඳහා නාරා ආයතනය විසින් මූලික පාරිසරික අධ්‍යනය සිදු කර අවසන්ය.

ආහාර සුරක්ෂිතතාව සහතික කිරීම සඳහා ලෝක ආහාර හා කෘෂිකර්ම සංවිධානය (FAO) සංකල්පමය වශයෙන් හඳුන්වා දෙන ලද "නීල/ හරිත වර්ධන" (Blue Growth) සංකල්පය මගින් දේශගුණික විපර්යාස වලට අනුවර්තනයක් ලෙස මෙන්ම ආහාර සුරක්ෂිතතාව සඳහා මත්ස්‍ය ගහන වැඩිදියුණු කිරීම සහතික කිරීම සඳහා වෙරළබඩ ප්‍රදේශවල මත්ස්‍ය ඒකරාශී කිරීමේ ඇටවුම් (FAD) ස්ථාපනය කිරීම මඟින් ආහාරයට ගත හැකි මසුන්ගේ ඒකරාශීවීම මෙම ඇටවුම් ආශ්‍රිතව සැලකිය යුතු ලෙස වර්ධනය වී ඇත. එසේම මෙම මත්ස්‍ය ඒකරාශි වීම හේතුවෙන් දැනටමත් ප්‍රදේශයේ ධීවර ප්‍රජාව මෙම වැඩසටහන ගැන සිය ප්‍රසාදය පළකර සිටිති.

උතුරු හා නැගෙනහිර පළාත්වල අඩු ආදායම්ලාභී ධීවර පවුල් සඳහා රු.මි. 1,804.00 ක වීන සමූහාණ්ඩු ආධාර යටතේ සහල් මෙට්‍රික් ටොන් 1,630 ක්,පෙර සැකසූ නිවාස 500ක් සහ මත්ස්‍ය දැල් 75,000ක් ලබා දීම 2024 වර්ෂයේදී සිදුකරන ලදී.

තිරසාර සංස්කෘතිය පදනම් කරගත් මිරිදිය ධීවර කර්මාන්තය සංවර්ධනය කිරීම සහ ග්‍රාමීය ජීවනෝපාය වැඩිදියුණු කිරීම සඳහා ධීවර අමාත්‍යාංශය සමඟ එක්ව ජපාන රජය එක්සත් ජාතීන්ගේ ආහාර හා කෘෂිකර්ම සංවිධානය (FAO) හරහා ඇමරිකානු ඩොලර් මිලියන 3 ක ප්‍රදානයක් ලබා දී ඇති අතර කාලගුණ හා දේශගුණික විපර්යාසයන් මඟින් ධීවර ක්ෂේත්‍රය වෙත ඇතිකරන බලපෑම්වලට අවම කිරීම සඳහා FAO සංවිධානය හා ජාත්‍යන්තර සංවර්ධනය සඳහා වූ එක්සත් ජනපද නියෝජිතායතනය (USAID) මඟින් ද ලබාදුන් ප්‍රධානයන් යටතේ ව්‍යාපෘති කිහිපයක් ක්‍රියාත්මක කිරීමට අදාල කටයුතු සිදු කෙරෙමින් පවතී.

නිසි විද්‍යාත්මක ක්‍රමවේද හා ප්‍රායෝගික උපක්‍රම තුලින් තිරසර හා පරිසර හිතකාමී ලෙස සංවර්ධනය හා කළමනාකරණය කිරීමටත්, ඒ තුලින් මත්ස්‍ය නිෂ්පාදන සුලභ කිරීම හා පාරිභෝගිකයාට සාධාරණ මිලකට ලබාගත හැකි තත්ත්වයකට පත් කිරීමත්, කර්මාන්තයේ නියැලෙන්නන්ගේ ජීවන තත්ත්වය උසස් කිරීමත් අරමුණු කොට නව රජයේ 'පොහොසත් රටක් ලස්සන ජීවිතයක්' ප්‍රතිපත්ති රාමුවේ තිරසර කළමනාකරණයක් - ගුණාත්මක මත්ස්‍ය සම්පතක් ප්‍රධාන ප්‍රතිපත්තියක් ලෙස දක්වා ඇති අතර ඒ අනුව වැඩසටහන්/ව්‍යාපෘති ධීවර කර්මාන්තය නංවාලීම සඳහා 2025 වසර තුල ක්‍රියාත්මක කිරීමට කටයුතු කරනු ඇත.

සමස්ථ මත්ස්‍ය නිෂ්පාදනයේ දායකත්වය

1.1 වාර්ෂික මත්ස්‍ය නිෂ්පාදනය වර්ධනය කර ගැනීම.

2024 වසරේ ජනවාරි සිට නොවැම්බර් දක්වා කාලපරිච්ඡේදය තුළ දිවයිනේ සමස්ත මත්ස්‍ය නිෂ්පාදනය මෙ.ටො 375,675 ක් විය. මෙහි වැඩි දායකත්වයක් ලබා දී ඇත්තේ වෙරළාසන්න ධීවර කර්මාන්තයෙනි. එහි ප්‍රතිශතය 40.1% කි. එසේම පිළිවෙළින් 34.2%ක් ගැඹුරු මුහුදෙන් හා 25.7%ක් මිරිදිය හා ජලජීවී වගාව මඟින් දායකත්වයක් සැපයේ.

1.2 කරදිය මත්ස්‍ය නිෂ්පාදනය (වෙරළාසන්න, අක්වෙරළ/ ගැඹුරු මුහුද)

සමස්ත මත්ස්‍ය නිෂ්පාදනය සඳහා වෙරළාසන්න හා ගැඹුරු මුහුදේ දායකත්වය ක්‍රමානුකූලව වැඩි කර ගැනීමට හැකියාව ලැබී ඇත. 2024 ජනවාරි සිට නොවැම්බර් දක්වා කාලය තුළ ගැඹුරු මුහුදේ ධීවර කර්මාන්තයෙන් මෙ.ටො. 128,600 ක් ද, වෙරළාසන්න ධීවර කර්මාන්තයෙන් මෙ.ටො. 150,660 ක අස්වැන්නක් ද ලබාගැනීමට හැකිවූ අතර, සමස්ත කරදිය අස්වැන්න මෙ.ටො. 279,260 කි.

1.3 මිරිදිය හා ජලජීවී වගා නිෂ්පාදනය

2024 ජනවාරි සිට නොවැම්බර් දක්වා කාල පරාසය තුළ සමස්ත මිරිදිය මත්ස්‍ය හා ජලජීවී වගා නිෂ්පාදනය මෙ.ටො. 96,415ක් වූ අතර සමස්ත මත්ස්‍ය නිෂ්පාදනය සඳහා මෙහි දායකත්වය 25.7% කි.

2024 දෙසැ 31 වන විට සමස්ත මත්ස්‍ය ඇඟිල්ලන් නිෂ්පාදනය මිලියන 74.03 ක් වන අතර ඉන් මිලියන 27.50 ක් ජලජීවී වගා සංවර්ධන මධ්‍යස්ථාන මඟින් නිෂ්පාදනය කර ඇති අතර, ඉතිරිය ප්‍රජා මූලික මත්ස්‍ය බීජ නිෂ්පාදන ඒකක, පෞද්ගලික පොකුණු, ජලාශ තුළ දැල්කූඩු හා කොටු භාවිතය මඟින් නිෂ්පාදනය සිදු කොට ඇත.

2024 දෙසැ 31 වන විට සමස්ත මිරිදිය ඉස්සන් පසුකීටයන් නිෂ්පාදනය මිලියන 34.71 ක් වන අතර ඉන් මිලියන 25.06 ක් ජලජීවී වගා සංවර්ධන මධ්‍යස්ථාන මඟින් නිෂ්පාදනය කර ඇති අතර ඉතිරිය නිෂ්පාදනය සඳහා පෞද්ගලික අංශයෙන් දායකත්වය ලැබී ඇත.

එසේම පෞද්ගලික අංශය විසින් කිවුල් දිය ඉස්සන් පසුකීටයන් මිලියන 426 ක් නිෂ්පාදනය කර ඇත.

2024 වසරේ දේශීය මත්ස්‍ය නිෂ්පාදනය ඉහළ නැංවීමේ අවකාශය පුළුල් කරමින් ජනතාවගේ පෝෂණ තත්ත්වය ඉහළ නංවාලීම, රැකියා උත්පාදනය , අපනයන වර්ධනය හා ග්‍රාමීය ආර්ථිකය ශක්තිමත් කරලීම උදෙසා උපරිම දායකත්වය ලබා ගැනීමේ අරමුණින් යුතුව ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය විසින් වගා පාදක ධීවර කර්මාන්තය, කිවුල්දිය හා වෙරළබඩ ජලජීවී වගාව ආශ්‍රිතව සංවර්ධනය සඳහා විවිධ දිස්ත්‍රික්කයන්හි කටයුතු ක්‍රියාවට නංවා ඇත.

වගුව 1.1 මත්ස්‍ය නිෂ්පාදන පිළිබඳ දත්ත								
මත්ස්‍ය නිෂ්පාදනය (මෙ.ටො)								
ධීවර උප අංශ		**2020**	2021	2022	**2023**	2024 (ජන-නොවැ)	වෙනස 2024-2023 (%)	ප්‍රතිශතය (%)
1	ගැඹුරු මුහුදෙන්	144,370	153,415	131,170	128,950	128,600	9.20	34.2
2	වෙරළාසන්න	182,560	178,260	149,440	164,995	150,660	0.26	40.1
	මුළු කරදිය	**326,930**	**331,675**	**280,610**	**293,945**	**279,260**	**4.19**	**74.3**
3	මිරිදිය	84,310	80,720	94,860	93,440	82,195	(2.73)	21.9
4	ජලජීවී වගා	10,140	9,105	7,680	8,085	7,470	(3.24)	2.0
5	ඉස්සන්	7,360	14,410	14,080	11,600	6,750	(35.28)	1.8
	මුළු මිරිදිය	**101,810**	**104,235**	**116,620**	**113,125**	**96,415**	**(6.07)**	**25.7**
	සමස්ථ නිෂ්පාදනය	**428,740**	**435,910**	**397,230**	**407,070**	**375,675**	**1.35**	**100.0**

මූලාශ්‍රය: සංඛ්‍යාලේඛන අංශය, ධීවර ජලජ හා සාගර සම්පත් අමාත්‍යාංශය

වගුව 1.2 2024 මත්ස්‍ය නිෂ්පාදන පිළිබඳ දත්ත								
ආංශික මත්ස්‍ය නිෂ්පාදන (මෙ.ටො.)								
	කරදිය මත්ස්‍ය නිෂ්පාදනය			මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය				සමස්ථ නිෂ්පාදනය
	අක් වෙරළ	වෙරළාසන්න හා කළපු	මුළු කරදිය	මිරිදිය	ජලජීවී වගා	ඉස්සන්	මුළු මිරිදිය	
2024								
ජන	10,140	15,270	25,410	12,750	280	680	13,710	39,120
පෙබ	11,010	16,380	27,390	6,550	230	480	7,260	34,650
මාර්තු	12,570	14,290	26,860	6,890	400	560	7,850	34,710
අප්‍රේල්	11,410	13,430	24,840	7,080	355	640	8,075	32,915
මැයි	11,100	10,380	21,480	7,015	500	515	8,030	29,510
ජුනි	12,050	12,880	24,930	6,935	715	780	8,430	33,360
ජූලි	12,010	13,410	25,420	7,635	1,380	725	9,740	35,160
අගෝ	12,560	13,670	26,230	8,135	1,135	905	10,175	36,405
සැප්	10,650	13,680	24,330	7,385	1,565	450	9,400	33,730
ඔක්	12,060	14,990	27,050	5,710	570	550	6,830	33,880
නොවැ	13,040	12,280	25,320	6,110	340	465	6,915	32,235

මූලාශ්‍රය: සංඛ්‍යාලේඛන අංශය, ධීවර ජලජ හා සාගර සම්පත් අමාත්‍යාංශය

1.4. ඒක පුද්ගල මත්ස්‍ය පරිභෝජනය වැඩි කර ගැනීම.

මත්ස්‍ය පරිභෝජනය ඉහළ නැංවීමෙන් ශ්‍රී ලාංකික ජනතාවගේ පෝෂණ ඌනතාවයන් අවම කර මන්දපෝෂණයෙන් තොර සෞඛ්‍ය සම්පන්න ජනතාවක් බිහි කර ගැනීමට මහ පාදයි.

2024 ජනවාරි සිට නොවැම්බර් දක්වා කාලය තුළ ඒක පුද්ගල මත්ස්‍ය පරිභෝජනය දිනකට ග්‍රෑම් 36.85 ක් ලෙස වාර්තා වී ඇත. මෙම ඒක පුද්ගල මත්ස්‍ය පරිභෝජනය සඳහා දේශීය කරදිය හා මිරිදිය නිෂ්පාදන මෙන්ම ආනයනය කරන ලද මත්ස්‍ය නිෂ්පාදනද දායකවී ඇත.

1.5. මත්ස්‍ය හා මත්ස්‍ය නිෂ්පාදන ආනයනය

හාල්මැස්සන්, කරවල, උම්බලකඩ, ටින් මාළු හා ආහාරයට ගන්නා මසුන් මෙරටට ආනයනය කරනු ලබන ප්‍රධානතම මත්ස්‍ය හා මත්ස්‍ය නිෂ්පාදන වේ. මුළු ආනයනයෙන් වැඩි දායකත්වයක් ලබා දෙන්නේ කරවල හා හැල්මැස්සන් ය. ආනයනික මත්ස්‍ය ප්‍රමාණයෙන් කොටසක් අගය වැඩි කොට ප්‍රති අපනයනය කරන අතර ඉතිරිය දේශීය පරිභෝජනයට යොදා ගැනේ. දේශීය මත්ස්‍ය නිෂ්පාදනය හා පරිභෝජනය අතර පරතරය පිරවීමට මෙම ආනයන ඉතා වැදගත්ය. 2024 ජනවාරි සිට නොවැම්බර් දක්වා කාලය තුළ මත්ස්‍ය හා මත්ස්‍ය නිෂ්පාදන මෙට්‍රික් ටොන් 53,192ක් ආනයනය කර ඇති අතර එහි වටිනාකම රුපියල් මිලියන 33,740.1කි.

වගුව 1.3 ආනයනික මත්ස්‍ය හා මත්ස්‍ය නිෂ්පාදන වල වටිනාකම(රු.මි)

අයිතමය	2021	2022	2023	2024 (ජන - නොවැ)	වෙනස % 2024/ 2022	වෙනස % 2024/ 2023	මුළු ප්‍රතිශතය
කරවල	4,871	3,470.0	3,510.8	4,906.0	49.3	52.7	14.5
වියළි හාල්මැස්සන්	9,119	9,955.5	9,010.9	13,247.4	43.3	65.8	39.3
උම්බලකඩ	1,453	925.7	925.6	1,280.3	50.3	45.7	3.8
ටින් මාළු	4,891	2,671.9	6,172.6	3,316.5	33.6	-39.5	9.8
මත්ස්‍ය ආහාර	3,401	2,107.9	2,744.2	4,621.5	126.2	75.3	13.7
සජීවී මත්ස්‍යයින්	253	430.0	368.6	449.3	17.4	35.6	1.3
අනෙකුත්	1,091	2,103.2	4,001.1	5,919.0	206.0	67.6	17.5
එකතුව	**25,080**	**21,664.2**	**26,733.7**	**33,740.1**	**66.8**	**40.2**	**100.0**

මූලාශය: සංඛ්‍යාලේඛන අංශය, ධීවර ජලජ හා සාගර සම්පත් අමාත්‍යාංශය

1.6. මත්ස්‍ය අපනයනය

අපනයනය ක්ෂේත්‍රය තුළ මත්ස්‍ය ආහාර, විසිතුරු මසුන් හා මුහුදු පැළෑටි අපනයනයෙන් ජාතික ආර්ථිකය සවිමත් කරලීම උදෙසා ධීවර අංශයෙන් ප්‍රමුඛ වූ දායකත්වයක් ලබා දෙනු ලැබේ. මෙම කාර්යය ඉටුකිරීමේදී ආනයනික රටවල නියෝගවලට අනුගත වෙමින් ගුණාත්මක හා සෞඛ්‍ය ආරක්ෂිත තත්ත්වයෙන් යුතු උසස් මත්ස්‍ය නිෂ්පාදන අපනයනය සඳහා එම කාර්යයේ නියුතු පාර්ශ්වකරුවන්ට නිසි මඟ පෙන්වීම හා ආධාර ලබා දීම මගින් මත්ස්‍ය අපනයන ක්ෂේත්‍රයේ වර්ධනයක් ඇති කරලීමට පියවර ගෙන ඇත.

වගුව 1.4 : මත්ස්‍ය හා මත්ස්‍ය නිෂ්පාදනවල අපනයන ප්‍රමාණය හා වටිනාකම

මත්ස්‍ය වර්ගය	අපනයන ප්‍රමාණය (මෙ.ටො.)		අපනයන වටිනාකම (රු.මි.)	
	2023	2024 ජන-නොවැ	2023	2024 ජන-නොවැ
සජීවී මසුන්	අදාල නැත	අදාල නැත	8,641	6,812.8
ඉස්සන්	4,020	3,219.1	10,393	8,352.3
පොකිරිස්සන්	127	65.1	1,437	638.6
කකුළුවන්	1,678	1,964.2	7,878	8,248.9
මුහුදු කූඩැල්ලන්	401	232.6	4,897	3,011.7
වෙනත් මෘද්වංශිකයින්	3,115	1,974.5	6,084	3,933.7
මෝරා	100	85.2	1,314	1,074.6
මාළු බොකු	7	7.9	238	258.8
බෙල්ලන් සහ කවච මසුන්	269	411.4	255	214.0
සකස් කළ මසුන්	14,380	12,210.5	56,703	45,436.4
වෙනත්	407	331.7	1,277	987.3
මුළු එකතුව	**24,503**	**20,502.1**	**99,118**	**78,969.2**

මූලාශය: සංඛ්‍යාලේඛන අංශය, ධීවර ජලජ හා සාගර සම්පත් අමාත්‍යාංශය

1.7. විසිතුරු මසුන් අපනයනය

ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය නව විසිතුරු මත්ස්‍ය ප්‍රභේද හඳුන්වා දීම, අභිජනන කටයුතු, මත්ස්‍ය රෝග නිර්ණය සහ රෝග පැතිරීයාම වැළැක්වීම, ගුණාත්මක තත්ත්වයේ මව් සතුන් ලබාදීම, ගුණාත්මක තත්ත්වයේ ආහාර ලබා දීම හා සම්බන්ධව වගා කරුවන් පුහුණු කිරීම හා දැනුවත් කිරීම, නාරා ආයතනයේ සහයෝගයෙන් මසුන්ගේ නව ප්‍රභේද බිහි කිරීම, තාක්ෂණික සංවර්ධනය, මත්ස්‍ය රෝග නිර්ණය, වගා කරුවන්ට ණය සහන ලබා ගැනීමට සහාය වීම ආදී ක්‍රමෝපායන් මගින් විසිතුරු මසුන් අපනයනය දිරිමත් කිරීමට කටයුතු යොදා ඇත.

2024 වසරේ ජනවාරි - නොවැම්බර් දක්වා කාලපරිච්ඡේදයේදී විසිතුරු මසුන් අපනයනයෙන් රු.මිලියන 6,812.8 ක් උපයා ගැනීමට හැකියාව ලැබී ඇත.

ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක ව්‍යාපෘතිවල ප්‍රගතිය

ධීවර ක්ෂේත්‍රයේ සංවර්ධනය ඉලක්ක කර ගෙන ක්‍රියාත්මක කරන සියලුම සංවර්ධන වැඩසටහන් සැලසුම් කිරීම, මෙහෙයවීම හා සමස්ථ ධීවර සංවර්ධනයට අදාල කාර්යයන් කෙරෙහි බලපාන ප්‍රතිපත්ති සම්පාදනය ධීවර අමාත්‍යාංශයේ ප්‍රමුඛ වගකීමකි. ඒ අනුව, ධීවර අංශය සම්බන්ධයෙන් මෙරට ජාතික ප්‍රතිපත්තියෙහි සමුද්‍රීය ධීවර නිෂ්පාදනය ඉහළ නැංවීම, ජලජීවී වගා සහ මිරිදිය ධීවර නිෂ්පාදනය ඉහළ නැංවීම, පසු අස්වනු හානි අවම කිරීම සහ අගය එකතු කිරීම ඉහළ නැංවීම, ඒක පුද්ගල මත්ස්‍ය පරිභෝජනය ඉහළ නැංවීම, අපනයන ආදායම් ඉහළ නැංවීම, විනෝදාත්මක ක්‍රියාකාරකම්, රැකියා හා ව්‍යාපාරික සංවර්ධනය සඳහා පවතින අවස්ථා ඉහළ නැංවීම, ධීවර ප්‍රජාවන්ගේ සමාජ-ආර්ථික ක්‍රියාකාරකම් වැඩිදියුණු කිරීම යන අරමුණු ළඟාකර ගැනීමට අවශ්‍ය සියලු වැඩසටහන් සම්බන්ධීකරණය හා ක්‍රියාත්මක කිරීම මෙම අමාත්‍යාංශය සතු ප්‍රධානම කාර්යභාරයක් වේ.

1. කලපු පිරිසිදු කිරීම හා සංරක්ෂණය

කලපු හා අභ්‍යන්තර ජලාශ ආශ්‍රිත ජලජ පරිසර සංරක්ෂණය හා සංවර්ධනය තුළින් ජලජීවී නිෂ්පාදන ඉහළ නැංවීම ප්‍රධාන උපාය මාර්ගය කර ගනිමින් මත්ස්‍ය හා ජලජීවී නිෂ්පාදනය ඉහළ නැංවීමේ අරමුණෙන් යුතුව කලපු සංවර්ධනය හා සංරක්ෂණය කිරීමේ ව්‍යාපෘතිය 2018 වර්ෂයේ දී ආරම්භ කරන ලදී.

කලපු පිරිසිදු කිරීම හා කලපුවේ ජල හුවමාරුව ක්‍රමවත්ව සිදුවන පරිදි ඇල මාර්ග ගැඹුරු කිරීම තුළින් කලපු තුළ ස්වභාවික මත්ස්‍ය ගහනය ඉහළ නැංවීම, ජලජීවී වගා සංවර්ධනය, පසු අස්වනු නාස්තිය අවම කිරීම ඉලක්ක කර ගත් යටිතල පහසුකම් සංවර්ධනය කිරීම, අනවසර අල්ලා ගැනීම් හා ගොඩකිරීම් වළක්වා සංරක්ෂණය කෙරෙහි ඉවහල් වන කලපු මායිම් ලකුණු කිරීම, ජීවනෝපාය සංවර්ධනය, කඩොලාන සංරක්ෂණය කිරීම, තහනම් ආම්පන්න ඉවත් කිරීම හා කලපු කළමනාකරණය ශක්තිමත් කිරීම හා මත්ස්‍ය පැටවුන් තැන්පත් කිරීම තුළින් මත්ස්‍ය නිෂ්පාදනය ඉහළ නැංවීම මෙම ව්‍යාපෘතියෙහි ඍජු අරමුණු වේ. එමෙන්ම නව රැකියා අවස්ථා බිහිකිරීම, සංචාරක කර්මාන්තය ව්‍යාප්ත කිරීම යන ඉලක්කයන් ද මෙම ව්‍යාපෘතිය තුළින් ළඟා කර ගැනීමට අපේක්ෂා කෙරේ. 2024 වර්ෂයෙහි මෙම ව්‍යාපෘතිය සඳහා රු.මි. 100 ක ප්‍රතිපාදන ප්‍රමාණයක් වෙන් කරමින් ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව, ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය, ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතන, ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව එක්ව තවත් රාජ්‍ය ආයතන සම්බන්ධීකරණයෙන් මෙම වැඩසටහන යටතේ පහත ව්‍යාපෘති ක්‍රියාත්මක කරමින් පවතී.

1.1 කලපු ගැඹුරු කිරීම හා පිරිසිදු කිරීම.

කලපු පිරිසිදු කිරීම හා සංරක්ෂණය වැඩසටහන යටතේ කලපු ගැඹුරු කිරීම හා පිරිසිදු කිරීමට රු.මි. 65.10 ක ප්‍රතිපාදන වෙන් කර ඇති අතර 2024.12.31 දින වන විට රු.මි. 4.99 ක ප්‍රතිපාදන වැය වී ඇත. ආරුගම්බේ, නන්දිකඩාල්, නයාරු හා ලංකා පටුන යන කලපු මෙම වැඩසටහනට ඇතුලත් කර ඇති අතර, නන්දිකඩාල් කලපුව පිරිසිදු කිරීමේ කටයුතු සිදු කිරීම සඳහා ආයෝජකයෙකු ඉදිරිපත් වුණු අතර, රාජ්‍ය හා පෞද්ගලික හවුල්කාරිත්වයක් යටතේ මෙම කාර්යය සම්පූර්ණ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා අමාත්‍ය මණ්ඩල තීරණය ලැබී ඇත. එම තීරණයට අනුව මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති ඇමතිතුමාගේ සහ වනජීවී හා වන සම්පත් සංරක්ෂණ ඇමතිතුමියගේ නිරීක්ෂණ වල දක්වා ඇති කරුණු කෙරෙහි සැලකිල්ලකට යොමු කරමින් අවශ්‍ය පියවර ගන්නා ලෙස ධීවර අමාත්‍යාංශයේ ලේකම්ට නියම කරන ලදී.

ආරුගම්බේ කලපුවට අදාළ ඇස්තමේන්තු ප්‍රමාණ පත්‍ර (BOQ), ඇස්තමේන්තු හා මූලික පාරිසරික අධ්‍යාන වාර්තාව අවසන් කර ඇති අතර ප්‍රසම්පාදන කටයුතු සිදු කිරීමට නියමිතය. නයාරු කලපුව පිරිසිදු කිරීමට අදාලව නාරා ආයතනය විසින් මූලික පාරිසරික අධ්‍යයනය සිදු කර අවසන් වාර්තාව සකස් කරමින් පවතී.

1.2 කලපු නිෂ්පාදනය ඉහළ නැංවීමේ වැඩසටහන

මෙම පර්යේෂණ ව්‍යාපෘතියෙන් දේශීය මව් සතුන් භාවිතයෙන් කලපුවල ඉස්සන් ප්‍රමාණය වැඩි දියුණු කිරීම සඳහා අභිජනනාගාරවල පසු කීටයන් නිෂ්පාදනය කිරීම සිදු කරනු ලබයි. 2024 වර්ෂය තුළ රු.මි. 15 ක් වෙන් කර තිබිණි. එයින් රු.මි. 3.7 ක මූල්‍ය ප්‍රතිපාදන යොදා ගනිමින් මඩකලපුව කලපුව තුල ඉස්සන් පසු කීටයන් 1,128,916 ක් තැන්පත් කිරිමට ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතනය විසින් කටයතු කරන ලදී. එමෙන්ම, රු.මි. 11.1 ක මූල්‍ය ප්‍රතිපාදන යොදා ගනිමින් කොග්ගල කලපුව තුල මිරිදිය ඉස්සන් පසු කීටයන් මිලියන 5.05 ක් තැන්පත් කිරිමට ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය විසින් කටයුතු කරයි.

1.3 තෝරා ගන්නා ලද කලපු වල සීමා සලකුණු කිරීම

රු.මි. 3 ක ප්‍රතිපාදන යොදා ගනිමින් මෙම වසර තුළ කලපු සීමා නිර්ණය කිරීමේ කාර්යය සඳහා හලාවත, මුන්දලම, නන්දිකඩාල්, කෝකිලායි හා පුත්තලම යන කලපු තුළ කණු සිටුවීමට ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව විසින් අපේක්ෂා කරනු ලබයි.

හලාවත කලපුවේ පවතින නිෂ්පාදිත මායිම් කණු 2,164ක් පුත්තලම කලපුව වෙත ප්‍රවාහනය කිරීමේ කටයුතු අවසන් කර ඇත. මේ වන විට එම කණු ප්‍රවාහනය කිරීම සඳහා අවශ්‍ය කටයුතු ආරම්භ කර ඇත.

1.4 කළපු කළමනාකරණය

කලපු කළමණාකරණය සඳහා ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව වෙත රු.මි. 0.50 ක ප්‍රතිපාදන නිදහස් කර ඇති අතර 2024.12.31 දිනට 30% ක භෞතික ප්‍රගතියක් අත්පත් කරගෙන ඇත.

- කලපු ආශ්‍රිත කළමනාකරණ කමිටු පිහිටුවීම සහ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම:-

කලපු කළමණාකරණය හා ධීවර ප්‍රජාවගේ සහභාගීත්වයෙන් කමිටු පිහිටුවන අතර මාතර, ගරාඩුව, පුත්තලම හා හලාවත කලපුවල කලපු කළමනාකරණ කමිටු දැනුවත් කිරීමේ වැඩසටහන් නවයක් අවසන් කර ඇත.

- කලපු සංරක්ෂණය සහ කළමනාකරණය: -

2024 වර්ෂයේ දී හලාවත, ගරාඩුව සහ කොග්ගල කලපු සඳහා කලපු සංවර්ධන හා කළමනාකරණ සැලසුම් 03ක් ගැසට් කිරීමට නියමිතව ඇත. (නීති කෙටුම්පත් මේ වන විට රජයේ මුද්‍රණාලය මඟින් මුද්‍රණය සඳහා යොමු කර ඇත.)

1.5 ලැමසූරිය ඇළ මාර්ගය සංවර්ධනය

2024.08.31 දිනට ලැමසූරිය ඇළ මාර්ගය සංවර්ධනය 5% ක භෞතික ප්‍රගතියක් අත්පත් කර ගෙන ඇත.

1.6 ධීවර විශ්‍රාම වැටුප් ක්‍රමය ක්‍රියාත්මක කිරීමට අදාල පරිපාලන වියදම ගෙවීම

ධීවර විශ්‍රාම වැටුප් ක්‍රමය ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් කෘෂි රක්ෂණ අරමුදලෙහි 2024 වර්ෂයට නියමිත ගෙවීම් කිරීමට ඇති රු.මි. 1.5 ක පරිපාලන වියදම් දැරීම ද අමාත්‍යාංශය විසින් මෙම වසරෙහි තුන්වන කාර්තුව තුළ සිදු කරන ලදී.

1.7 මීගමු කලපුව සංවර්ධනය කිරීම

.ව්‍යාපෘතිය පිළිබඳ විස්තරය:

මෙම ව්‍යාපෘතිය අදියර 3ක් යටතේ ක්‍රියාත්මක වේ. එහි දී, අදියර I යටතේ ක්‍රියාත්මක පැකේජ ගණන 7 කි. ව්‍යාපෘතියේ අදියර I හි පැකේජ 7 සඳහා මුළු මුදල රු.මි. 1,000 කි.

1. පැකේජ III - රුජින මාර්ගය ප්‍රදේශයේ කලපු සංවර්ධනය

   පැකේජ III යටතේ රුජින පාර අසල කලපුව හෑරීම 2018.07.20 වන දින ආරම්භ කරන ලද අතර, මේ වන විට කලපුවේ භෞතික ප්‍රගතිය 90% ක් වේ.

   a) ප්‍රමාදවීමට හේතුන්

   ව්‍යාපෘතියේ 3 වන අදියර ක්‍රියාත්මක කිරීමේදී, කලපු රොන්මඩ ඉවත් කර ඒවා වියලෙන තෙක් ව්‍යාපෘති සීමාවෙහි තැන්පත් කර තැබීම නිසා කඩොලාන පරිසරයට හානි සිදු කිරීමක් ලෙස දක්වා වන සංරක්ෂණ ආ .ප . 20 (1) වෙනි වගන්තිය යටතේ නඩු පවරා ඇත.

   (ව්‍යාපෘතියේ 3 වන අදියර) කලපු රොන්මඩ ඉවත් කර ඒවා වියලෙන තෙක් ව්‍යාපෘති සීමාවෙහි තැන්පත් කර ඇති පස් කර මීගමුව පොලීසිය නිසි ආරක්ෂාව ලබා දුන් පසු රොන්මඩ ඉවත් කිරීම නැවත ආරම්භ කිරිමට නියමිතය.

ධීවර අමාත්‍යාංශය මඟින් ක්‍රියාත්මක කරනු ලබන අයවැය යෝජනා ව්‍යාපෘති

1. මිරිදිය ධීවර කර්මාන්තය සංවර්ධනය කිරීම

2024 අයවැය යෝජනාව යටතේ ජලාශ තුළ මත්ස්‍ය ඇඟිල්ලන්, මිරිදිය ඉස්සන් පසු කීටයන් හා ඇසිත්තන් තැන්පත් කිරීම වෙනුවෙන් රු. මි. 200 ක් වෙන් කරන ලදී. ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය මඟින් ක්‍රියාත්මක කරනු ලබන මෙම ව්‍යාපෘතිය මඟින් සෘජුවම මිරිදිය ධීවරයන් 55, 880 කට හා වක්‍රව පුද්ගලයන් 2,100 කට පමණ ප්‍රතිලාභ ලබා දෙයි. ධීවර ප්‍රජාවගේ ආදායම ඉහළ නැංවීම මඟින් ධීවර ප්‍රජාවගේ ජීවන මට්ටම වැඩි දියුණු කිරීම හා රැකියා අවස්ථා වැඩි දියුණු කිරීම මෙම ව්‍යාපෘතියේ ප්‍රධානතම අරමුණු වේ.

මෙම ව්‍යාපෘතිය යාපනය දිස්ත්‍රික්කය හැර සෙසු දිස්ත්‍රික්කවල ක්‍රියාත්මක වන අතර මෙම වැඩසටහන යටතේ 2024 වර්ෂය තුළ මත්ස්‍ය ඇඟිල්ලන් මිලියන 30 ක්, මිරිදිය ඉස්සන් පසු කීටයන් මිලියන 24.53 ක් හා මත්ස්‍ය ඇසිත්තන් මිලියන 19.68 ක් තැන්පත් කිරීමට කටයුතු කර ඇත.

2. උතුරු පලාතේ ධීවර කර්මාන්තය සංවර්ධනය කිරීම

2024 අයවැය යෝජනාව යටතේ උතුරු පළාතේ පවතින ධීවර තොටුපළවල් හා නැංගුරම්පළ සංවර්ධනය වෙනුවෙන් රු. මි. 500 ක් වෙන් කරන ලදී.

යාපනය, මන්නාරම, මුලතිව්, හා කිලිනොච්චි දිස්ත්‍රික්කවල පවතින ධීවර තොටුපළවල් 62ක් සංවර්ධනය කරනු ලබයි.

ව්‍යාපෘතියේ මුල්‍ය ප්‍රගතිය : රු.මි. 34.92 (2024.08.31 දිනට)
මුලතිව් හා මන්නාරම දිස්ත්‍රික්කවලට අදාල ප්‍රසම්පාදන කටයුතු නිම කර කොන්ත්‍රාත් ප්‍රධානය සිදු කර ඇත.
මන්නාරම දිස්ත්‍රික්කයේ ධීවර තොටුපළවල් 4ක් සංවර්ධනය කරනු ලබයි

- Dredging of Channel - Pallimunai Landing Site – 81%

ඇළ මාර්ගය පිරිසිදු කිරීම

- සවේරියපුරම් වෙරළ පාර දුර මීටර් 700 ඉදිකිරීම – 100%
- තෝමයාර්පුරම් විලාවතුරෙයි වෙරළ පාර දුර මීටර් 500 ඉදිකිරීම -100%
- කොණ්ඩච්චි කුඩා/කක්කුපුඩයියන් - වෙරළ පාර ඉදිකිරීම– 100%

<u>මුලතිව් දිස්ත්‍රික්කය</u>

මුලතිව් දිස්ත්‍රික්කයේ ධීවර තොටුපළවල් 4ක් සංවර්ධනය කරනු ලබයි

- ඉරණපාලෙයි අන්තෝනියාර් පල්ලිය පාර දුර මීටර් 500 සංවර්ධනය කිරීම– 100%
- තීතකරයි ධීවර තොටුපොළ දැල් සැකසුම් ගොඩනැගිල්ල ඉදිකිරීම– 100%
- වම්මලෙයි ගම් සභා පාර දුර මීටර් 900 සංවර්ධනය කිරීම– 100%
- නීතාල් මුල්ලිවයික්කාල් සින්නප්පාර් පල්ලිය පාර දුර මීටර් 900 සංවර්ධනය කිරීම– 100%
- උප්පමවේලි පාරේහි මීටර් 900 සංවර්ධනය කිරීම – 35%

ඉරණපාලෙයි අන්තෝනියාර් පල්ලිය පාර

තීතකරයි ධීවර තොටුපොළ දැල් සැකසුම් ගොඩනැගිල්ල

<u>කිලිනොච්චි දිස්ත්‍රික්කය</u>

කිලිනොච්චි දිස්ත්‍රික්කයේ ධීවර තොටුපළවල් 09ක් සංවර්ධනය කරනු ලබයි. එයින්,

- යාත්‍රා ප්‍රවේශ මාර්ගය පිරිසිදු කිරීම් 03 ක්ද,
  - ✓ නච්චිකුඩා.ඉරනිමාතා නගර් තොටුපොලෙහි යාත්‍රා ප්‍රවේශ මාර්ගය පිරිසිදු කිරීම - 10%
  - ✓ නාච්චිකුඩා, යග්බර් තොටුපොලෙහි යාත්‍රා ප්‍රවේශ මාර්ගය පිරිසිදු කිරීම - 10%
  - ✓ පූනකරි. වලයිමති තොටුපොලෙහි යාත්‍රා ප්‍රවේශ මාර්ගය පිරිසිදු කිරීම - 10%

පනකරි වලෛමෙති හි පවතින පුවේශ මාර්ගය පිරිසිද කිරීම

- දැල් සැකසුම් ගොඩනැගිල්ල ඉදිකිරීම් 01 ක්ද,
  - ✓ නාච්කුඩා සහ නල්ලයන් තොටුපොලෙහි දැල් සැකසුම් ගොඩනැගිල්ල ඉදිකිරීම - 38%

නාච්චිකුඩා සහ නල්ලයන් වෙන්දේසි ශාලාව ඉදිකිරීම

- මත්ස්‍ය වෙන්දේසි ශාලාව ප්‍රතිසංස්කරණය කිරීම් 01ක්ද,
  - ✓ නාච්කුඩා කුම්ලමුවානි මත්ස්‍ය වෙන්දේසි ශාලාව ප්‍රතිසංස්කරණය - 65%

නාච්කුඩා කිරන්චි වෙන්දේසි ශාලාවේ සහ දැල් අලුත්වැඩියා ශාලාවේ ප්‍රතිසංස්කරණ කටයුතු

- මත්ස්‍ය වෙන්දේසි ශාලාව හා දැල් සැකසුම් ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කිරීම් 02ක්ද,
  - ✓ නාච්කුඩා කිරංචි මත්ස්‍ය වෙන්දේසි ශාලාව හා දැල් සැකසුම් ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය - 30%

නාච්කුඩා කිරන්චි වෙන්දේසි ශාලාවේ සහ දැල් අලුත්වැඩියා ශාලාවේ ප්‍රතිසංස්කරණ කටයුතු

  - ✓ පූනකරි කවුතාරිමුනේ මත්ස්‍ය වෙන්දේසි ශාලාව හා දැල් සැකසුම් ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය - 10%

පූනකරි කවුතාරිමුනේ ඕක්ටන් ශාලාව සහ දැල් අලුත්වැඩියා කිරීමේ ශාලාව

- මාර්ග සංවර්ධනය කිරිම් 01ක්ද,

නාච්කුඩා වලයිපාඩු ශාන්ත ආනා පන්සල පාර දුර මීටර 700 මාර්ග සංවර්ධනය කිරිම - 55%

නාච්කුඩා වලෛපාඩු (මීටර් 700) ශාන්ත ආනා දේවාල මාර්ගය සංවර්ධනය කිරීම.

- බීකන් විදුලි පහන් සවි කිරීම
  - ✓ පලෙයි කිලාලි බීකන් විදුලි පහන් සවි කිරීම - 60%

<u>යාපනය දිස්ත්‍රික්කය</u>

යාපන දිස්ත්‍රික්කයේ ධීවර තොටුපොළ සංවර්ධනය අදියර I හා II යටතේ ක්‍රියාත්මක වේ. එහි ප්‍රසම්පාදන කටයුතු නිම කර කොන්ත්‍රාත්තුව පිරිනමා ඇත.

- ➢ අදියර I - ප්‍රසම්පාදන කටයුතු නිම කර කොන්ත්‍රාත්තුව පිරිනමා ඇත. එමඟින්,
  - ✓ යාත්‍රා ගමන් කරන ඇළ මාර්ග තොටුපොළ 25 ක පිරිසිදු කිරීම් සිදු කෙරේ.
  - ✓ තොටුපොළ 17ක තොටුපොළ හා මාර්ගයන්හි Solar Light සවි කිරීම සිදු වේ.
- ➢ අදියර II - ප්‍රසම්පාදන කටයුතු නිම කර කොන්ත්‍රාත්තුව පිරිනමා ඇත. එමඟින්,
  - ✓ කට්කෝවල්ම් තීර්තක්කරෙයි වෙරළ පාර බෝක්කුවක් ඉදිකිරීම - 23%
  - ✓ උදයපුරම් වෙරළ පාර මීටර 1700 ප්‍රතිසංස්කරණය කිරීම - 40%
  - ✓ ගුරුනගර් වෙන්දේසි ශාලාව වාහන නැවැත්වීමේ ස්ථානය සංවර්ධනය කිරීම - 84%

ධීවර අමාත්‍යාංශය මඟින් ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘති

1 ගන්දර ධීවර වරාය ඉදිකිරීම

i. ව්‍යාපෘතිය පිළිබඳ විස්තරය :

මෙම ව්‍යාපෘතිය මඟින් පහත දැක්වෙන අයිතමයන් ඉදිකිරීම සිදු කරයි.

- දියකඩනය ඉදිකිරීම
- වේදිකාව ඉදිකිරීම
- වෙරළ පහසුකම් (Shore facilities) ඉදිකිරීම සිදු කරයි

මත්ස්‍ය වෙන්දේසි ශාලාව, දැල් සැකසුම් මධ්‍යස්ථානය, සනීපාරක්ෂක පහසුකම්, සාප්පු ගොඩනැගිල්ල, කාර්ය මණ්ඩල නේවාසිකාගාරය, ධීවර පරීක්ෂක හා වෙරළාරක්ෂක බලකාය සඳහා කාර්යාල, නවාතැන් පහසුකම්, පොම්පාගාර, කසළ එකතු කිරීමේ ස්ථානය, කිරුම් ස්ථානය, තෙල් සැපයීම් කටයුතු සහ වතුර ටැංකි ඉදිකිරීම සිදු කරයි

ii. ව්‍යාපෘති ආරම්භය: 2020.12.07
iii. ව්‍යාපෘති අවසානය: 2026 දෙසැම්බර් (අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇත)
iv. සංශෝධිත ව්‍යාපෘති වටිනාකම : රු.මි. 11,354 (අවිනිශ්චිත වියදම් 10% හා වැට් බදු රහිතව)
v. ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රගතිය :

අවුරුද්ද	මූල්‍ය ප්‍රතිපාදන රු.මි.	වියදම රු.මි.	සටහන
2020	408	202.48	2024.12.31 දිනට මූල්‍ය ප්‍රගතිය
2021	1,710	1,595.30	
2022	1,599.44	1,145.43	
2023	2534.59	2,353.00	
2024	3,199.90	2,795.2	

vi. භෞතික ප්‍රගතිය:

අමප 24/1077/606/015 දරණ අමාත්‍ය මණ්ඩල තිරණය මගින් ගන්දර ධීවර වරායේ ගොඩබිම් කටයුතු නැවත ආරම්භ කිරිමටත්, වරායේ ඛාදනය විම සම්බන්ධයෙන් ශක්‍යතා අධ්‍යනයක් හා පාරසරික අධ්‍යනයක් සිදු කිරිමටත් අනුමැතිය ලබාදෙන ලදි. ඒ අනුව ව්‍යාපෘති වැඩසටහන නැවත සකස් කර ඇත. ඒ අනුව ප්‍රගතිය පහත දැක්වේ.
ඒ අනුව ගන්දර ධිවර වරාය ඉදිකිරීම් ව්‍යාපෘතියේ 2024.1231 දිනට අපේක්ෂිත භෞතික ප්‍රගතිය 81.86% වූ අතර එහි භෞතික ප්‍රගතිය 72.17% කි.

ව්‍යාපෘති නම සහ අයිතමයන්	අපේක්ෂිත ප්‍රගතිය (%)	ලබා ගත් ප්‍රගතිය (%)
ගන්දර ධීවර වරාය	**81.86**	**72.17**
මූලික කටයුතු	100	100
දියකඩනය ඉදිකිරිම	100	100
බේසම ගැඹුරු කිරිම	100	100
පෙර බ්ලොක් සකස් කිරිම	100	100
වේදිකාව ඉදිකිරිම	100	100
ගොඩනැගිලි ඉදිකිරීම	30	8.77
බාහිර ඉදිකිරීම් කටයුතු	44	5.57
Provisional sums	33	0.4
ඉඩම් අත්පත් කර ගැනීම හා නැවත පදිංචි කිරීම	91	88.5

අමප 24/1077/606/015 දරණ අමාත්‍ය මණ්ඩල තිරණය මගින් ගන්දර ධීවර වරායේ ගොඩබිම් කටයුතු නැවත ආරම්භ කිරිමටත්, වරායේ ඛාදනය විම සම්බන්ධයෙන් ශක්‍යතා අධ්‍යනයක් හා පාරසරික අධ්‍යනයක් සිදු කිරිමටත් අනුමැතිය ලබාදෙන ලදි. ඒ අනුව ව්‍යාපෘති වැඩසටහන නැවත සකස් කරමින් පවති.

දියකඩනය ඉදිකිරීම

වේදිකා බැම්ම ඉදිකිරීම

Travel lift bay ඉදිකිරීම

ඉන්ධන කාර්යාලය ඉදිකිරීම

වේදිකා බැම්ම ඉදිකිරීම

භූගත ජල ටැංකිය

2 මයිලිඩ්ඩ් ධීවර වරාය

මෙම ධීවර වරායෙහි දියඩනය ප්‍රතිසංස්කරණය කිරීම සිදු කිරීම, ජැටි හා යාත්‍රා ආලෝකය, ප්‍රවේශ ඇළ මාර්ගය ඇතුළු වරාය ද්‍රෝණියෙහි මඩ කැණීම, වෙරළ පහසුකම් සැපයීම සඳහා වෙන්දේසි ශාලාව, දැල් අලුත් වැඩියා කිරීමේ ශාලාව,ගබඩා කිරීමේ ටැංකියක් සහිතව ඉන්ධන පිරවුම්හළ අලුත්වැඩියා කිරීම, ප්‍රජා ශාලාව, පරිපාලන කාර්යාලය,පරිපාලන නිලධාරීන් සඳහා නිල නිවාස, පොදු පහසුකම් හා වෙරළ ආශ්‍රිත යටිතල පහසුකම් ආදී ක්ෂේත්‍ර ඔස්සේ ව්‍යාපෘතිය අදියර කිහිපයක් යටතේ සිදු කිරිමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇත. ඒ අනුව අදියර I හා II වැඩ අවසන් කර මෙහෙයුම් කටයුතු සඳහා භාර දී ඇති අතර අදියර III සඳහා ඇස්තමේන්තු සකස් කරමින් පවතී.

මෙම ව්‍යාපෘතියෙහි 2024 වර්ෂය සඳහා රුපියල් මිලියන 200ක් වෙන්කරන ලද අතර අදියර II බිල්පත් සඳහා වියදම රුපියල් මිලියන 145.55 ක් වන අතර අදියර II භෞතික ප්‍රගතිය 100% ක් වේ.

ව්‍යාපෘතිය අදියර III

අදියර III යටතේ වෙරළ පහසුකම් සැපයීම සඳහා වෙන්දේසි ශාලාව, පරිපාලන කාර්යාලය,පරිපාලන නිලධාරීන් සඳහා නිල නිවාස, පොදු පහසුකම් හා වෙරළ ආශ්‍රිත යටිතල පහසුකම් සැලසීම සිදු කරයි. මෙම ව්‍යාපෘතිය 2026 වර්ෂයෙහි අවසන් කිරීමට නියමිතව ඇත.

3 ශක්‍යතා අධ්‍යනය, සැලසුම් සකස් කිරීම හා පාරසරික බලපෑම් අධ්‍යනය කිරීම

අම්බලන්ගොඩ ධීවර වරාය වැඩි දියුණු කිරිම

- අම්බලන්ගොඩ ධීවර වරාය වැඩි දියුණු කිරිම - සැලසුම් සකස් කිරීම අවසන් කර ඇත. පාරිසරික බලපෑම් වාර්තාව (EIA) සකස් කිරීම සඳහා උපදේශන සමාගම තෝරා ගෙන ඇති අතර එම වාර්තාව සකස් කරමින් පවතී



හික්කඩුව ධීවර වරාය වැඩි දියුණු කිරිම,

- හික්කඩුව ධීවර වරාය වැඩි දියුණු කිරිම - සැලසුම් සකස් කිරීම අවසන් කර ඇත. පාරිසරික බලපෑම් වාර්තාව (EIA) සකස් කිරීම සඳහා උපදේශන සමාගම තෝරා ගෙන ඇති අතර එම වාර්තාව සකස් කරමින් පවතී



වාලච්චෙන ධිවර වරාය සංවර්ධනය කිරිම,

- වාලච්චෙන ධිවර වරාය සංවර්ධනය කිරිම - සැලසුම් සකස් කිරීම අවසන් කර ඇත. පාරිසරික බලපෑම් වාර්තාව (IEE) සඳහා අනුමැතිය ලැබී ඇත. NPD අනුමැතිය යොමු කළ යුතු ව ඇත

දොඩංදූව ධීවර වරාය වැඩි දියුණු කිරීම

- දොඩංදූව ධීවර වරාය වැඩි දියුණු කිරීම - මූලික පාරිසරික බලපෑම් වාර්තාව (EIA) සකස් කිරීම සිදු කරමින් පවතී.

4 <u>මාවැල්ල නැංගුරම්පල ඉදිකිරිම</u>

පාරිසරික අනුමැතිය සඳහා වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇති අතර පාර්ශවකරුවන් සමඟ එම ඉදිකිරීම සඳහා සාකච්ඡාවක් පැවැත්විය. වෙරළ ඛාදනය සඳහාවූ ව්‍යුහාත්මක සැලැස්මට පාර්ශවකරුවන් එකඟ නොවීය.

5 <u>රැකව නැංගුරම්පල ඉදිකිරිම</u>

- සැලසුම් කිරීම අවසන් කර ඇත. NPD අනුමැතිය යොමු කළ යුතු ව ඇත.

6 <u>ඔලුවිල් ධීවර වරාය මෝය කට විවෘත කර ධීවර වරාය ක්‍රියාකාරීත්වයට පත්කිරීම</u>

ඔලුවිල් ධීවර වරාය ආශ්‍රිතව පැන නැගී ඇති ගැටලු පිළිබඳ 2023.08.23 දින සාකච්ඡාවක් ගරු අග්‍රාමාත්‍යතමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වුණු අතර, එහිදී ද මෙම ගැටලුව සාකච්ඡාවට බඳුන්විය. ඒ සඳහා දේශපාලන අධිකාරිය මෙන්ම අග්‍රාමාත්‍ය කාර්යාලය, වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යාංශය, මෙම අමාත්‍යාංශය, ශ්‍රී ලංකා වරාය අධිකාරිය, වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව සහ ධීවර වරාය නීතිගත සංස්ථාව නියෝජනය කරමින් නිලධාරීන් සහභාගි වූහ. එහිදී තීරණය වූයේ සාගර විශ්ව විද්‍යාලය හා එකී ක්ෂේත්‍රයට අදාළ අධ්‍යයන ආයතනවලින් හඳුනා ගත් ත්‍රිපුද්ගල විද්වත් කමිටුවක් පත් කර, එම කමිටුව වෙත සියලු පාර්ශ්වයන්ට ඔබගේ අදහස්/ යෝජනා ඉදිරිපත් කිරීමට අවස්ථාව සලසා දී අදාළ සියලු කරුණු සැලකිල්ලට ගනිමින් වඩාත් ප්‍රායෝගික යෝජනාවක් සහිතව කමිටු වාර්තාව කඩිනමින් ගරු අග්‍රාමාත්‍යතුමා වෙත ඉදිරිපත් කිරීමටයි.

එකී එළඹි තීරණ අනුව ඔලුවිල් වරාය සක්‍රීය වරායක් බවට පත් කිරීමට අවශ්‍ය නිර්දේශ ලබා ගැනීම සඳහා සාගර විශ්ව විද්‍යාලය හා එකී ක්ෂේත්‍රයට අදාළ පහත සඳහන් අධ්‍යයන ආයතනවලින් නම් කරන ලද පහත සඳහන් විශේෂඥයින්ගෙන් සමන්විත කමිටුව 2023.12.01 දින පත් කර ගන්නා ලදී.

මහාචාර්ය ජේ.ජේ.විජේතුංග මහතා	ප්‍රධාන - සිවිල් ඉංජිනේරු දෙපාර්තමේන්තුව, පේරාදෙණිය විශ්ව විද්‍යාලය	සාමාජික
ඊ.පී.රොහාන් එදිරිසූරිය මහතා	ජ්‍යෙෂ්ඨ කතිකාචාර්ය, සමුද්‍ර ඉංජිනේරු දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා සාගර විශ්ව විද්‍යාලය	සාමාජික
මහාචාර්ය ටර්නි ප්‍රදීප් කුමාර මහතා	සාගර විද්‍යා සහ සමුද්‍ර භූ විද්‍යා දෙපාර්තමේන්තුව, රුහුණු විශ්ව විද්‍යාලය	සාමාජික
අස්ලාම් සුජා මහතා	ජ්‍යෙෂ්ඨ කතිකාචාර්ය, ඉංජිනේරු පීඨය, ශ්‍රී ලංකා අග්නි දිග විශ්ව විද්‍යාලය	සාමාජික
ආචාර්ය නිමල් විජයරත්න මහතා	ජ්‍යෙෂ්ඨ කතිකාචාර්ය, සිවිල් ඉංජිනේරු දෙපාර්තමේන්තුව, මොරටුව විශ්ව විද්‍යාලය	සාමාජික
හර්ෂ රත්නසූරිය මහතා	ජ්‍යෙෂ්ඨ කතිකාචාර්ය, සිවිල් ඉංජිනේරු දෙපාර්තමේන්තුව, මොරටුව විශ්ව විද්‍යාලය	සාමාජික

සාකච්ඡා කිහිපයක් පවත්වා ඊට අදාළ තොරතුරු ලේඛන එම විශේෂඥ කමිටුව වෙත යොමු කරන ලද නමුත් ඉන් පසුව මේ පිළිබඳ ඉදිරි කාර්යයන් නැවතී ඇති බව නිරීක්ෂණ විය. පසුව මේ සම්බන්ධයෙන් අමාත්‍යාංශයේ ඉංජිනේරු අංශය වෙතින් විමසන ලද අවස්ථාවේ එම අංශය විසින් යෝජනාව කරන ලද්දේ සමුද්‍රීය ඉදි කිරීම් පිළිබඳ විශේෂඥතාවක් ඇති ආයතනයක් තෝරා ගෙන ශක්‍යතා අධ්‍යයනයක් සිදු කිරීම සුදුසු බවයි. ඒ අනුව, ඉදිරි වසරේදී උක්ත යෝජනාව සඳහා අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලබාගැනීමෙන් අනතුරුව ඉදිරි කටයුතු සිදු කිරීමට නියමිතයි.

විදේශාධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු

ලෝක ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ (FAO) ආධාර යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘති යෝජනා		
ව්‍යාපෘති යෝජනාව	මුදල ඇ.ඩො.මි.	වර්තමාන ප්‍රගතිය
ශ්‍රී ලංකාවේ ග්‍රාමීය ප්‍රජාවන්හි ආහාර සහ පෝෂණ සුරක්ෂිතතාව සහ ජීවනෝපාය වැඩිදියුණු කිරීම් සහතික කිරීම සඳහා වගා පාදක මිරිදිය ධීවර කර්මාන්තය ස්වයං තිරසාර ලෙස සංවර්ධනය කිරීම	3.0	මේ යටතේ ආහාර සහ පෝෂණ සුරක්ෂිතතාව ඉහළ නංවන අතර තිරසාර බව ශක්තිමත් කරනු සඳහා මත්ස්‍ය බීජ අභිජනන ධාරිතාවය වැඩිකිරීම සඳහා මඩකලපුව, මුලතිව්, අනුරාධපුර සහ මොණරාගල දිස්ත්‍රික්කවල ප්‍රජා මූලික කුඩා පරිමාණ මත්ස්‍ය අභිජනනාගාර 4ක් ස්ථාපිත කිරීම, ජලජීවී වගා සංවර්ධන මධ්‍යස්ථාන 4ක් සහ ප්‍රජා මූලික කුඩා පරිමාණ මත්ස්‍ය අභිජනන ඒකකයක් වැඩිදියුණු කිරීම, තෝරාගත් ජලාශවල මත්ස්‍ය ඇඟිල්ලන් ගහණය වැඩිකිරීම, මව් මත්ස්‍ය ගහණය වර්ධනය කිරීම, ධීවර ප්‍රජාවන් අතර කූඩු තුල මත්ස්‍ය වගාව ප්‍රවර්ධනය කිරීම ආදී වැඩසටහන් සැලසුම් කර ඇත.
ධීවර කර්මාන්තයේ පසුඅස්වනු හානි අවම කිරීම තුළින් ආහාර සුරක්ෂිතතාව තහවුරු කිරීම	7.8	නවීකරණය කරන ලද බහුදින යාත්‍රාව සාර්ථක අත්හදා බැලීම් දෙකක් සිදු කර ඇති අතර මෙම ව්‍යාපෘතිය යටතේ නව තාක්ෂණික ක්‍රමවේදයන් සියල්ල සහිතව නිෂ්පාදනය කරන ලද ධීවර යාත්‍රාවක් නව උපාංග සමඟ ප්‍රථම ධීවර ගමන සඳහා දියත් කිරීම දික්ඕවිට ධීවර වරායේදී 2024.10.24 දින සිදු විය.
ඵලදායී ජෛව ආරක්‍ෂාව සහ ඩිජිටල් තාක්‍ෂණය තුළින් බුද්ධිමත් සහ තිරසාර ජලජීවී වගාව	1.2	2022.10.27 දින ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවෙහි (NPD)අනුමැතිය ලැබී ඇත. ජෛව ආරක්ෂාව (BS) සහ විශාල දත්ත (BD) පිලිබඳව තාක්ෂණික ක්‍රියාකාරී කණ්ඩායම් (TWG) ස්ථාපනය කිරීම මෙමඟින් සිදු කෙරිණි.
මුහුදු කුඩැල්ලන් ජලජීවී වගාව සහ ක්ෂය වූ වන සම්පත් සැකසීම, නැවත ගබඩා කිරීම සහ කළමනාකරණය සඳහා තාක්ෂණික සහාය	2.0	2022.10.20 දින ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවෙහි (NPD) අනුමැතිය ලබාගෙන ක්‍රියාත්මක තත්වයේ පවතී.

චීන රජයේ ආධාර යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘති යෝජනා		
ව්‍යාපෘති යෝජනාව	මුදල රු.මි	වර්ථමාන ප්‍රගතිය
උතුරු හා නැගෙනහිර පළාත්වල අඩු ආදායම්ලාභී ධීවර පවුල් සඳහා රු.මි. 1,804.00 ක චීන සමූහාණ්ඩු ආධාර යටතේ සහල් මෙට්‍රික් ටොන් 1630ක්,පෙර සැකසූ නිවාස 500ක් සහ මත්ස්‍ය දැල් 75,000ක් ලබා දීම.	1,804.00	අදාළ සහනාධාර උතුරු හා නැගෙනහිර පළාත්වල අඩු ආදායම්ලාභී ධීවර පවුල් වෙත බෙදා දීමට කටයුතු කර ඇත.

ජාත්‍යන්තර සංවර්ධන සඳහා වූ එක්සත් ජනපද නියෝජිතායතනයේ (USAID) ආධාර යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘති යෝජනා		
ව්‍යාපෘති යෝජනාව	මුදල ඇ.ඩො.	වර්ථමාන ප්‍රගතිය
කාලගුණ හා දේශගුණික විපර්යාසයන් මඟින් ධීවර ක්ෂේත්‍රය වෙත ඇතිකරන බලපෑම්වලට අවම කිරීම සඳහා ජාත්‍යන්තර සංවර්ධනය සඳහා වූ එක්සත් ජනපද නියෝජිතායතනය (USAID) මඟින් ප්‍රධානයක් ලෙස උම්බලකඩ වියලීමේ යන්ත්‍ර 4ක් ලබා දීම.	84,199.38	දකුණු පලාතේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ කුඩාවැල්ල ප්‍රදේශයේ උම්බලකඩ නිෂ්පාදකයන් 4 දෙනෙකු සඳහා උම්බලකඩ වියලීමේ යන්ත්‍ර ලබා දීම සඳහා ප්‍රතිලාභීන් තෝරාගැනීමේ කටයුතු සිදු කෙරෙමින් පවතින අතර ඒ පිළිබඳව 120 දෙනෙකුට පුහුණුව ලබාදීමට අපේක්ෂිත අතර කාර්මික සේවා කාර්යාංශය (Industrial service Bureau – ISB) මඟින් අදාල උපකරන සකස් කිරීම නාරා ආයතනය හා එක්ව සිදු කරමින් පවතී.

තායිලන්ත රජයේ ආධාර යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘති යෝජනා		
ව්‍යාපෘති යෝජනාව	මුදල රු.මි	වර්ථමාන ප්‍රගතිය
සාගර විසිතුරු මත්ස්‍ය අභිජනනය පිළිබඳ පුහුණුව සහ විශේෂඥ සේවය	54	ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව විසින් 13.09.2023 දින අනුමැතිය ලබාදී ක්‍රියාත්මක තත්වයේ පවතී.

ජපන් රජයේ (ජපන් ජාත්‍යන්තර සහයෝගිතා පද්ධතිය - Japan International Cooperation System -JICS) ආධාර යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘති යෝජනා		
ව්‍යාපෘති යෝජනාව	මුදල ඇ.ඩො.	වර්ථමාන ප්‍රගතිය
උතුරු හා නැගෙනහිර පලාත්වල ධීවර කර්මාන්තය සඳහා අවශ්‍ය උපකරණ ලබා දීම. (Providing supportive equipment for fisheries industry)	3,000,000	අංක NPD/AGC/PP/FIS/2023/05 යටතේ 2023.07.04 දිනැති ලිපිය මගින් ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුවේ (NPD) අනුමැතිය ලැබී ඇත. අදියර 2ක් යටතේ උපකරණ ලබා දීමට නියමිතය. පළමු අදියර යටතේ ධීවර කටයුතු ප්‍රවර්ධනය සහ ශීත කටයුතු වලට අදාළ ව පහත උපකරණ ලබාදීම සිදුකරනු ලබයි. - Ice Making Machine - Digital Platform Scale - Fishing Net, Refrigerator - Cargo Truck - Prefabricated Refrigerator/ Freezer

		දෙවන අදියර යටතේ ධීවරයින්ගේ ආරක්‍ෂාවට අදාළව පහත උපකරණ ලබාදීම සිදුකෙරේ. - Patrol Boat - Rigid Hull Inflatable Boat (RIB) - Lighted Buoy - HF Radio Transceiver (ජපාන මූල්‍ය වර්ෂය අප්රේල් සිට මාර්තු දක්වා ක්‍රියාත්මක වේ, එබැවින් එය එම මුදල් වර්ෂය සඳහා වන ව්‍යාපෘතියකි).

අමාත්‍යාංශයේ විෂය පථයට අනුකූල වෙනත් කටයුතු

දේශීය ටින් මාළු කර්මාන්තයේ සංවර්ධනය

ශ්‍රී ලංකාව කරවල, තෙත මසුන්, හාල්මැස්සන්, උම්බලකඩ, මෙන්ම ටින් මාළු යන මත්ස්‍ය හා මත්ස්‍ය ආශ්‍රිත නිෂ්පාදන ආනයනය සඳහා වාර්ෂිකව ඉතා විශාල විදේශ විනිමයක් වැය කරනු ලබයි. ඒ අනුව 2019 වසර තුලදී මෙකී ආනයනයන් සඳහා රු.මිලියන 37,500ක් පමණ වැයකර ඇති අතර ඉන් රු.මිලියන 13,600 ක පමණ ප්‍රමාණයක් එනම් මෙකී මුළු ආනයනයන්ගෙන් 36% ක පමණ විශාල මුදල් ප්‍රමාණයක් ටින් මාළු ආනයනය සඳහා පමණක් වැය කර ඇත. එබැවින් දේශීය ටින්මාළු කර්මාන්තය නංවාලීම තුළින් ටින් මාළු ආනයනය සඳහා වැය වන විශාල විදේශීය විනිමය ප්‍රමාණයක් රටතුළ ඉතිරි කර ගැනීම,දේශීය ටින් මාළු කර්මාන්තය තුළ රැකියා උත්පාදනයක්ද වැඩිකර ගැනීම මෙන්ම දේශීය ධීවරයාට තම මත්ස්‍ය නිෂ්පාදන සඳහා සාධාරණ ස්ථාවර මිළක් ලබාදිමේ හැකියාව පවතී. ඒ අනුව ටින් මාළු කර්මාන්තය නංවාලීම උදෙසා ධීවර අමාත්‍යාංශය විසින් නොයෙකුත් පියවරයන් ගෙන ඇති අතර ඒ අතුරින් විශේෂයෙන්,

- ටින් මාළු කර්මාන්තය සඳහා අමුද්‍රව්‍ය ලෙස බහුලව යොදා ගන්නා ලින්නා මසුන්ගේ මිළ දේශීය වෙළඳපල තුළ වැඩි වන අවස්ථාවන් වලදී ඒ වෙනුවට මැකරල් මසුන් ඉතා විශේෂ බදු සහන මත ආනයනය කිරීමට අවසර ලබාදීම.
- දේශීය ටින්මාළු කර්මාන්තය සඳහා අමුද්‍රව්‍ය ලෙස මසුන් ආනයනයේ දී පවතින බාධාවන් ඉවත් කර ගැනීම සඳහා මැදිහත් වී කටයුතු කිරීම.
- සියළුම ටින් මාළු කර්මාන්තශාලා ධීවර දෙපාර්තමේන්තුව යටතේ ලියාපදිංචි කර නිසි නියාමනයට ලක් කිරීමට අවශ්‍ය රෙගුලාසි සකස් කිරීම.
- ආනයනික ටින් මාළු සමඟ දේශීය ටින් මාළු සාධාරණ මිළ තරඟකාරිත්වයක් යටතේ විකුණා ගැනීමට අවශ්‍ය බදු සංශෝධනයන් කිරිමේදී අමාත්‍යාංශය මැදිහත් වීම.
- ධීවර දෙපාර්තමේන්තුව මඟින් සියළු ටින් මාළු කර්මාන්තශාලාවල තත්ත්ව පාලනය සම්බන්ධයෙන් මැදිහත් වී ඊට අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය කිරීමට කටයුතු කිරීම සඳහා උපදෙස් ලබා දීම වැනි පියවර දැකිය හැකිය.
- ටින් මාළු කර්මාන්තයේ පවතින ගැටළු සාකච්ඡා කිරීම සඳහා ඊට අදාල ආයතන හා පාර්ශවයන්ගෙන් යුතු කමිටුවක් පිහිටවිම හා එම කමිටුවේදී ගනු ලබන තීරණ ක්‍රියාත්මක කිරීම පසුවිපරම් කිරිම.

2019 වසරට පෙර ශ්‍රී ලංකා ප්‍රමිති ආයතන යටතේ ලියාපදිංචි වූ දේශීය ටින් මාළු කර්මාන්ත ශාලා ගණන 6 ක් පමණ වු අතර මෙම ටින් මාළු කර්මාන්තශාලා මගින් 2019 වසරේදී නිෂ්පාදනය කරනු ලැබූ ටින්

මාළු ප්‍රමාණය මෙ.ටො.3,100 ක් පමණ විය. එහෙත් 2024 වසර අවසානය වනවිට ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය යටතේ ලියාපදිංචි වී ඇති දේශීය ටින් මාළු කර්මාන්තශාලා ගණන 20 ක් පමණ දක්වා සීඝ්‍ර ලෙස වර්ධනයවී ඇති අතර මෙම කර්මාන්තශාලා අතුරින් මේවනවිට ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව යටතේ ලියාපදිංචි ටින් මාළු කර්මාන්තශාලා 16 ක් මඟින් පමණක් 2024 වසරේ නොවැම්බර් දක්වා කාලයතුළ මෙ.ටො.11,700 ක පමණ විශාල ටින්මාළු ප්‍රමාණයක් නිෂ්පාදනය කර ඇත. එසේම මීට අමතරව තවත් ටින් මාළු කර්මාන්තශාලා 5ක් පමණ ද මේ වන විට ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය යටතේ ලියාපදිංචි වීමට ඉල්ලා ඇති අතර එමඟින්ද ඉදිරියේදී සැලකිය යුතු ටින් මාළු නිෂ්පාදන ප්‍රමාණයක් ලබාදෙතැයි අපේක්ෂා කෙරේ.

<u>දේශීය වෙළඳපල සඳහා ටින් මාළු සැපයුම</u>

පසුගිය වසර 8ක කාලය (2017-2024 නොවැම්බර් දක්වා) තුල ප්‍රමිති සහතික ලබාගත් මෙරට ප්‍රධාන ටින්මාළු කර්මාන්තශාලා මගින් නිෂ්පාදනය කරඇති ටින් මාළු දත්ත මෙන්ම ආනයනික ටින් මාළු පිලිබඳ දත්ත සලකා බැලීමේදී



2019 වසරෙන් පසු ටින් මාළු පරිභෝජනයේ සීග්‍ර පහත වැටීමක් දක්නට ලැබෙන අතර 2020 සිට 2023 දක්වා කාලයතුල ටින් මාළු පරිභෝජනය සාමාන්‍යයෙන් වසරකට මෙ.ටො. 19,000ක් පමණ දක්වා එනම් ඊට පෙර පැවති පරිභෝජන ප්‍රමාණයෙන් භාගයක් පමණ දක්වා අඩුවී ඇත. මේ සඳහා 2019 වසරින් පසු රටතුල පැතිරගිය කොරෝනා වසංගත තත්වයත හේතුවෙන් රටෙහි ඇති වූ ආර්ථික අර්බුදයත් සමග රටෙහි ජනතාවගේ ක්‍රය ශක්තිය අඩුවීම වැනි කරුණු මේ සඳහා ප්‍රබල ලෙස බලපෑමක් එල්ලකර ඇතිබව විශ්වාසකල හැක. එසේම 2024 වර්ෂය තුළ නොවැම්බර් මාසය දක්වා මෙකී ප්‍රධාන ටින් මාළු කර්මාන්තශාලා 16 මඟින් පමණක් මෙරට ටින් මාළු සැපයුමෙන් 70% කට වැඩි ප්‍රමාණයක් සපයා ඇත.

එසේම ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව යටතේ ලියාපදිංචි දේශීය ටින් මාළු කර්මාන්තශාලා මඟින් 2024 වසරේ නොවැම්බර් මාසය දක්වා නිෂ්පාදනය කරඇති ටින් මාළු ප්‍රමාණය 2019 වසර තුල දේශීය ටින් මාළු කර්මාන්තශාල මගින් නිෂ්පාදනය කල ටින් මාළු ප්‍රමාණයට සාපේක්ෂව 300% ක පමණ වර්ධනයක් පෙන්නුම් කර ඇත. එවැවින් 2019 වසරේදී සාමාන්‍යයෙන් ටින් මාළු ආනයනය සඳහා වාර්ෂිකව රු.මි. 13,600 (ඇ.ඩො.මි.76) ක් ක පමණ මුදලක් වැයකොට ඇති අතර එය 2024 නොවැම්බර්

දක්වා වන විට රු.මි. 3,316.5 පමණ දක්වා ඉතා අඩු වී ඇත. මෙලෙස ටින් මාළු ආනයන අඩු වීම සඳහා දේශීය පරිභෝජනයේ අඩුවක් පැවතීම යම් මට්ටමකට බලපා ඇතත්, මේ සඳහා 2024 වසර වන විට දේශීය ටින් මාළු කර්මාන්තයේ සිදුව ඇති වර්ධනය ප්‍රබල ලෙස බලපා ඇත.

තවද 2020 වසරට පෙර වසර 5 ක මෙරට තුළ වැඩිම ටින්මාළු පරිභෝජනය වාර්තා වන අතර මෙම කාලය තුළ දත්ත සැලකීමේදී සාමාන්‍යයෙන් මෙරට දෛනික අවශ්‍යතාවය සඳහා 425g ටින් මාළු කෑන් 263,000ක් පමණ විය.ඒ අනුව මේ වන විට රට තුල පවතින ටින්මාළු කර්මාන්තශාලාවල ධාරිතාවයන් සැලකීමේදී මෙම අවශ්‍යතා සපුරාලීමට ප්‍රමාණවත් ධාරිතාවකට වඩා වැඩි ප්‍රමාණයක් සැපයීමේ හැකියාව මෙම කර්මාන්තශාලා සතුවේ.

එසේම මේ වන විට මෙකී ප්‍රධාන ටින් මාළු කර්මාන්තශාලා මඟින් දැනටමත් සෘජු රැකියා අවස්ථා 2,000ක් පමණ සපයා ඇති අතර මීට අමතරව හිස්කෑන් නිෂ්පාදනය, ලේබල් සැපයීම සහ අලෙවිය ඇතුළු අනෙකුත් වක්‍ර රැකියා අවස්ථාද විශාල ප්‍රමාණයක් උත්පාදනය වී ඇත. එසේම දේශීය ටින් මාළු කර්මාන්තය අපනයන කර්මාන්තයක් දක්වා වර්ධනය කිරිමේ විභවයක් මෙරට කර්මාන්තශාලා සතු පවතී. බැවින් ඊට අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය උපදෙස් මේ වන විට ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව මඟින් ලබාදීම සිදු කරනු ලබයි. එබැවින් දේශීය ටින් මාළු පාරිභෝගිකයාට දැරිය හැකි මිලකට ටින් මාළු රටතුළ නිෂ්පාදය කිරීම මෙන්ම ටින් මාළු නිෂ්පාදන ආනයනයයේදී වැය වන විදේශ විනිමය වලක්වා ඒ වෙනුවට විදේශ විනිමය ඉපයීමේ හැකියාවක් මෙම කර්මාන්තය සතුව ඇත. මීට අමතරව මෙමඟින් මෙරට ලින්නා ධීවර කර්මාන්තයේ යෙදෙන ධීවරයාට තම නිෂ්පාදන සඳහා සාධාරණ මිලක් වැඩි පුර ලබාගැනීමටද හැකියාව මෙමඟින් සැලසේ.

එක්ස්ප්‍රස් පර්ල් නෞකාව සම්බන්ධ අනතුර හේතුවෙන් ධීවර ක්ෂේත්‍රයට සිදුව ඇති හානි සඳහා වන්දි ලබාදීම.

2021.05.21 දින එක්ස්ප්‍රස් පර්ල් නෞකාව මෙරට මුහුදු සීමාව තුළදී ගිනිගෙන මුහුදුබත් වීම හේතුවෙන් නැවෙහි වූ බහාලුම් වල පැවති ප්ලාස්ටික්, තෙල්, රසායනික ද්‍රව්‍ය ආදිය මුහුදු පරිසරයට එකතු වීම හේතුවෙන් ශ්‍රී ලංකාවේ බටහිර වෙරළ තීරයේ සමුද්‍රිය පරිසර පද්ධතියට දැඩි හානි සිදු විය. මෙම පාරිසරික හානි හේතුවෙන් කළුතර සිට මීගමුව දක්වා ප්‍රදේශයේ ධීවරයින්ගේ, ධීවර ආම්පන්න සහ බෝට්ටුවල ආරක්ෂාව සහතික කිරීම සඳහා වහාම ක්‍රියාත්මක වන පරිදි ධීවර තහනම් කලාපයක් පැනවීමට රජය විසින් පියවර ගන්නා ලදී. මෙම ධීවර තහනම් කළාපය හේතුවෙන් ජීවිකාව අහිමි වූ ධීවරයින් සඳහා අදාළ නැව් සමාගමෙන් වන්දි මුදල් ලබා දීමට කටයුතු කරන ලදී.

මේ වන විට අදාළ නාවුක රක්ෂණ සමාගම විසින් අතුරු වන්දි මුදල් ලෙස රුපියල් මිලියන 2,980 ක මුදලක් ධීවර තහනම් කළාපය හේතුවෙන් ජීවිකාව අහිමි වූ ධී වරයින්ට වන්දි ගෙවීම සඳහා ලබා දී ඇත. මෙම වන්දි මුදල් සෘජු ලෙස රැකියාවේ යෙදෙන ධීවරයින් 15,032 දෙනෙකු සහ ආශ්‍රිත රැකියාවල නිරත වන පුද්ගලයින් 4,888 දෙනෙකු සඳහා ප්‍රදානය කිරීමට කටයුතු සලසා ඇත. මීට අමතරව නැවෙන් නිකුත් වූ සුන්බුන් හේතුවෙන් දැල් වලට හානි සිදු වූ ධීවරයින් සඳහා රු.6,541,925/- මුදලක් වන්දි වශයෙන් ගෙවා ඇත.

02
ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව (DFAR)

දැක්ම

ධීවර සහ ජලජ සම්පත් තිරසර භාවයෙන් යුක්තව පවත්වා ගනිමින් ධීවර ප්‍රජාවගේ සමාජ ආර්ථික තත්ත්වය ශක්තිමත් කිරීම හරහා ජාතික ආර්ථිකයට ප්‍රශස්ථ දායකත්වයක් ලබාදීම

මෙහෙවර

ධීවර කර්මාන්තයෙහි තිරසාර සංවර්ධනය හරහා ශ්‍රී ලංකා ආර්ථිකයට ඵලදායී දායකත්වයක් ලබාදීමට ජාතික හා ජාත්‍යන්තර සාගර නීති සහ සම්මුතීන්ට අනුකූලව නව තාක්ෂණික ක්‍රමවේදයන් අනුගමනය කරමින් ධීවර සහ ජලජ සම්පත් කළමණාකරණය කිරීම

අරමුණු

- දේශීය, ජාත්‍යන්තර සාගර නීති සහ සම්මුතීන්ට අනුකූලව ධීවර කටයුතු කළමණාකරණය, විධිමත් කිරීම, සංරක්ෂණය සහ තිරසාර සංවර්ධනය.
- ධීවර ක්ෂේත්‍රයේ දේශීය හා විදේශීය ආයෝජන දිරිගැන්වීම.
- දේශීය සහ ජාත්‍යන්තර මුහුදේ මත්ස්‍ය සම්පත් නෙලීම සඳහා නව තාක්ෂණය හඳුන්වා දීම.
- ධීවර ප්‍රජාවගේ සමාජ ආර්ථික තත්ත්වය නංවාලීම.
- ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව අපනයන මත්ස්‍ය නිෂ්පාදනයන්හි තත්ත්වය සහ සුරක්ෂිතභාවය සහතික කිරීම.
- පසු අස්වනු නාස්තිය අවම කිරීම සහ දේශීය මත්ස්‍ය නිෂ්පාදනවල ගුණාත්මකභාවය වැඩිදියුණු කිරිම.
- අන්තර් ජාතික ප්‍රඥප්ති සහ කලාපීය සම්මුතීන්ට අනුකූලව ධීවර මෙහෙයුම් සිදු කරන බවට සහතික වීම.
- වරාය රාජ්‍ය පියවරයන් ක්‍රියාත්මක කිරීමේ නියෝග මාලාවට අනුව වරාය සේවා ක්‍රියාත්මක කිරීම.
- මහමුහුදේ ධීවර කටයුතු වල යෙදෙන යාත්‍රාවල මෙහෙයුම් අධීක්ෂණය හා ආරක්ෂාව තහවුරු කිරීම.
- තොරතුරු තාක්ෂණය භාවිතයෙන් මාර්ගගත ක්‍රමයට ධීවර ජනතාවට හා අනෙකුත් සේවාදායකයින් හට ප්‍රශස්ත සේවාවක් ලබාදීම.
- තොරතුරු තාක්ෂණය භාවිතයෙන් මාර්ගගත ක්‍රමයට ධීවර ක්ෂේත්‍රයට අදාළ දත්ත තොරතුරු කඩිනමින් හා නිරවුල්ව ලබා ගත හැකි වීම.

ප්‍රධාන කාර්යයන්

- ධීවර මෙහෙයුම් නියෝග සකස් කිරීම, පැනවීම, යාවත්කාලීන කිරීම සහ ක්‍රියාත්මක කිරීම.
- ධීවර කළමනාකරණ නියෝග සකස් කිරීම, පැනවීම, යාවත්කාලීන කිරීම සහ ක්‍රියාත්මක කිරීම.
- ජලජීවී වගා කළමනාකරණ නියෝග සකස් කිරීම, පැනවීම, යාවත්කාලීන කිරීම සහ ක්‍රියාත්මක කිරීම.
- ධීවර යාත්‍රා ලියාපදිංචි කිරීම, උකස් කිරීම හා ධීවර මෙහෙයුම් බලපත්‍ර නිකුත් කිරීම.
- සජීවී මසුන් අපනයනය සඳහා බලපත්‍ර නිකුත් කිරීම.
- විදේශීය ධීවර යාත්‍රා සඳහා මසුන් ගොඩබෑම පිණිස බලපත්‍ර නිකුත් කිරීම.
- ධීවර කළමනාකරණය පිළිබඳ ධීවර ජනතාවගේ දැනුවත්භාවය වැඩිදියුණු කිරීම.
- ප්‍රාග්ධන භාණ්ඩ ලබාගැනීම සඳහා ආයතනික ණය පහසුකම් සම්බන්ධීකරණය
- ධීවර යාත්‍රා නිෂ්පාදන ආයතන ලියාපදිංචි කිරීම නියාමනය හා අධීක්ෂණය කිරීම.
- ධීවර යෙදවුම් සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම නියාමනය සහ අධීක්ෂණය කිරීම.
- ධීවර සමුපකාර සමිති කාර්යක්ෂම මට්ටමට ගෙන ඒම සඳහා මාර්ගෝපදේශකත්වය සැපයීම.
- ජාතික ධීවර සම්මේලනය යටතේ පිහිටුවා ඇති ග්‍රාමීය ධීවර සංවිධාන සම්බන්ධීකරණය හා අධීක්ෂණය.
- ධීවර කර්මාන්තයට අදාළ දත්ත රැස් කිරීම.
- විදේශ රටවල් විසින් අත්අඩංගුවට ගැනෙන ධීවර කාර්මිකයින් හා යාත්‍රා ආපසු ලංකාවට ගෙන්වා ගැනීම.
- මුහුදේ අතරමං වන ධීවර කාර්මිකයින් හා යාත්‍රා ආපසු ලංකාවට ගෙන්වා ගැනීම.
- අපනයන කරනු ලබන මසුන් තත්ත්ව පරීක්ෂණයට භාජනය කිරීම.
- මසුන් සකස් කිරීමේ ස්ථාන ලියාපදිංචි කිරීම සහ මත්ස්‍ය අපනයනය සඳහා ස්වස්ථතා සහතික නිකුත් කිරීම.
- දේශීය පරිභෝජනය සඳහා මසුන් වෙළඳාම් කරන ස්ථානවල තත්ත්වය උසස් කිරීම.
- මහ මුහුදේ ධීවර කර්මාන්තයට එක් වූ බහුදින යාත්‍රා සඳහා යාත්‍රා නිරීක්ෂණ උපකරණ සවිකිරීම හා අධීක්ෂණය.
- ධීවර යාත්‍රා හා ගොඩබිම අතර ගුවන් විදුලි පණිවිඩ සන්නිවේදන පහසුකම් ලබාදීම.
- දේශසීමාවන් උල්ලංඝනය කරමින් ගමන් කරන ධීවර යාත්‍රා පිළිබඳ වාර්තා ලබාගැනීම හා නියාමනය.
- දිනපතා කාලගුණ වාර්තා හා අයහපත් කාලගුණික පූර්ව තොරතුරු දෛනිකව ලබා දීම.
- යාත්‍රා නිරීක්ෂණ පද්ධතිය මගින් ලබාදෙන තොරතුරු අනුව යාත්‍රා දැනුවත් කිරීම.
- අනවසර විදේශීය ධීවර යාත්‍රා හා කාර්මිකයින් පිළිබඳ අදාළ ආයතන දැනුවත් කිරීම.
- ධීවර යාත්‍රාවල සන්නිවේදන කටයුතු සඳහා බලපත්‍ර හා ඇමතුම් සංඥා ලබාදීමට කටයුතු කිරීම.
- ධීවර කාර්මිකයින් හා යාත්‍රාවන් සම්බන්ධ අනතුරුවලදී රක්ෂණය සඳහා තොරතුරු සනාථ කරදීම.
- අන්තර්ජාතික මුහුදු සීමාවන්හි පාවීයමින් තිබෙන යාත්‍රා බේරා ගැනීමට කටයුතු කිරීම.
- ධීවර පවුල්වල සාමාජිකයන්ගේ වෘත්තීය අධ්‍යාපනය සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම.
- ධීවර කාර්මික රක්ෂණය හා විශ්‍රාම වැටුප් ක්‍රමවේද ක්‍රියාත්මක කිරීම මගින් ධීවර සමාජ ආරක්ෂණය.
- කලපු සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා ධීවර ගම්මානවල යටිතල පහසුකම් සංවර්ධනය
- ධීවර කාන්තාවන් සඳහා විකල්ප ආදායම් උත්පාදන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.

2024 සංවර්ධන වැඩසටහන්වල ප්‍රගතිය

ශ්‍රී ලංකාවේ ජාතික ආර්ථිකයට වැඩි දායකත්වයක් ලබා දීම සඳහා කාර්යක්ෂම සහ පරිසර හිතකාමී නව තාක්ෂණික ක්‍රමවේදයන් භාවිතයෙන් ධීවර කර්මාන්තය සංවර්ධනය කිරීම, විධිමත් කිරීම මගින් මත්ස්‍ය නිෂ්පාදනය වැඩි කිරීම හා ධිවර ප්‍රජාවගේ සමාජීය, ආර්ථික හා සමාජ සුබසාධක තත්වය ඉහළ නැංවීමට අවශ්‍ය පියවර ගැනීම ධීවර සංවර්ධන අංශයේ ප්‍රමුඛතම වගකීම වේ.

2.1 ධීවර සංවර්ධන අංශයේ මූලික කාර්යභාරය

- ධීවර යාත්‍රා නිෂ්පාදන ආයතන ලියාපදිංචි කිරීම නියාමනය හා අධීක්ෂණය කිරීම
- ධීවර යාත්‍රා සැලසුම් සඳහා අනුමැතිය ලබා දීම
- ධීවර යෙදවුම් සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම නියාමනය සහ අධීක්ෂණය කිරීම
- ධීවර ක්ෂේත්‍රය සඳහා නව තාක්ෂණික ක්‍රමවේද හඳුන්වා දීම හා ප්‍රවර්ධනය කිරීම
- වෙරළාශ්‍රිත ඉදි කිරීම් ව්‍යාපෘතිවලට අදාලව පාරිසරික ඇගයීම් වාර්තා සඳහා ධීවර කර්මාන්තයන්ට බාධාවක් නොවන පරිදි නිර්දේශ ලබාදීම.
- ධීවර ක්ෂේත්‍රයට අදාල යටිතල පහසුකම් සංවර්ධනය.
- විකල්ප ආදායම් උත්පාදන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.
- ධීවර සහනාධාර වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- ධීවර ණය යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම.
- ධීවර කාර්මික රක්ෂණය ක්‍රියාත්මක කිරීම.
- ධීවර විශ්‍රාම වැටුප් ක්‍රමවේද ක්‍රියාත්මක කිරීම මගින් ධීවර සමාජ ආරක්ෂණය තහවුරු කිරීම.
- ධීවර වන්දි ලබා දීම පිළිබඳ කටයුතු කිරීම.
- දියවර කැකුළු ළමා ඉතුරුම් වැඩසටහන ක්‍රියාත්මක කිරීම.
- කලපු පරිසර පද්ධතිය සංවර්ධනය හා සංරක්ෂණය විධිමත් කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම.
- කලපු සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කර ක්‍රියාත්මක කිරීම.
- සියලුම දිස්ත්‍රික් කාර්යාල සම්බන්ධීකරණය කරමින් ප්‍රගති සමාලෝචනය කිරීම.
- විශේෂ ධීවර ගැටළු නිරාකරණය කිරීම.

2.2 ධීවර කාර්මිකයින්ගේ සුරක්ෂිතතාවය තහවුරුකිරිම

වගුව 01: ධීවර කාර්මිකයින්ගේ සුරක්ෂිතතාවය තහවුරු කිරිම සම්බන්ධ කාර්යයන්වල ප්‍රගතිය

කාර්යය	2024.12.31දක්වා ප්‍රගතිය
රක්ෂණය කරන ලද සමස්ථ ධිවර යාත්‍රා සංඛ්‍යාව	27,986
රක්ෂණය කරන ලද සමස්ථ ධිවර කාර්මිකයින් සංඛ්‍යාව	23,756
ධිවර විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට දායක වූ සංඛ්‍යාව	69,095
මුහුදු යෝග්‍යතා සහතික නිකුත් කිරීම්	28,421
ධිවර යාත්‍රාංගන ලියාපදිංචි කිරීම්	55
ධිවර ආම්පන්න සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම්	19
ධිවර උපකරණ සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම්	07

2.2.1 ධීවර රැකුම නව රක්ෂණාවරණය හඳුන්වාදීම

ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ නිර්ණායකයන්ට අනුව ධීවර වෘත්තිය වඩාත් අභියෝගාත්මක, අනතුරුදායක හා අවදානම් සහගත රැකියාවක් ලෙස නම් කර ඇත. මෙරට ධීවර කර්මාන්තය සැලකීමේදී කරදිය ධීවර අංශයේ අවදානම මිරිදිය ධීවර අංශයට වඩා ඉහළ අගයක් ගනී. ධීවර අමාත්‍යාංශයේ සංඛ්‍යාලේඛන වලට අනුව මෙරට ධීවරයින් සංඛ්‍යාව 318,470ක් වන අතර මින් 223,720ක් කරදිය ධීවර අංශයේ රැකියාවේ නියුක්ත වී සිටින අතරඉන් 85%ක් පමණ වෙරළාසන්න ධීවරයින් වන අතර 34,550ක් බහු දින ධීවර යාත්‍රා වලින් අක්වෙරළ හා ගැඹුරු මුහුදේ ධීවර කර්මාන්තයෙහි නිරතවේ. මෙරට ධීවර පවුල් සංඛ්‍යාව 273,240ක් වන අතර ඍජු ධීවර කර්මාන්තයෙන් යැපෙන්නන් සංඛ්‍යාව 1,123,000ක් පමණ වේ .එමෙන්ම මෙම අංශයට සම්බන්ධ වක්‍ර රැකියාවෙ නිරත වන හා ආශ්‍රිත වෙනත් යැපීම් සලසා ගන්නා පිරිස මිලියන 2.7ක් පමණ වන බවට ඇස්තමේන්තු කර ඇත. ඒ අනුව, ශ්‍රී ලංකාවේ සමස්ථ ජන ගහනයෙන් 18% ක් පමණ ප්‍රමාණයක් සිය ජීවනෝපාය සලසා ගන්නේ ධීවර කර්මාන්තය ආශ්‍රිතවය.

ශ්‍රී ලංකාවේ සමස්ත ක්‍රියාකාරී ධීවර කාර්මිකයින් ප්‍රමාණය 318,470කි. මේ අතුරින් මෙතෙක් ක්‍රියාත්මකව පැවති රක්ෂණ යෝජනා ක්‍රමයට දායකවූ පිරිස, ක්‍රියාකාරී ධීවර කාර්මික සංඛ්‍යාවන් ආසන්නව ගත් කළ 1.73% ක ප්‍රමාණයකි. පැවති රක්ෂණ යෝජනා ක්‍රමයේ අඩුපාඩු හා ගැටලු හඳුනාගෙන ධීවර කාර්මිකයින් සඳහා වඩාත් ඵලදායි හා සහනදායී වාරික මුදලකින් යුත් නව රක්ෂණ යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කිරීමේ අත්‍යවශ්‍යතාව පැනනැගී ඇති බැවින් ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව හා ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව එක්ව "ධීවර රැකුම" පුද්ගල හදිසි අනතුරු රක්ෂණය හඳුන්වා දී ඇත.

ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව මඟින් ක්‍රියාත්මක කරනු ලබන "ධීවර රැකුම" පුද්ගල හදිසි අනතුරු රක්ෂණය යටතේ ධීවර කාර්මික මහතාගේ අභාවයකදී ඔහු වෙනුවෙන් ලැබෙන වන්දි මුදල යැපෙන්නන් වෙත ලබා දෙන අතර මුළු මුදලින් අඩක් බිරිඳටත් අනෙක් කොටස පවුලේ බාලවයස්කාර දරුවන් අතර බෙදී යා යුතුය. රක්ෂණ සංස්ථාව මඟින් විකල්ප ක්‍රම 03ක් හඳුන්වා දී ඇත.

වගුව 02: ධීවර රැකුම රක්ෂණාවරණයේ ආවරණ විස්තර

ආවරණ විස්තර	රක්ෂිත මුදල (රු)		
01. පුද්ගල හදිසි අනතුරු රක්ෂණය	විකල්ප 01	විකල්ප 02	විකල්ප 03
හදිසි අනතුරු රක්ෂණය	1,200,000	1,500,000	2,000,000
සදාකාලික පූර්ණ අකර්මන්‍යතාවය	1,200,000	1,500,000	2,000,000
සදාකාලික අර්ධ අකර්මන්‍යතාවය	600,000	750,000	1,000,000
02. අතුරුදහන්වීම සඳහා			
ධීවර කටයුතු වල නිරත වී සිටියදී සිදුවන හදිසි අනතුරක් හේතුවෙන් ධීවර මහතාගේ අතුරුදහන් වීමකදී ප්‍රතිලාභ ගෙවීම අතුරුදහන් වී මාස 05ක් ගත වූ පසු ආරම්භ කරනු ලබයි.	මසකට 7,500 බැගින් මාස 12ක් දක්වා	මසකට 7,500 බැගින් මාස 12ක් දක්වා	මසකට 7,500 බැගින් මාස 12ක් දක්වා
වසරකට වැඩි කාලයක් අතුරුදහන් වී ගත වුවහොත් රක්ෂිත මුදලින් ඉහත ගෙවනු ලැබූ වන්දි මුදල අඩුකල පසු ඉතිරිය ගෙවනු ලබයි.	1,200,000	1,500,000	2,000,000
03. රෝහල් ගතවීමේ දීමනාව හදිසි අනතුරු හෝ අසනීප සඳහා රෝහල් ගතවීම් වලදී එක් ධීවර පවුලකට වර්ෂයකට උපරිම දින 14ක් සඳහා හිමිකම් ගෙවනු ලබයි. ධීවරයා හා කලත්‍රයා .අවු -18 සිට 65 දක්වා අවිවාහක, රැකියා විරහිත ළමුන් අවු.-21දක්වා	දිනකට රු.500=/ (උපරිම දින 14)	දිනකට රු.500=/ (උපරිම දින 14)	දිනකට රු.500=/ (උපරිම දින 14)

04. අධ්‍යාපන වියදම් දීමනාව පාසල් යන දරුවන්ගේ අධ්‍යාපන වියදම් සඳහා උපරිම දරුවන් දෙදෙනෙකු සඳහා මසකට රු.1,000 බැගින් වර්ෂයක් සඳහා ගෙවනු ලැබේ.	1,000	1,000	1,000
05. අවමංගල්‍යාධාර ප්‍රතිලාභය (ස්වභාවික මරණ හේතුවෙන් පමණක් ගෙවනු ලබයි.)	200,000	200,000	200,000
06. ගුවන් ටිකට් පත් ආවරණය ධීවර මෙහෙයුම් හේතුවෙන් වෙනත් රටකට ගසාගෙන යෑම / අත්අඩංගුවට පත්විමකදී	40,000	40,000	40,000

2.2.2 ස්වාභාවික විපත් සඳහා වන්දි ලබා දීම

මෙම වැඩසටහන ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව සහ මුදල් අමාත්‍යංශය ඒකාබද්ධව රජයේ ඍජු ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක කරනු ලබයි. මේ සඳහා ප්‍රතිලාභියාගෙන් අයකිරිමක් සිදුනොකරයි. මේ යටතේ ධිවර කටයුතුවල යෙදි සිටියදි සිදුවන ස්වාභාවික ආපදාවන් හේතුවෙන් මියයන ධීවර කාර්මිකයෙකු සඳහා ඔහුගේ යැපෙන්නන්ට රුපියල් මිලියනයක වන්දි මුදලක් ලබාදෙනු ලබයි. 2024 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා ප්‍රතිලාභී පවුල් 5ක් සඳහා වන්දි ලබාදි ඇත. තවද ජිවිතක්ෂයට පත්වූ ඩෙවොන් 05 ධිවර යාත්‍රාවේ ධිවර කාර්මිකයින් හතර දෙනාගේ පවුල් සඳහා සහන දීමනාවක් ලෙස රු 2,000,000.00ක් ලබාදීමට කටයුතු කර ඇත. මෙහිදී එම මරණය සිදු වීම ස්වභාවික ආපදා තත්ත්වයක් යටතේ සිදුවූ බව තහවුරු කල යුතුය. ඒ සඳහා ආපදා සිද්ධි වාර්තාවක් ලබා දීම අනිවාර්ය වේ.

2.2.3 දියවර දිරිය ණය යෝජනා ක්‍රමය

නව තාක්ෂණය හඳුන්වා දීම තුලින් ධීවර කර්මාන්තය සංවර්ධනය කිරීමත් ගුණාත්මක තත්වයෙන් යුතු වැඩි මත්ස්‍ය නිෂ්පාදනයක් ලබා ගැනිමත් අරමුණු කර ගනිමින්, ධීවර යාත්‍රා වැඩිදියුණු කිරිම සහ ධීවර ප්‍රජාව සඳහා සහන සැලසීම සඳහා ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව ලංකා බැංකුව සමග එක්ව දියවර දිරිය අඩු පොලි ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කර ඇත.

මේ යටතේ එක් ප්‍රතිලාභියෙකු සඳහා රුපියල් මිලියන 15ක උපරිමයකට යටත්ව ණය ලබාදෙන අතර පොළී අනුපාත පහත පරිදි වේ.

- ණය මුදල රුපියල් මිලියන 2ට අඩු නම් ණය ලාභියාගෙන් අය කරන පොලි අනුපාතය 5%.
- ණය මුදල රුපියල් මිලියන 2ට වැඩි නම් ණය ලාභියාගෙන් අය කරන පොලි අනුපාතය 7%.
- එක් ප්‍රතිලාභියෙකු සඳහා රජය මගින් 4%ක පොලි සහනාධාරයක් මෙම ණය යෝජනා ක්‍රමය යටතේ ලබා දේ.
- ධීවර යාත්‍රාංගන වැඩි දියුණු කිරිම, අඩි 55ට වැඩි ධීවර යාත්‍රා නිෂ්පාදනය, නව තාක්ෂණය වැඩි දියුණු කිරීම් (RSW, CSW), මරුවැල් පන්න හා වින්ච් සවි කිරීම් සඳහා ණය ලබා දිමේදි ප්‍රමුඛතාව ලබා දේ.
- දියවර දිරිය අදියර එක (1) යටතේ ප්‍රතිලාභීන් 755දෙනෙකු සඳහා රුපියල් බිලියන1ක ණය මුදලක් ලබා දී ඇති අතර දියවර දිරිය අදියර දෙක (11) යටතේ ප්‍රතිලාභීන් 1,017දෙනෙකු සඳහා රුපියල් බිලියන1.8ක ණය මුදලක් ලබා දී ඇත.

මේ වන විටත් ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව මගින් මෙහි 4% ක පොලි වාරික මුදල් ලංකා බැංකුව වෙත යොමු කරන අතර එය 2031 වන තෙක් ගෙවීම් සිදු කිරීමට ඇත.

2.2.4 දියවර කැකුළු ළමා ඉතුරුම් ගිණුම

ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ නිර්ණායකයන්ට අනුව ධීවර වෘත්තිය වඩාත් අභියෝගාත්මක, අනතුරුදායක හා අවදානම් සහගත රැකියාවක් ලෙස නම් කර ඇත. අතිබහුතරයක් ධීවර කාර්මිකයින්ගේ පවුල් වල ආර්ථිකය සම්පූර්ණයෙන්ම එම පවුලේ ප්‍රධානියා වන ධීවරයා උපයන ආදායම මත රඳාපවතී . එම ධීවර පවුල් වල පෝෂණය , අධ්‍යාපනය ,සෞඛ්‍ය ආරක්ෂිතභාවය ද සම්පූර්ණයෙන්ම රඳා පවතින්නේ ද ධීවරයාගේ තනි ආදායම මතය. ධීවර කාර්මිකයාට සිදුවන අනතුරු නිසා එම පවුලේ ආර්ථිකය සම්පූර්ණයෙන් කඩා වැටීමක් සිදුවන අතර මෙහිදී ප්‍රධාන වශයෙන් ධීවර පවුල්වල දරුවන්ගේ අධ්‍යාපනය බිඳවැටීම බහුලව පෙන්නුම් කරයි. ඒ අනුව ධීවර පවුල් වල සමාජ ආරක්ෂණය තහවුරු කිරීමටත්, ධීවර කර්මාන්තයට තරුණ තරුණියන් ආකර්ෂණය කර ගැනීමටත්, ධීවරයින් තම පවුලේ අනාගතය වෙනුවෙන් ආයෝජන/ඉතිරිකිරීම් පුරුද්දක් ඇති කිරීම හා අරපිරිමැස්ම ප්‍රවර්ධනය කිරීම සඳහා අප දෙපාර්තමේන්තුවේ අවධානය යොමු වී ඇත.

ඒ අනුව ළමුන් සඳහා වඩාත් පුළුල් ආවරණයක් ලබාදීම සඳහා ධිවර අමාත්‍යාංශයේ ඉල්ලීම මත ලංකා බැංකුව විසින් ධීවර ළමුන් සඳහාම විශේෂිත වූ 'දියවර කැකුළු' ළමා ඉතුරුම් ගිණුමක් ආරම්භ කිරීමට අවශ්‍ය පියවර ගෙන ඇත.



රූපය 01: දියවර කැකුළු ළමා ඉතුරුම් ගිණුම

2.3 2024 වර්ෂයේ ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තු සංවර්ධන අංශය මගින් ක්‍රියාත්මක කරනු ලබන විවිධ වැඩසටහන් සහ එහි ප්‍රගතිය

ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව සඳහා ධීවර කර්මාන්තය නගාසිටුවීම වෙනුවෙන් ධීවර ජනතාවට ඉන්ධන සහනාධාරය ලබාදීම පිණිස රුපි.800 ක පුනරාවර්තන ප්‍රතිපාදන වෙන්කර ඇති අතර, ඉන් රු.මි.91,270,456.67 ක මුදලක් දෙසැම්බර් මස අවසන් වන විට ධීවර ජනතාව වෙත ලබාදී ඇත.

2.3.1 ඉන්ධන වශයෙන් භූමිතෙල් භාවිතා කරන ධීවර යාත්‍රා වන පිටත එන්ජිම සහිත කුඩා යාත්‍රා (OFRP) හා පාරම්පරික යාන්ත්‍රික යාත්‍රා (MTRB) සඳහා චීන සමූහාණ්ඩු ආධාර යටතේ භූමිතෙල් ලබාදීමේ වැඩසටහන 2023-2024 [OFRP (Out board fiber Reinforced Plastic Boat), MTRB (Mechanized Traditional Reinforced Boat)]

චීන සමූහාණ්ඩුව මගින් ශ්‍රී ලංකාවේ ධීවර ප්‍රජාවේ ප්‍රයෝජනය සඳහා ආධාර වශයෙන් පිරිනැමුණු ඉන්ධන එම යාත්‍රා හිමියන් සඳහා නොමිලේ ලබාදීමේ වැඩසටහන 2023.05.23 දින පානදුර ධීවර වරායේදී ධීවර අමාත්‍ය ගරු ඩග්ලස් දේවානන්ද මැතිතුමා, ධීවර රාජ්‍ය අමාත්‍ය ගරු පියල් නිශාන්ත ද සිල්වා මැතිතුමා සහ මහජන චීන සමූහාණ්ඩුවේ ශ්‍රී ලංකා තානාපති ගරු කී ෂෙන්හොංග් (Qi Xhenhong) මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් ආරම්භ විය.

චීන සමූහාණ්ඩුව මගින් ශ්‍රී ලංකාවේ ධීවර ප්‍රජාවගේ පරිභෝජනය සඳහා ආධාර වශයෙන් පිරිනැමුණු ඩීසල් ලීටර් මිලියන 3.79 වෙනුවට සී/ස ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් කුඩා පරිමාණ ධීවරයින්ගේ පරිභෝජනය සඳහා භූමිතෙල් ලබාදීමට තීරණය කරන ලද අතර එවකට පැවති මිල අනුව භූමිතෙල් ලීටර මිලියන 4.32ක් නිදහස් කිරීමට හැකියාව පවතින බව නිරීක්ෂණය විය. මෙම ඉන්ධන නිකුත් කිරීම අදියර දෙකක් යටතේ සිදුකරනු ලැබීය. ඒ අනුව පළමු අදියරේදී භූමිතෙල් ලීටර 75ක් හා දෙවන අදියරේදී භූමිතෙල් ලීටර 78ක් බැගින් අදියර දෙකම අවසානයේදී එක් ධීවර යාත්‍රාවක් සඳහා භූමිතෙල් ලීටර 153ක් බැගින් ලබාදීමට තීරණය විය

එමගින් ඉන්ධන වශයෙන් භූමිතෙල් භාවිතා කරන ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි, දිවයින පුරා සක්‍රිය ධීවර කර්මාන්තයේ යෙදෙන OFRP හා MTRB යාත්‍රා සඳහා එම සහනය ලබාදිමට අපේක්ෂා කරන ලදි. ඒ අනුව කොළඹ, කළුතර, ගාල්ල, මාතර, තංගල්ල, කල්මුණේ, මඩකලපුව, ත්‍රිකුණාමලය, කිලිනොච්චි, යාපනය, මුලතිව්, මන්නාරම, පුත්තලම, හලාවත හා මීගමුව යන ධීවර දිස්ත්‍රික්ක 15හි මේ වන විට සක්‍රිය ධීවර යාත්‍රා ලෙස හඳුනාගත් යාත්‍රා 25,564ක් සඳහා පළමු අදියර යටතේද, යාත්‍රා 28,806 ක් සඳහා දෙවන අදියර යටතේද එම සහනය ලබා දීමට අනුමැතිය ලබාදී ඇත.

ඒ අනුව පළමු අදියර යටතේ ඉන්ධන නිකුත් කිරීම ඉන්ධන පිරවුම්හල් 96ක් මඟින් සිදුකරනු ලැබූ අතර එක් යාත්‍රාවකට ලීටර් 75 බැගින් OFRP හා MTRB යාත්‍රා 24,340 ක් සඳහා භූමිතෙල් ලීටර් 1,825,500 ක් නිකුත් කිරීම සිදු කරන ලදී.

දෙවන අදියර යටතේ ඉන්ධන නිකුත් කිරීම ඉන්ධන පිරවුම්හල් 97ක් මඟින් සිදුකරනු ලැබූ අතර එක් යාත්‍රාවකට ලීටර 78 බැගින් OFRP හා MTRB යාත්‍රා 24,024 ක් සඳහා භූමිතෙල් ලීටර 1,873,872ක් නිකුත් කරන ලද අතර පළමු අදියරයේදී ඉන්ධන නිකුත් නොකරන ලද යාත්‍රා සඳහා එක් යාත්‍රාවකට ලීටර 153 බැගින් OFRP හා MTRB යාත්‍රා 4,084 ක් සඳහා භූමිතෙල් ලීටර 624,852ක් නිකුත් කිරීම සිදු කරන ලදී. ඒ අනුව යාත්‍රා 28,108 ක් සඳහා භූමිතෙල් ලිටර 2,498,724ක් දෙවන අදියර යටතේ 2024.03.05 දින වනවිට බෙදාහැරීම සිදුකර ඇත.

රූපය 02: චීන සමූහාණ්ඩුව මගින් ශ්‍රී ලංකාවට ආධාර වශයෙන් පිරිනැමුණු ඉන්ධන නොමිලේ ලබාදීමේ වැඩසටහන

වගුව 03: පළමු හා දෙවන අදියරයන් යටතේ භූමිතෙල් බෙදාහැරීම

දිස්ත්‍රික්කය	පළමු අදියර		දෙවන අදියර								
	භූමි තෙල් ලබා දීමට අනුමත වූ යාත්‍රා සංඛ්‍යාව	2023.07.28 දින වන විට භූමි තෙල් ලද මුළු යාත්‍රා සංඛ්‍යාව	භූමි තෙල් ලබා දීමට අනුමත වූ යාත්‍රා සංඛ්‍යාව			2024.03.05 දින වන විට භූමි තෙල් ලද මුළු යාත්‍රා සංඛ්‍යාව					
			78 (L)	153 (L)	මුළු යාත්‍රා සංඛ්‍යාව (අනුමත)	දෙවන අදියර පමණක් (යාත්‍රා)	නිකුත් කළ භූමි තෙල් (78L)	පළමු හා දෙවන අදියර (යාත්‍රා)	නිකුත් කළ භූමි තෙල් (153L)	මුළු යාත්‍රා සංඛ්‍යාව (නිකුත් කළ)	නිකුත් කළ භූමි තෙල් ලීටර් (මුළු)
මඩකලපුව	1796	1725	1727	124	1851	1711	133458	111	16983	1822	150441
කොළඹ	364	291	291	114	405	287	22386	112	17136	399	39522
හලාවත	1669	1430	1428	449	1877	1391	108498	395	60435	1786	168933
ගාල්ල	702	691	691	110	801	678	52884	105	16065	783	68949
යාපනය	5478	5282	5283	642	5925	5271	411138	618	94554	5889	505692
කිලිනොච්චිය	1045	1021	1020	140	1160	1018	79404	139	21267	1157	100671
කළුතර	418	412	412	41	453	411	32058	39	5967	450	38025
කල්මුනේ	1000	973	973	155	1128	968	75504	146	22338	1114	97842
මන්නාරම	2431	2309	2310	714	3024	2254	175812	634	97002	2888	272814
මාතර	1015	982	982	76	1058	963	75114	70	10710	1033	85824
තංගල්ල	966	946	946	101	1047	939	73242	99	15147	1038	88389
ත්‍රිකුණාමලය	3545	3537	3542	380	3922	3535	275730	376	57528	3911	333258
පුත්තලම	2617	2502	2496	599	3095	2394	186732	456	69768	2850	256500
මීගමුව	1405	1207	1208	357	1565	1181	92118	334	51102	1515	143220
මුලතිව්	1113	1032	1032	461	1493	1023	79794	450	68850	1473	148644
එකතුව	**25564**	**24340**	**24341**	**4463**	**28804**	**24024**	1873872	**4084**	624852	**28108**	2498724

2.4 ධීවර කර්මාන්තයේ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම - (කොළඹ වරාය පුළුල් කිරීමේ ව්‍යාපෘතියේ බටහිර පර්යන්තය සංවර්ධනය සඳහා වැලි ලබා ගැනීම හේතුවෙන් ධීවර කාර්මිකයන්ට සිදුවූ බලපෑම අවම කිරීම)

2.4 ධීවර කර්මාන්තයේ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම - (කොළඹ වරාය පුළුල් කිරීමේ ව්‍යාපෘතියේ බටහිර පර්යන්තය සංවර්ධනය සඳහා වැලි ලබා ගැනීම හේතුවෙන් ධීවර කාර්මිකයන්ට සිදුවූ බලපෑම අවම කිරීම)

කොළඹ වරාය බටහිර පර්යන්ත විශාලන ව්‍යාපෘතිය හේතුවෙන් පීඩාවට පත් ධීවර කාර්මිකයින්ට සිදුවන බලපෑම අවම කිරීම සඳහා ශ්‍රී ලංකා වරාය අධිකාරිය සහ බටහිර පර්යන්ත සංවර්ධන සමාගම, ධීවර අමාත්‍යාංශය රුපියල් මිලියන 140 ක මුදලක් වෙන් කර ඇත. එම මුදල් මෙම ව්‍යාපෘතිය මගින් වැඩි බලපෑමක් එල්ල වන ගම්පහ සහ කොළඹ දිස්ත්‍රික්ක වල ධීවර කර්මාන්තයේ යටිතල පහසුකම් සංවර්ධනය සඳහා භාවිතා කිරීමට නියමිතය. මීට සමගාමීව මීගමුව දිස්ත්‍රික්කයේ සුළු පරිමාණ ධීවර කර්මාන්තයේ නියුතු ධීවරයින් 25 දෙනෙකුට තෙප්පන් ලබාදීම දැනට සිදු කර අවසන්ය. මේ සඳහා රුපියල් මිලියන 3ක් වෙන් කිරීමට ධීවර අමාත්‍යාංශ ලේකම් අනුමැතිය ලබාදුනි. මෙම ව්‍යාපෘතියේ අරමුණ වූයේ සුළු පරිමාණ ධීවර කර්මාන්තයේ නියුතු ධීවරයින්ගේ ධීවර කර්මාන්තය වෙනුවෙන් ඇති සක්‍රිය දායකත්වය වැඩි කිරීමත්, ඔවුන්ගේ මත්ස්‍ය අස්වැන්න වැඩි කිරීමත්, ජීවනෝපාය වැඩි දියුණු කිරීමත්ය. මෙම මුලපිරීම තුලින් දේශීය ධීවර ප්‍රජාවට තිරසාර සහ සමෘද්ධිමත් අනාගතයක් අපේක්ෂා කෙරේ.

මෙම තෙප්පන් නිෂ්පාදනය කරන ලද්දේ සී-නෝර් පදනම(Cey- Nor Foundation) විසිනි. 2024.01.26 දින ධීවර අමාත්‍යාංශයේ නායකත්වයෙන් මෙම තෙප්පන් තෝරාගත් ප්‍රතිලාභීන් වෙත බෙදා දෙන ලදී.

තවත් හඳුනාගෙන ඇති තවත් ව්‍යාපෘතියක් වන ලුනාව බොක්ක ආශ්‍රිත තොටුපල/ දියකඩනය ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය මේ වන විට සිදු කෙරෙමින් පවතී. මෙම ව්‍යාපෘතිය සඳහා ජාතික සැලසුම් දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලැබී ඇත. වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව ඒකාබද්ධව මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කෙරේ. එම කටයුතු සිදු කිරීම සඳහා වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවට බලය ලබා දී ඇත. මුදල් අමාත්‍යාංශය රු. 44,762,707.50 ප්‍රතිපාදන මෙම ව්‍යාපෘතිය සඳහා නිකුත් කර ඇත. ඒ අනුව අදාළ අවබෝධතා ගිවිසුම ජූනි මාසයේදී අත්සන් කළ අතර ව්‍යාපෘතියට අදාළ ඉදිරි කටයුතු මේ වනවිට සිදුවෙමින් පවතී. මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණු වන්නේ දියකඩනයේ ව්‍යුහාත්මක අඛණ්ඩතාව සහ ප්‍රත්‍යස්ථභාවය ඉහළ නැංවීම සහ මුහුදු දියවැල් සහ කුණාටුවට ඔරොත්තු දීම සහ ධීවර ක්‍රියාකාරකම් සඳහා තොටුපලෙහි ආරක්ෂාව සහ ප්‍රවේශය වැඩි දියුණු කිරීමයි.

තවද මෙම රුපියල් මිලියන 140 ක ඉතිරි මුදල යොදා ගනිමින් සිදුකිරීමට නියමිත නව ව්‍යාපෘති මේ වන විට හඳුනාගෙන ඇත.

2.5 මැයි මස 21 වන දින සිදු වූ MV X Press Pearl භාණ්ඩ ප්‍රවාහන නෞකාව ගිනිගැනීමේ සිද්ධිය හේතුවෙන් ධීවර ක්ෂේත්‍රයට සිදුවූ බලපෑම නියාමනය සඳහා ගනු ලැබූ ක්‍රියාමාර්ග ප්‍රගතිය

ඉන්දියාවේ හසිරා වරායේ සිට නයිට්‍රික් අම්ලය මෙට්‍රික් ටොන් 25ක්, තවත් රසායනික ද්‍රව්‍ය, රූපලාවන්‍ය ද්‍රව්‍ය කිහිපයක්, බංකර් ඔයිල් මෙට්‍රික් ටොන් 278ක් සහ සමුද්‍ර වායු තෙල් මෙට්‍රික් ටොන් 50ක් සමඟ කන්ටේනර් 1,486ක් රැගෙන යමින් තිබූ සිංගප්පූරු ධජය සහිත MV Xpress Pearl භාණ්ඩ ප්‍රවාහන යාත්‍රාව 2021 මැයි මස 20 දින ශ්‍රී ලංකාවේ වෙරළට කිලෝමීටර් 9.5ක් ඔබ්බෙන් නැංගුරම් ලා තිබියදී ගිනි ගන්නා ලදි. එමඟින් ප්ලාස්ටික් කැබලි, තෙල් සහ රසායනික කාන්දුවීම් හේතුවෙන් රටේ බටහිර වෙරළ තීරයේ ධීවර කර්මාන්තයට සැලකිය යුතු ආර්ථික හානියක් සිදුවිය. කළුතර සිට මීගමුව දක්වා වෙරළබඩ

ප්‍රදේශයේ තෙල්, රසායනික ද්‍රව්‍ය සහ පිළිස්සුනු අංශු විශේෂයෙන් ප්ලාස්ටික් කැබලි වලින් වෙරළ තීරය දූෂණය වීම නිරීක්ෂණය වී ඇත. ප්ලාස්ටික් කැබලි, තෙල් සහ රසායනික කාන්දු වීම වෙරළබඩ ධීවර කර්මාන්තයට සහ සාගර පරිසර පද්ධතිවලට ඉහළ සෘණාත්මක බලපෑමක් ඇති කරන ලදී. මෙම අනතුර කොරල්පර, මුහුදු තණකොළ, මත්ස්‍ය වාසස්ථාන ආදී සමස්ථ පරිසර පද්ධතියටම බරපතල බලපෑම් එල්ල කරන බව විශේෂඥයෝ පවසන ලදි. එබැවින් MV Xpress Pearl යාත්‍රාවේ බලපෑම පුළුල් වන අතර කෙටි කාලීන, මධ්‍ය කාලීන සහ දිගුකාලීන බලපෑම් ඇති කිරීමට ඉඩ ඇත. ශ්‍රී ලංකාවේ පාරිසරික, සමාජීය සහ ආර්ථික සහ සෞඛ්‍ය අංශ කෙරෙහි කාලීන බලපෑම් ධීවර අමාත්‍යාංශය, ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව සහ අනෙකුත් ආයතන ධීවර අමාත්‍යාංශයේ විෂය පථය යටතට ගෙන ඇති අතර, හානියේ අහිතකර බලපෑම් අවම කර ගැනීමට සහ ධීවරයින් සහ මුහුදු ආහාර පාරිභෝගිකයින් ආරක්ෂා කිරීම සඳහා විවිධ පියවර ගෙන ඇත. ඒ අනුව මීගමුව, කළුතර සහ කොළඹ ධීවර දිස්ත්‍රික්කවල ධීවර ක්ෂේත්‍රයට ක්ෂණික අහිතකර බලපෑම් අවම කරගැනීම සඳහා ධීවර කටයුතු තහනම් කරන ලදී. තාවකාලික මත්ස්‍ය තහනම 2021-05-21 දින පනවා ඇති අතර එය නාරා ආයතනයේ විද්‍යාත්මක නිර්දේශ මත පදනම්ව 2022-06-05 දක්වා ක්‍රියාත්මක විය.

MV Xpress Pearlහි දූෂක සහ සුන්බුන් හේතුවෙන් පරිසර දූෂණය වීමට එරෙහිව පූර්ව ආරක්ෂණ පියවරක් ලෙස සංඛ්‍යාත්මක ආකෘති අධ්‍යනයන් මත පදනම්ව දූෂක පැතිරීමේ හැකියාව හඳුනාගනිමින්, NARA විසින් කිලෝමීටර් 65ක වෙරළ තීරයේ වර්ග කිලෝමීටර් 457ක අක්වෙරළ ප්‍රදේශයක් තහනම් කිරීමට නිර්දේශ කරන ලදි. උතුරේ මහඔය ගං මෝය සහ දකුණේ පානදුර මසුන් ඇල්ලීම තහනම් ලෙස ප්‍රකාශ කරන ලදි. ප්‍රදේශයේ දීර්ඝ කාලයක් තිස්සේ පැවති මත්ස්‍ය තහනම හේතුවෙන් සෘජු ධිවරයින් සහ ධීවර කර්මාන්තයේ වක්‍ර ප්‍රතිලාභීන් සැලකිය යුතු පිරිසක් මෙම සිද්ධියෙන් පිඩාවට පත්වී ඇති අතර එසේ පිඩාවට පත් පාර්ශවයන් ලෙස ධිවරයින් කාණ්ඩ 23ක් සහ ධීවර කර්මාන්තයට සම්බන්ධ වෙනත් වෘත්තීන් වර්ග 24ක් හඳුනාගෙන ඇත.

වගුව 04 : බලපෑමට ලක්වූ සෘජු ධීවරයින් පිළිබඳ තොරතුරු

දිස්ත්‍රික්කය	සෘජු බලපෑමට ලක්වූ ධීවර පරීක්ෂක කොට්ඨාශ සංඛ්‍යාව	සක්‍රිය ධීවර කාර්මිකයින් සංඛ්‍යාව	බලපෑමට ලක්වූ ධිවර යාත්‍රා
මීගමුව	13	11,081	IMUL 40 IDAY 60 OFRP 2015 NTRB 1484 MTRB 02
කොළඹ	10	3,250	IMUL 11 IDAY 14 OFRP 446 NTRB 294 MTRB 01
කළුතර	02	701	OFRP 47 NTRB 33

බහුදිනධිවර යාත්රා (IMUL), එක්දින ධිවර යාත්රා (1 Day) පිටත එන්ජින් සහිත එක්දින ධිවර යාත්රා (OFRP), පාරම්පරික ධිවර යාත්රා (NTRB), යාන්ත්රිකරණය කල (MTRB)

වගුව 05: බලපෑමට ලක්වූ වක්‍ර ධීවරයින් පිළිබඳ තොරතුරු

දිස්ත්‍රික්කය	ධීවර කාර්මිකයින් සංඛ්‍යාව
මීගමුව	3,866
කොළඹ	851
කළුතර	171

2.5.1 ධීවර අමාත්‍යාංශය විසින් අනුමත කරන ලද වන්දි ප්‍රමාණය

වගුව 06 : ඍජු හා වක්‍ර ධීවරයින් සඳහා ලබා දුන් වන්දි ප්‍රමාණ

දිස්ත්‍රික්කය	ලබාදුන් වන්දි ප්‍රමාණය (රුපියල්)				
	1 වන අදියර	2 වන අදියර	3 වන අදියර	4 වන අදියර	එකතුව
මීගමුව	206,197,500.00	242,825,000.00	551,220,000.00	998,237,548.00	1,998,480,048.00
කොළඹ	58,942,500.00	74,720,500.00	205,233,125.00	288,319,656.00	627,215,781.00
කළුතර	14,170,000.00	16,312,500.00	37,285,000.00	72,558,360.00	140,325,860.00
රු. 5000 දීමනාව වෙනුවෙන්	67,000,000.00				67,000,000.00
දැල්ආම්පන්න සඳහා	2,067,515.00			4,474,410.00	6,541,925.00
ජලජීවීවගාවන්ට සිදු වූ හානි පූරණය		1,154,930.00			1,154,930.00
එකතුව	348,377,515.00	335,012,930.00	793,738,125.00	1,363,589,974.00	2,773,718,544.00

2.5.2 පරිපාලන වියදම් දීමනාව ලබා දීම

එක්ස්ප්‍රස් පර්ල් නෞකාව ශ්‍රී ලංකා මුහුදු තීරයේ දී ගිනි ගෙන මුහුදු බත් වීම හේතුවෙන් සිදු වූ හානිය හඳුනා ගැනීම, අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සඳහා රාජ්‍ය ආයතන කිහිපයක් එකතු වී කටයුතු කරන ලදී. ඒ සඳහා ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය, සමුද්‍රිය පරිසර ආරක්ෂණ අධිකාරිය, ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිත ආයතනය, දිස්ත්‍රික් ලේකම් කාර්යාල හා ප්‍රාදේශිය ලේකම් කාර්යාල යන රාජ්‍ය ආයතන ඉතා විශාල දායකත්වයක් ලබා දුන් අතර මේ වන විට ද අවශ්‍ය සියළු කටයුතු සඳහා සහයෝගය ලබා දෙමින් පවති.

ඒ අනුව, ධීවර ක්ෂේත්‍රයට සිදු වූ හානි තක්සේරු කිරීම, ජීවිකාව අහිමි වූ පුද්ගලයන් හඳුනා ගැනීම, හා වන්දි ගෙවීම ඇතුළු පරිපාලනමය කාර්යයන් සිදු කිරීම වෙනුවෙන් ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ අදාළ රාජකාරි ඉටු කරන ලද නිලධාරීන් 292 දෙනෙකු සඳහා 2021.05.21 දින සිට 2023.12.31 දක්වා සිදුකරන ලද රාජකාරිය වෙනුවෙන් දීමනාවක් ගෙවීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගනිමින් සිටි.

2.6 ධීවර හැඳුනුම්පත් නිකුත් කිරීම

ධීවර කර්මාන්තයේ නියැලෙන ධීවර ප්‍රජාවගේ අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා ධීවර හැඳුනුම්පත් සහ යාත්‍රා නියමු බලපත්‍ර නිකුත් කිරීම ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ සංවර්ධන අංශය විසින් සිදු කරනු ලබයි.

2024 ජනවාරි 01 සිට 2024 දෙසැම්බර් 31 දක්වා සංවර්ධන අංශය විසින් නිකුත් කර ඇති ධීවර හැඳුනුම්පත් සහ යාත්‍රා නියමු බලපත්‍ර පිළිබඳ තොරතුරු පහත පරිදි වේ.

නිකුත්කර ඇති මුළු ධීවර හැඳුනුම්පත් සංඛ්‍යාව - 1,528
නිකුත්කර ඇති මුළු යාත්‍රා නියමු බලපත්‍ර සංඛ්‍යාව - 871

2.7 කලපු සංවර්ධනය (සංවර්ධන අංශය)

2.7.1 පුත්තලම ධීවර දිස්ත්‍රික්කයේ පුත්තලම කලපුව ගැසට් කිරීම

2010 අගෝස්තු 4 වන දින අංක 1665/17 දරණ යටතේ පුත්තලම කලපුව කළමනාකරණ ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කර ඇත. 2013 අංක 35 දරණ සංශෝධිත ධීවර හා ජලජ සම්පත් පනතේ ප්‍රතිපාදනවලට අනුව පුත්තලම කලපු පරිසර පද්ධතියේ සංරක්ෂණ, සංවර්ධන හා කළමනාකරණය හා ආරක්ෂාව තහවුරු කර ගැනීම සඳහා නැවත GPS පාඨාංක සහිතව ගැසට් කිරීමට අවශ්‍ය කටයුතු නීති අංශය විසින් සිදු කරමින් පවතී.

2.7.2 පුත්තලම ධීවර දිස්ත්‍රික්කයේ ධීවරයින් දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වන ලදි

2024 වර්ෂයේ පුත්තලම ධීවර දිස්ත්‍රික්කයේ පුත්තලම කලපුවේ කලපු කළමනාකරණ කමිටුවල ඉදිරි ක්‍රියාකාරීත්වය හා ධීවර ජනතාවගේ ජීවනෝපාය ඉහළ නැංවීම පිළිබඳ ධීවරයින් දැනුවත් කිරීමේ වැඩසටහන් 04ක් 2024 අප්‍රේල් 24, 25, 30 සහ මැයි 09 යන දින තුළ පවත්වන ලදි.

රූපය 03: පුත්තලම ධීවර දිස්ත්රික්කයේ ධීවරයින් දැනුවත් කිරීමේ වැඩසටහන පවත්වන අයුරු දැක්වෙන ඡායාරූප

2.7.3 හලාවත ධීවර දිස්ත්‍රික්කයේ ධීවරයින් දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වන ලදී

2024 වර්ෂයේ හලාවත ධීවර දිස්ත්‍රික්කයේ හලාවත කලපුවේ කලපු කළමනාකරණ කමිටුවල ඉදිරි ක්‍රියාකාරීත්වය හා ධීවර ජනතාවගේ ජීවනෝපාය ඉහළ නැංවීම පිළිබඳ ධීවරයින් දැනුවත් කිරීමේ වැඩසටහන් 04 ක් 2024 අප්‍රේල් 08, 29 සහ මැයි 03 යන දින තුළ පවත්වන ලදි.

2.7.4 මාතර ධීවර දිස්ත්‍රික්කයේ ධීවරයින් දැනුවත් කිරීමේ වැඩසටහනක් පවත්වන ලදී

2024 වර්ෂයේ මාතර ධීවර දිස්ත්‍රික්කයේ ගරාඬුව කලපුවේ කලපු කළමනාකරණ කමිටුවල ඉදිරි ක්‍රියාකාරීත්වය හා ධීවර ජනතාවගේ ජීවනෝපාය ඉහළ නැංවීම පිළිබඳ ධීවරයින් දැනුවත් කිරීමේ වැඩසටහනක් 2024 පෙබරවාරි 22 දින පවත්වන ලදි.

2.7.5 හලාවත කොග්ගල හා ගරාඬුව යන කලපුවල ධීවර සංවර්ධන හා කළමනාකරණ සැලැස්ම ගැසට් කිරීම සඳහා අවශ්‍ය නීතිමය කටයුතු කෙරෙමින් පවතී

ගාල්ල දිස්ත්‍රික්කයේ කොග්ගල කලපුවත්, මාතර දිස්ත්‍රික්කයේ පිහිටි ගරාඬුව කලපුවත් සහ පුත්තලම දිස්ත්‍රික්කයේ පිහිටි පුත්තලම කලපුවත් එම කලපු පරිසර පද්ධතියේ පාරිසරික තත්වයන් තිරසාරව පවත්වා ගැනීමටත් ඒ තුළින් කලපුව ආශ්‍රිතව සිදුකරන්නාවූ ජීවනෝපායන් සුරක්ෂිත කිරීම අරමුණු කරගෙන මෙම ධීවර සංවර්ධන හා කළමනාකරණ සැලැස්ම ගැසට් කිරීමට නියමිතය.

2.7.6 පුත්තලම ධීවර දිස්ත්‍රික්කයේ පුත්තලම කලපුව වටා කණු සිටුවීම සඳහා කණු ප්‍රවාහනය කිරීම

පුත්තලම ධීවර දිස්ත්‍රික්කයේ පුත්තලම කලපුව වටා සිටුවීම සඳහා කණු ප්‍රවාහනය කිරීමේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය නිමාකිරීම හා මේ වන විට කණු ප්‍රවාහනය කිරීම ආරම්භ කර ඇත.

2.8 උතුරු හා නැගෙනහිර පළාත් වල අඩු ආදායම් ලාභී ධීවර පවුල් සඳහා චීන සමූහාණ්ඩු ආධාර යටතේ සහල් සහනාධාර ලබාදීමේ වැඩසටහන 2024

චීන සමූහාණ්ඩු ආධාර යටතේ ශ්‍රී ලංකා රජයට රුපියල් මිලියන 555.4ක වටිනාකමකින් යුත් සහල් මෙට්‍රික් ටොන් 1,630 පරිත්‍යාග කර ඇති අතර එම සහල් සහනාධාරය යාපනය, කිලිනොච්චි, මඩකලපුව, මන්නාරම, මුලතිව්, ත්‍රිකුණාමලය හා කල්මුණේ යන දිස්ත්‍රික්ක තුළ සක්‍රීය ධීවර කර්මාන්තයේ නියැලෙන අඩු ආදායම්ලාභී ධීවර කාර්මිකයින් වෙත බෙදා දීමේ 2024.12.31 දිනට ප්‍රගතිය පහත පරිදි වේ.

යාපනය දිස්ත්‍රික්කයට ප්‍රවාහනය කරන ලද කිලෝ ග්‍රෑම් 50 බැගින් වූ සහල් මලු 7,129න් පළමු අදියර යටතේ ප්‍රතිලාභීන් 15,197කට සහල් කිලෝග්‍රෑම් 20 බැගින්ද දෙවන අදියර යටතේ ප්‍රතිලාභීන් 5,251කට කිලෝග්‍රෑම් 10 බැගින්ද බෙදාදී සම්පූර්ණයෙන්ම අවසන්ව ඇත.

කිලිනොච්චි දිස්ත්‍රික්කයට ප්‍රවාහනය කරන ලද කිලෝ ග්‍රෑම් 50 බැගින් වූ සහල් මලු 1,174 ප්‍රතිලාභීන් 2935කට කිලෝග්‍රෑම් 20 බැගින් බෙදාදී අවසන්ව ඇත.

මන්නාරම දිස්ත්‍රික්කයට ප්‍රවාහනය කරන ලද කිලෝ ග්‍රෑම් 50 බැගින් වූ සහල් මලු 4,226 ප්‍රතිලාභීන් 8007කට කිලෝ ග්‍රෑම් 20 බැගින් බෙදාදී අවසන්ව ඇති අතර, ඉතිරි සහල් මලු 1023 (කිලෝ ග්‍රෑම් 50 බැගින් වූ) මන්නාරම දිස්ත්‍රික් ලේකම්ගේ ඉල්ලීම පරිදි ගං වතුරෙන් අවතැන් වූ ජනතාවට බෙදා දීමට ලබා දී ඇත.

මුලතිව් දිස්ත්‍රික්කයට ප්‍රවාහනය කරන ලද කිලෝ ග්‍රෑම් 50 බැගින් වූ සහල් මලු 1,500 ප්‍රතිලාභීන් 3,750කට කිලෝග්‍රෑම් 20 බැගින් බෙදාදී අවසන්ව ඇති අතර, ත්‍රිකුණාමලය හා කල්මුනේ යන දිස්ත්‍රික්ක වල වැඩිපුර ඉතිරිව මුලතිව් දිස්ත්‍රික්කයට ප්‍රවාහනය කරන ලද කිලෝ ග්‍රෑම් 50 බැගින් වූ සහල් මලු 1,332ක් ප්‍රතිලාභීන් වෙත බෙදා දීමට නියමිතය. මෙලෙස මුලතිව් දිස්ත්‍රික්කයට නැවත සහල් ප්‍රවාහනය කරන ලද්දේ 2022 අප්‍රේල් මස ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද Poverty Indicator 2019 වාර්තාවට අනුව ධරිද්‍රතාවය ප්‍රතිශතයක් ලෙස ඉහලම අගයක් ගන්නා දිස්ත්‍රිකය මුලතිව් බැවිනි.

මඩකලපුව දිස්ත්‍රික්කයට ප්‍රවාහනය කරන ලද කිලෝ ග්‍රෑම් 50 බැගින් වූ සහල් මලු 6504, ප්‍රතිලාභීන් 16,260කට කිලෝග්‍රෑම් 20 බැගින් බෙදාදී අවසන්ව ඇත.

ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයට ප්‍රවාහනය කරන ලද කිලෝ ග්‍රෑම් 50 බැගින් වූ සහල් මලු 7,253න් කිලෝ ග්‍රෑම් 50 බැගින් වූ සහල් මලු 5,640ක් ප්‍රතිලාභීන් 14,100කට කිලෝග්‍රෑම් 20 බැගින් බෙදාදී අවසන්ව ඇති අතර, ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ වැඩිපුර ඉතිරිව ඇති කිලෝ ග්‍රෑම් 50 බැගින් වූ සහල් මලු 1,293ක් මුලතිව් දිස්ත්‍රික්කයට ප්‍රවාහනය කරන ලදි.

කල්මුනේ දිස්ත්‍රික්කයට ප්‍රවාහනය කරන ලද කිලෝ ග්‍රෑම් 50 බැගින් වූ සහල් මලු 4,772න් කිලෝ ග්‍රෑම් 50 බැගින් වූ සහල් මලු 4,288ක් ප්‍රතිලාභීන් 10,720කට කිලෝග්‍රෑම් 20 බැගින් බෙදාදී අවසන්ව ඇති අතර, කිලෝ ග්‍රෑම් 50 බැගින් වූ සහල් මලු 30ක් ගං වතුරෙන් හානි වී ඇත. තවත් කිලෝ ග්‍රෑම් 50 බැගින් වූ සහල් මලු 301ක් ප්‍රතිලාභීන් වෙත බෙදා දීමට ඉතිරිව පවතී. වැඩිපුර ඉතිරිව ඇති කිලෝ ග්රෑම් 50 බැගින් වූ සහල් මලු 153ක් මුලතිව් දිස්ත්‍රික්කයට ප්‍රවාහනය කරන ලදි.

2.9 උතුරු හා නැගෙනහිර පළාත් වල අඩු ආදායම්ලාභී ධීවර පවුල් සඳහා චීන සමූහාණ්ඩු ආධාර යටතේ පෙර සැකසූ නිවාස 500ක් ලබාදීමේ වැඩසටහන 2024

චීන සමූහාණ්ඩු ආධාර යටතේ ශ්‍රී ලංකා රජයට රුපියල් මිලියන 750ක වටිනාකමකින් යුත් පෙර සැකසූ නිවාස 500ක් පරිත්‍යාග කර ඇති අතර එම පෙර සැකසූ නිවාස යාපනය, කිලිනොච්චි, මඩකලපුව, මන්නාරම, මුලතිව්, ත්‍රිකුණාමලය හා කල්මුණේ යන දිස්ත්‍රික්ක තුළ සක්‍රීය ධීවර කර්මාන්තයේ නියැලෙන අඩු ආදායම්ලාභී ධීවර කාර්මිකයින් සඳහා බෙදා දීමට නියමිතය. මෙම පෙර සැකසූ නිවාස පහත සඳහන් ආකාරයට අදාළ දිස්ත්‍රික්ක වලට ප්‍රවාහනය කර ඇතත් පැවති ජනාධිපතිවරණ හා පාර්ලිමේන්තු මැතිවරණ හේතුවෙන් ප්‍රතිලාභීන් තෝරාගැනීම හා බෙදාදීම ප්‍රමාදව ඇත.

වගුව 07: පෙර සැකසූ නිවාස බෙදා හැරීමේ සාරාංශය

දිස්ත්‍රික්කය	**නියම කල පෙර සැකසූ නිවාස ගණන**	**ප්‍රවාහනය කල පෙර සැකසූ නිවාස ගණන**	**බෙදා දුන් පෙර සැකසූ නිවාස ගණන**
යාපනය	116	116	තවමත් බෙදා දී නොමැත
කිලිනොච්චි	64	64	
මන්නාරම	64	64	
මුලතිව්	64	64	
මඩකලපුව	64	64	
කල්මුණේ	64	64	
ත්‍රිකුණාමලය	64	64	
එකතුව	**500**	**500**	

ත්‍රිකුණාමලය, මන්නාරම, යාපනය හා මඩකලපුව යන දිස්ත්‍රික්කවල එක් නිවසක් ආදර්ශයක් ලෙස සකස් කර ඇති අතර එම ආදර්ශ නිවාස ප්‍රතිලාභීන්ට පෙන්වා පෙර සවි නිවාසයක් ලබා ගැනීමට කැමැත්ත ලබාගනිමින් පවතී. ත්‍රිවිධ හමුදාව විසින් මෙම පෙර සවි නිවාස ඉදිකිරීමට ශ්‍රම දායකත්වය ලබා දීමට එකඟව ඇත.

ත්‍රිකුණාමලය දිස්ත්‍රිකයේ මේ වනවිටත් ප්‍රතිලාභීන් 64දෙනා හඳුනාගෙන අවසන්ව ඇත. ත්‍රිවිධ හමුදාවේ ශ්‍රම දායකත්වයෙන් ප්‍රථමයෙන්ම මෙම නිවාස ඉදිකිරිම ආරම්භ කිරීමට නියමිතය.

2.10 උතුරු හා නැගෙනහිර පළාත් වල අඩු ආදායම්ලාභී ධීවර පවුල් සඳහා චීන සමූහාණ්ඩු ආධාර යටතේ මත්ස්‍ය දැල් 75,000ක් ලබාදීමේ වැඩසටහන 2024

චීන සමූහාණ්ඩු ආධාර යටතේ ශ්‍රී ලංකා රජයට රුපියල් මිලියන 500ක වටිනාකමකින් යුත් මත්ස්‍ය දැල් 75,000ක් පරිත්‍යාග කර ඇති අතර එම මත්ස්‍ය දැල් යාපනය, කිලිනොච්චි, මඩකලපුව, මන්නාරම, මුලතිව්, ත්‍රිකුණාමලය හා කල්මුණේ යන දිස්ත්රික්ක තුළ සක්‍රීය ධීවර කර්මාන්තයේ නියැලෙන අඩු ආදායම්ලාභී ධීවර කාර්මිකයින් සඳහා බෙදා දීමට නියමිතය. මෙම මත්ස්‍ය දැල් පහත සඳහන් ආකාරයට අදාළ දිස්ත්‍රික්ක වලට ප්‍රවාහනය කර ඇත.

වගුව 08: දැල් සහනාධාරය බෙදා හැරීමේ සාරාංශය

	දිස්ත්‍රික්කය	**තෝරාගත් ප්‍රතිලාභීන් සංඛ්‍යාව**	**එක් එක් දිස්ත්‍රික්කයකට අනුමත හා ප්‍රවාහනය කල දැල් සංඛ්‍යාව**	**දැල් බෙදා දුන් ප්‍රතිලාභීන් සංඛ්‍යාව**
1	යාපනය	3,614	21,684	2,384
2	ත්‍රිකුණාමලය	2,625	15,750	1,196
3	මන්නාරම	2,309	13,854	1,504
4	මඩකලපුව	1,589	9,534	1,583
5	මුලතිවු	583	3,498	437
6	කල්මුණේ	887	5,322	791
7	කිලිනොච්චි	870	5,220	622
එකතුව		**12,477**	**74,862**	**8,517**

පැවති ජනාධිපතිවරණ හා පාර්ලිමේන්තු මැතිවරණ හේතුවෙන් දැල් බෙදාදීම ප්‍රමාදවූ අතර දැනට දැල් බෙදාදීම ආරම්භකර ඇත.

2.11 ලෝක ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ සහාය යටතේ දේශගුණයට ඔරොත්තු දෙන බෝට්ටු (Climate resilient boats) සැපයීම

තිරසාර සංවර්ධනය සහ දේශගුණික විපර්යාස අභියෝගවලට මුහුණ දීම සඳහා එක්සත් ජාතීන්ගේ ලෝක ආහාර හා කෘෂිකර්ම සංවිධානය (FAO) විසින් පර්යේෂණ මට්ටමින් නිර්මාණය කරන ලද දේශගුණයට ඔරොත්තු දෙන ධීවර යාත්‍රා දෙකක් ධීවර අමාත්‍යාංශය වෙත භාර දෙන ලදී.

SL20 සහ SL23 යන ධීවර යාත්‍රා දිගින් මීටර් 6.3 සහ 7 ක් වන අතර ඒවා ශ්‍රී ලංකාවේ වෙරළබඩ ධීවර කටයුතු සඳහා නිර්මාණය කර ඇත. FAO/ILO/IMO ප්‍රමිතීන්ට අනුකූලව, මෙම බෝට්ටු ධීවරයින්ගේ ආරක්ෂාවට ප්‍රමුඛත්වය ලබා දෙන අතර, නිතර නිතර හා තීව්‍ර කුණාටු සහ සුළි සුළං ඇතුළු දේශගුණික විපර්යාස මගින් එල්ල වන අභියෝගවලට ඔරොත්තු දෙන ලෙස සහ පෙරළීමට ඔරොත්තු දෙන ලෙස ඉදිකර ඇත. මෙම දේශගුණයට ඔරොත්තු දෙන බෝට්ටු වල සැලසුම් FAO ධීවර යාත්‍රා සැලසුම් දත්ත ගබඩාව හරහා නොමිලේ ලබා ගත හැකිය.

බෝට්ටු වල ක්‍රියාකාරිත්වය සලකා බැලීමේදී, SL20 සහ SL23 ජලය මත ඇති පාදම (footprint) සම්ප්‍රදායික ධීවර බෝට්ටුවලට වඩා පුළුල්ය. පුළුල් පාදමක ඇති එක් වාසියක් නම්, SL20 සහ SL23 බෝට්ටු තුළ වැඩි අයිස් ප්‍රමාණයක් පැටවිය හැකි වීම හා, කාර්ය මණ්ඩලය පැටවූ විට එම බර දරා ගැනීමේ හැකියාවත්, එමගින් බෝට්ටුවේ වේගය පවත්වා ගැනීමට බාධාවක් ඇති නොවීමත්ය. SL20 සහ SL23 හි පතුල වැඩිදියුණු කළ V-හැඩැති මෝස්තරයක් ඇත. වැඩිදියුණු කළ V-හැඩයේ වාසිය නම් SL20 සහ SL23 අයහපත් කාලගුණය තුළදීද, වේගය සහ කාර්යක්ෂමතාව පවත්වා ගැනීමට හැකි වීමයි. සාම්ප්‍රදායික ධීවර බෝට්ටු වල සාපේක්ෂ පැතලි පතුලක් ඇති අතර එමඟින් ඉහළ රළ සහිත මුහුදු තත්වයන් තුළ ස්ථාවරත්වය අඩු අතර කාර්යක්ෂමතාව ද අඩු වේ.

රූපය 04: මූලාශ්‍රය https://www.fao.org/fishery/en/news/41439

SL20 සහ SL23 ව්‍යුහාත්මකව ශක්තිමත් සහ වඩා කල් පවතින ඒවා වේ. හොඳින් භාවිතා කර නඩත්තු කරන්නේ නම් ඒවායේ මෙහෙයුම් ආයු කාලය අවුරුදු 20 ත් 25 ත් අතර වේ. මෙම නව බෝට්ටු ප්‍රමිතීන් වෙත සංක්‍රමණය වීමෙන්, ශ්‍රී ලංකාවේ ධීවර කර්මාන්තයේ ෆයිබර්ග්ලාස් මගින් ශක්තිමත් කරන ලද ප්ලාස්ටික් (Fiberglass reinforced plastic -FRP) වලින් සිදුවන පරිසර දූෂණය තුනෙන් එකකින් අඩු කළ හැකිය.
මෙම බෝට්ටු සැලසුම් කිරීම සහ ඉදිකිරීමේ කටයුතු සඳහා දළ වශයෙන් වැය වූ රුපියල් මිලියන 9 ක මුදල වෙන් වූයේ නෝර්වීජියානු රජය මගින් FAOහි "තිරසාර සංවර්ධනය සඳහා ධීවර හා ජලජීවී සම්පත් වගකීමෙන් යුතුව භාවිතා කිරීම" සම්බන්ධ ව්‍යාපෘති සඳහා වූ මුලා භාර අරමුදලට ත්‍යාගශීලීව බැර කරන ලද මුලා අරමුදල් මගිනි.

ක්ෂේත්‍ර පරීක්ෂණ සිදුකිරීම සඳහා සහ මෙම වැඩිදියුණු කළ බෝට්ටු පිළිබඳව ජනතාව දැනුවත් කිරීමේ අරමුණින් මෙම බෝට්ටු දෙක අවබෝධතා ගිවිසුමක් හරහා යාපනය සහ කළුතර දිස්ත්‍රික්කවල ධීවර කාර්යාල වෙත නිල වශයෙන් භාරදී ඇත. ඒවායේ භාවිතයට අදාළ දත්ත නිතිපතා එකතු කිරීම අත්‍යවශ්‍ය වන අතර මෙම දත්ත අවශ්‍ය පරිදි ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවට සහ ලෝක ආහාර හා කෘෂිකර්ම සංවිධානයට (FAO) ඉදිරිපත් කළ යුතුය.

2.12 ආර්ථික අර්බුදය හේතුකොට ගෙන ධීවර කර්මාන්තයට ඇතිවී ඇති බලපෑම අවමකර ධීවර කර්මාන්තය යථාතත්වයට පත්කිරීමේ වැඩසටහන - 2024

මෙම වැඩසටහන යටතේ ඉන්ධන වශයෙන් ඩීසල් භාවිතා කරන එක්දින(IDAY) හා බහුදින(IMUL) ධීවර යාත්‍රා 6,500ක් පමණද, ඉන්ධන වශයෙන් භූමිතෙල් භාවිතා කරන කුඩා යාත්‍රා (OFRP, MTRB) 32,000ක් පමණ ප්‍රමාණයක් සඳහා "ධීවර කර්මාන්තය යථාතත්වයට පත්කිරීමේ දීමනාව" ලබා දෙනු ලබයි.

ඉන්ධන වශයෙන් භූමිතෙල් භාවිතාකරන ධීවරයින් සඳහා දිනකට භූමිතෙල් ලීටර 15ක් හා මසකට දින 25ක උපරිමයකට යටත්ව රැකියාවේ නිරත වන දින සඳහා පමණක් ලීටරයකටරු 25/- ක"ධීවර කර්මාන්තය යථාතත්වයට පත්කිරීමේ දීමනාවක්"ලබා දෙන අතරධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව යටතේ ලියාපදිංචි, සක්‍රියව ධීවර කර්මාන්තයේ නියැලෙන MTRB හා OFRP ධීවර යාත්‍රා හිමිකරුවන් විසින් මිලදී ගන්නා භූමිතෙල් සඳහා දිනකට ලීටර් 15ක උපරිමයකට යටත්ව ධිවර කර්මාන්තයේ යෙදෙන දින 25 ක් සඳහා මසකට රුපියල් 375,9 ක මුදලක් ප්‍රති පූර්ණය කරනු ලබයි.

ඉන්ධන වශයෙන් ඩීසල් භාවිතා කරන ධීවර යාත්‍රා හිමියන් සඳහා ඔවුන් විසින් මිලදී ගන්නා එක් ඩීසල් ලීටරයකට රු. 25/- ක මුදලක් ලැබෙන සේ එම ධීවරයින් සඳහාද "ධීවර කර්මාන්තය යථාතත්වයට

පත්කිරීමේ දීමනාවක්'' අදාළ ධීවර යාත්‍රා වර්ගය, මෙහෙයුම් වර්ගය, මෙහෙයුම් ප්‍රදේශය හා මෙහෙයුම් කරන දින ගණන පදනම්ව ලබා දීමට රජය විසින් තීරණය කරන ලද අතර, ඒ අනුව ඉන්ධන වශයෙන් ඩීසල් භාවිතා කරන ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව යටතේ ලියාපදිංචි, සක්‍රියව ධීවර කර්මාන්තයේ නියැලෙන IMUL හා IDAY ධීවර යාත්‍රා සඳහා මිළදී ගන්නා ඩීසල් ලීටරයකට රු.25 බැගින් මුදලක් ප්‍රති පුර්ණය කරනු ලබයි. එසේ වුවද එක් ගමන් වාරයක් සඳහා ප්‍රතිලාභ ප්‍රතිපූර්ණය කරනු ලබන ඉන්ධන ප්‍රමාණය එම යාත්‍රාවේ ඉන්ධන ටැංකි ධාරිතාවය ඉක්මවා නොයා යුතු අතර එක් මාසයක් සඳහා රු 300,000/-. උපරිමයකට යටත්ව මුදල් ප්‍රතිපූර්ණය කරනු ලබයි.

මෙම වැඩසටහන මාස 06ක කාලයක් සඳහා පමණක් ක්‍රියාත්මක වේ. එම කාළය තුල බණිජ තෙල් නීතිගත සංස්ථාව විසින් ඩීසල් හා භූමිතෙල් මිල සංශෝධනයක් සිදුකරන සෑම අවස්ථාවකදීම එම සංශෝධන ක්‍රියාත්මක වන දින සිට මෙම යෝජනා ක්‍රමය යටතේ ප්‍රතිලාභයද සංශෝධනය වේ. ඒ අනුව සෑමවිටම ඩීසල් සඳහා 7.5% ක ප්‍රතිශතයක් ද භූමිතෙල් සඳහා 12.5% ලෙසද සළකා ලීටරයක් සඳහා ලබාදෙන ප්‍රතිලාභය ගණනය කරනු ලබයි.

අදාළ''ධීවර කර්මාන්තය යථාතත්වයට පත්කිරීමේ දීමනාව'' ලබා දෙනු ලබන්නේ 1980 ධීවර යාත්‍රා ලියාපදිංචි කිරීමේ නියෝග මාලාවට අනුකූලව ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි සහ 2024 වර්ෂය සඳහා මෙයෙහුම් බලපත්‍රය ලබා ගෙන ඇති ධීවර යාත්රා සඳහා පමණි.

ප්‍රතිලාභීන් සඳහා අදාළ දීමනාව ලබා දීමේදී ඔවුන් විසින් මිලදී ගන්නා ලද ඉන්ධන ප්‍රමාණයට අදාළ රිසිට් පත් අදාළ ධීවර දිස්ත්‍රික්කයේ සහකාර අධ්‍යක්ෂ මගින් ප්‍රධාන කාර්යාලය වෙත මුදල් ප්‍රතිපූර්ණය කිරීමේ අයදුම්පත සමඟ ඉදිරිපත් කළ පසු අදාළ ගෙවීම් ප්‍රතිලාභියාගේ බැංකු ගිණුමට ප්‍රධාන කාර්යාලය විසින් බැර කරනු ලබයි.

වගුව 09: "ධීවර කර්මාන්තය යථාතත්වයට පත්කිරීමේ දීමනාව" ලබා දීමේ සාරාංශය
2024.10.01. සිට 2024.12.31 දක්වා

අනු අංකය	දිස්ත්‍රික්කය	දීමනාව ලබා දුන් බෝට්ටු සංඛ්‍යාව	ගෙවූ මුළු මුදල (රු.)
1	මඩකලපුව	256	1,796,300.00
2	කොළඹ	185	693,050.00
3	හලාවත	343	37,419,460.00
4	ගාල්ල	93	4,839,075.00
5	යාපනය	726	3,954,437.75
6	කිලිනොච්චිය	108	645,375.00
7	කළුතර	232	8,604,388.00
8	කල්මුණේ	36	1,012,875.00
9	මන්නාරම	72	337,500.00
10	මාතර	553	24,113,000.00
11	තංගල්ල	374	15,370,383.76
12	ත්‍රිකුණාමලය	635	4,082,326.00
13	පුත්තලම	179	3,646,250.00
14	මීගමුව	141	7,867,197.50
15	මුලතිවු	0	-
	එකතුව	3,933	114,381,618.01

3.0 කළමනාකරණ අංශය

3.1 ධීවර හා ජලජ සම්පත් තිරසාර ලෙස කලමණාකරණය

ධීවර කළමනාකරණය යනු ධීවර හා සාගර සම්පත් තිරසාර ලෙස භාවිතා කිරීම සහ සංරක්ෂණය කිරීම අරමුණු කරගත් බහුවිධ ප්‍රවේශයකි. 1996 අංක 2 දරන ධීවර හා ජලජ සම්පත් පනත අනුව සකස් කරන ලද ශක්තිමත් නියාමන රාමු සහ ප්‍රතිපත්ති මගින් පාලනය වන අතර, එයට බලපත්‍ර, නියාමනය සහ බලාත්මක කිරීම , අධීක්ෂණය කිරීම ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ කළමනාකරණ අංශය මඟින් සිදු කරයි. තීරණ ගැනීමේ ක්‍රියාවලීන්හි දේශීය මැදිහත්වීම් සහතික කරමින් ප්‍රජා පාදක කළමනාකරණය මුල පිරීම් හරහා ප්‍රජා සහභාගීත්වය දිරිමත් කරනු ලැබේ. සමස්ථයක් වශයෙන්, ශ්‍රී ලංකාවේ ධීවර කළමනාකරණය වර්තමාන සහ අනාගත පරම්පරාවේ ප්‍රයෝජනය සඳහා පාරිසරික සංරක්ෂණය සමඟ සමාජ-ආර්ථික අවශ්‍යතා සමතුලිත කිරීමට උත්සාහ කරයි. මෙම දෙපාර්තමේන්තුවෙහි කළමනාකරණ අංශය ඉහත ක්‍රියාකාරකම් සිදුකිරීමේ වගකීම දරන අතර එම අංශයේ ප්‍රධාන කාර්යයන් පිලිබඳ විස්තර පහත දැක්වේ.

අරමුණ

මෙම අංශයේ ප්‍රධාන අරමුණ වන්නේ ධීවර යෙදවුම් සහ මෙහෙයුම් නියාමනය මගින් ධිවර හා සාගර සම්පත් කළඹණාකරණය කිරිමත්, ප්‍රජා සහභාගීත්වයෙන් මුහුදු, කලපු සහ ජලාශවල ධීවර සම්පත් සංරක්ෂණය හා කළමනාකරණය මගින් ශ්‍රී ලංකාවේ ධීවර ක්ෂේත්‍රයේ තිරසාර සංවර්ධනයක් අත්කර ගැනීමයි.

අංශයේ කාර්යයන්

- ධීවර රෙගුලාසි සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම.
- ධීවර යාත්‍රා ලියාපදිංචි කිරීම.
- ධිවර යාත්‍රා පැවරීම(බහුදින ධිවර යාත්‍රා).
- ධිවර යාත්‍රා උකස් කිරීම හා ධිවර යාත්‍රා උකස් නිරවුල් කිරීම
- ධිවර යාත්‍රා ලියාපදිංචිය අවලංගු කිරීම.
- ජාත්‍යන්තර මුහුදේ ධිවර මෙහෙයුම් සඳහා මෙහෙයුම් බලපත්‍ර නිකුත් කිරීම
- දේශිය මුහුදේ ධීවර මෙහෙයුම් බලපත්‍ර නිකුත් කිරීම.
- විදේශීය යාත්‍රා සඳහා මාළු ගොඩබෑමේ බලපත්‍ර නිකුත් කිරීම.
- විසිතුරු මසුන් සඳහා ආනයන, අපනයන සහ ප්‍රතිඅපනයන බලපත්‍ර නිකුත් කිරීම.
- මුහුදු කූඩැල්ලන් හා පොකිරිස්සන් ඇල්ලීම, සන්තකයේ තබා ගැනීම, ප්‍රවාහනය සහ අපනයනය සඳහා බලපත්‍ර නිකුත් කිරීම.
- හක්බෙල්ලන්, සිප්පි කටු සහ මෝර වරල් .නක්ලා ,බෙල්ලන්ගේ මාංශ(Chicoreus Ramosu) මුහුදු තෘණ සඳහා ප්‍රවාහනය සහ අපනයනය සඳහා බලපත්‍ර නිකුත් කිරීම.
- පොකිරිස්සන් සන්තකයේ තබා ගැනීම, විකිණීම, ප්‍රදර්ශනය කිරීම සහ ප්‍රවාහනය කිරීම සඳහා අවසර පත්‍ර නිකුත් කිරීම
- කෘතීම උපස්තර මත වගා කරන ලද කොරල් අපනයනය සඳහා බලපත්‍ර ලබා දීම සඳහා බලපත්‍ර නිකුත් කිරීම
- ධිවර යාත්‍රා නියමුවන් සඳහා නියමු බලපත්‍ර නිකුත් කිරීම
- මාදැල් වරායන් සහ හිමිකරුවන් ලියාපදිංචි කිරීම සහ වෙරළ තීරයන් සඳහා බලපත්‍ර නිකුත් කිරීම සහ ගැටලු නිරාකරණය.
- මසුන් හා මත්ස්‍ය නිෂ්පාදන ආනයනය සඳහා ලියාපදිංචි කිරීම හා කළමනාකරණ බලපත්‍ර නිකුත් කිරීම

- මසුන් හා මත්ස්‍ය නිෂ්පාදන අපනයනය සඳහා ලියාපදිංචි කිරීම හා කළමනාකරණ බලපත්‍ර නිකුත් කිරීම
- මසුන් හා මත්ස්‍ය නිෂ්පාදන ප්‍රතිඅපනයනය සඳහා ලියාපදිංචි කිරීම හා කළමනාකරණ බලපත්‍ර නිකුත් කිරීම
- නව යාත්‍රා ලියාපදිංචි කිරීමේ අංක වෙන් කිරීම, අනුමත කිරීම, නිකුත් කිරීම
- විදේශ ආධාර යටතේ ක්‍රියාත්මක ධීවර කළමනාකරණය සම්බන්ධ සියළුම ව්‍යාපෘති කටයුතු
- ජාත්‍යන්තර මුහුදේ ක්‍රියාත්මක වන යාත්‍රා ලැයිස්තුව සකස් කිරීම, නඩත්තු කිරීම හා අදාළ ආයතන වෙත වාර්තා කිරීම.
- විදේශ රටවල ධීවර රැකියාවේ යෙදීමට දේශීය ධීවරයන්ට අනුමැතිය ලබා දීම
- විදේශ රටවලට දේශීය නිෂ්පාදිත යාත්‍රා අලෙවිය, පැවරීම කිරීමේදී අනුමැතිය ලබා දීම
- විශේෂිත ධීවර කළමනාකරණ ප්‍රදේශ හඳුනාගෙන ප්‍රකාශයට පත් කිරීම ඒ සම්බන්ධයෙන් අදාළ රෙගුලාසි සකස් කිරීම හා කළමනාකරණ සැපසුම් ක්‍රියාත්මක කිරීම
- ඉලක්කගත මත්ස්‍ය විශේෂ සම්බන්ධයෙන් තොග සමීක්ෂණය අධ්‍යයනයේ ප්‍රතිඵල අනුව කළමනාකරණ ක්‍රමවේද හඳුන්වා දීම හා ක්‍රියාත්මක කිරීම
- නීති විරෝධී ධීවර කර්මාන්තය වැළැක්වීම සඳහා වන ජාතික ක්‍රියාකාරකම් සැලැස්ම ක්‍රියාත්මක කිරීම
- මෝර මත්ස්‍ය කළමනාකරණය සම්බන්ධ කටයුතු අධීක්ෂණය කිරීම සහ ජාතික ක්‍රියාත්මක සැලැස්ම ක්‍රියාත්මක කිරීම
- විනෝදාත්මක කටයුතු සඳහා මසුන් ඇල්ලීම පිළිබඳ බලපත්‍ර නිකුත් කිරීම (Recreational fishing activity)
- අපනයන මත්ස්‍ය හා මත්ස්‍ය නිෂ්පාදන රේගු නිෂ්කාශන සඳහා ASYCUDA පද්ධතිය හරහා අනුමැතිය ලබා දීම

ධීවර හා ජලජ සම්පත් තිරසාර ලෙස කලමනාකරණය කිරීම හා විධිමත් කිරීම ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ මූලික කාර්යයක් වන අතර, ඒ සඳහා ධීවර යාත්‍රා, ධීවර මෙහෙයුම් වෙනුවෙන් කළමනාකරණ බලපත්‍ර නිකුත් කිරීම්, නීත්‍යානුකූල නොවන, අවිධිමත්, වාර්තා නොවන ධීවර කටයුතු වැළැක්විම සඳහා ක්‍රියාමාර්ග ගැනීම් සිදු කරන අතර 2024 වර්ෂයට අදාලව පහත සඳහන් පරිදි විවිධ ධීවර මෙහෙයුම් හා යාත්‍රා සඳහා බලපත්‍ර ලබා දී ඇත.

වගුව 10: 2024 වර්ෂයේ 2024.12.31 දිනට අදාලව එක් එක් කාර්යන්හි ප්‍රගතිය

අනු අංකය	ක්‍රියාකාරකම	අපේක්ෂිත ඉලක්කය	2024.12.31 දිනට ප්‍රගතිය
1	ධීවර යාත්‍රා ලියාපදිංචිය (නව)	2,000	2,895
2	මහ මුහුදේ යාත්‍රා මෙහෙයුම් බලපත්‍ර නිකුත් කිරීම	1,020	1,443
3	යාත්‍රා නියමු බලපත්‍ර නිකුත් කිරීම.	500	940
4	විසිතුරු මසුන් ආනයනය සඳහා බලපත්‍ර නිකුත් කිරීම	25	42
5	විසිතුරු මසුන් අපයනය සඳහා බලපත්‍ර නිකුත් කිරීම	30	43
6	විසිතුරු මසුන් ප්‍රතිඅපයනය සඳහා බලපත්‍ර නිකුත් කිරීම	15	32
7	කටු පොකිරිස්සන් අපනයනය සඳහා බලපත්‍ර ලබාදීම	80	58
8	කටු පොකිරිස්සන් ළඟතබා ගැනීම,ප්‍රවාහනය	10	15
9	හක්බෙල්ලන් ළඟ තබා ගැනීම, ප්‍රවාහනය සඳහා බලපත්‍ර ලබාදිම	80	82
10	හක්බෙල්ලන් අපනයනය සඳහා බලපත්‍ර ලබාදිම	40	48
11	මුහුදු කූඩැල්ලන් ඇල්ලීම, එකතු කිරිම, ළඟ තබා ගැනීම හා ප්‍රවාහනය සඳහා බලපත්‍ර ලබාදීම	200	193
12	මුහුදු කූඩැල්ලන් ආනයනය, අපනයනය, ප්‍රති අපනයනය සඳහා බලපත්‍ර ලබාදීම	150	134

13	සිප්පි කටු එකතු කිරීම ප්‍රවාහනය සහ විසිතුරු භාණ්ඩ නිෂ්පාදනය සඳහා බලපත්‍ර නිකුත් කිරීම	20	32
14	කෘතීම උපස්තර මත වගා කරන ලද කොරල් අපනයනය සඳහා බලපත්‍ර ලබාදීම	4	0
15	මසුන් හා මත්ස්‍ය නිෂ්පාදන ආනයනය සඳහා ලියාපදිංචි කිරීම	200	152
16	මසුන් හා මත්ස්‍ය නිෂ්පාදන අපනයනය සඳහා ලියාපදිංචි කිරීම	150	196
17	මසුන් හා මත්ස්‍ය නිෂ්පාදන ප්‍රතිඅපනයනය සඳහා ලියාපදිංචි කිරීම	13	10
18	නව යාත්‍රා සඳහා ලියාපදිංචි අංක වෙන්කිරීම, අනුමත කිරීම සහ නිකුත් කිරීම	IMUL-100	66
		OFRP-1000	1,704
		MTRB-250	191
		NTRB-500	1,256
		NBSB--0	0
19	නක්ලා (Operculum of Chicoreusramosus) අපනයනය කිරීම සඳහා බලපත්‍රය	15	09
20	නක්ලා (Operculum of Chicoreusramosus) සන්තකයේ තබාගැනීම, විකිණීම, ප්‍රදර්ශනය කිරීම සහ ප්‍රවාහනය කිරීම සඳහා අවසරපත්‍ර නිකුත් කිරීම	15	14
21	Chicoreusramosus මාංශ සන්තකයේ තබා ගැනීම, විකිණීම, ප්‍රදර්ශනය කිරීම සහ ප්‍රවාහනය කිරීම සඳහා අවසරපත්‍ර නිකුත් කිරීම	30	25
22	Chicoreusramosus මාංශ අපනයන බලපත්‍රය	15	19
23	අජීවී මුහුදු බෙල්ලන්ගේ කවච ප්‍රවාහනය කිරීම, සන්තකයේ තබා ගැනීම සහ ප්‍රදර්ශනය කිරීම සඳහා අවසරපත්‍ර නිකුත් කිරීම	20	7
24	මුහුදු තෘණ, ප්‍රවාහනය කිරීම සහ අපනයනය කිරීම සඳහා බලපත්‍රය නිකුත් කිරීම.	8	20
25	ලොග් පොත් නිකුත් කිරීම	1,000	1,400

3.2 මාදැල් වරායවල් GPS පාඨාංක සහතිව සිතියම්ගත කිරීම හා ආරවුල් විසඳීම

පාරම්පරික ධිවර කර්මාන්තයක් ලෙස ශ්‍රී ලංකාවේ වෙරළතීරයේ ක්‍රියාත්මක මාදැල් පැවති ස්ථාන විවිධ සංවර්ධන ව්‍යාපෘති සහ වෙරළ ඛාදනයන් හේතුවෙන් වෙනස්වීමට භාජනය වීම හේතුවෙන් ඇතිවන ගැටලු නිරාකරණය සඳහා GPS පාඨාංක සහතිව සිතියම්ගත කිරීම මිනින්දෝරු දෙපාර්තමේන්තුව සමග එක්ව සිදු කරන ලදි.

රූපය 05: මිනින්දෝරු දෙපාර්තමේන්තුව සමග එක්ව GPS පාඨාංක ලබා ගැනීම

3.3 ධීවර පනත පිළිබඳ දැනුවත් කිරීම

රූපය 06: ධීවර පනත පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත් වූ අයුරු

4.0 තත්ත්වපාලන අංශය

ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව සහ පාරිභෝගික ආරක්ෂාව සහතික කිරීම සඳහා ශ්‍රී ලංකාව සිය මත්ස්‍ය නිෂ්පාදන අපනයනය සඳහා දැඩි තත්ත්ව පාලන ක්‍රියා මාර්ගවලට ප්‍රමුඛත්වය ලබා දී ඇත. මත්ස්‍ය සහ මත්ස්‍ය නිෂ්පාදන අපනයන රෙගුලාසි යටතේ ඇති විධිවිධාන මගින් පාලනය වන මෙම ක්‍රියාවලිය සහතිකකිරීම, පරීක්ෂාකිරීම, සනීපාරක්ෂාව සහ සනීපාරක්ෂක පිළිවෙත් පිළිපැදීම ඇතුළත්වේ. සොයාගැනීමේ පද්ධති සහ රසායනාගාර පරීක්ෂණ තත්ත්ව සහතිකය තවදුරටත් ඉහළ නංවන අතර ධාරිතා ගොඩනැගීම මගින් කර්මාන්ත සේවකයින්ගේ කුසලතා වැඩිදියුණු ආදිය සිදුකරයි. වෙළඳපල ප්‍රවේශ අවශ්‍යතා සපුරා ලීමෙන් සහ නිෂ්පාදන අඛණ්ඩතාව පවත්වා ගැනීමෙන්, ගෝලීය වෙළඳපොලේ උසස් තත්ත්වයේ මුහුදු ආහාරවල විශ්වාසදායක මූලාශ්‍රයක් ලෙස ශ්‍රී ලංකාව සිය කීර්තිනාමය පවත්වා ගැනීම අරමුණු කරයි. මෙම දෙපාර්තමේන්තුවේ තත්ත්වපාලන අංශය ඉහත ක්‍රියාකාරකම් සිදුකිරීමේ වගකීම දරන අතර එම අංශයේ ප්‍රධාන කාර්යයන් පිළිබඳ විස්තර පහත දැක්වේ.

2014 වසරේ සිට කටුනායක බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපලේ තත්ත්වපාලන උපකාර්යාලය පිහිටුවන ලද අතර මෙම කාර්යාලය සතියේ දින හත පුරාවට දිවා රාත්‍රී දේශීය අපනයන කරුවන්ට සේවා සපයන (24X7) කාර්යාලය ලෙස ක්‍රියාත්මක වේ.

එයට අමතරව මේ වන විට දේශීය පාරිභෝගිකයා වෙත සෞඛ්‍ය ආරක්ෂිත මත්ස්‍ය හා මත්ස්‍ය නිෂ්පාදන ලබා දීම පිළිබඳ අපගේ අවදානය යොමු වී ඇති අතර ඒ සඳහා අවශ්‍ය මූලික වැඩ කටයුතු ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පියවර ගෙන ඇත.

4.1 ඉලක්කය

යුරෝපීය වෙළඳපොළට අපනයනය කරන මත්ස්‍ය නිෂ්පාදන සම්බන්ධයෙන් යුරෝපීය කොමිසම විසින් නියම කර ඇති අවශ්‍යතා සපුරාලීම සඳහා ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව යටතේ ස්ථාපිත කරන ලද මෙම අංශය 1999.01.04 දින සිට ක්‍රියාත්මකවූ අතර මේ වනවිට ශ්‍රී ලංකාව විසින් මත්ස්‍ය හා මත්ස්‍ය නිෂ්පාදන අපනයනය සිදු කරන සියලුම රටවල් සඳහා එම රටවල නිත්‍යානුකූල අවශ්‍යතා සපුරාලීමට අවශ්‍ය කාර්යභාරය ඉටු කිරීම සිදු කරයි.

4.2 අරමුණ

1998දී ප්‍රකාශයට පත් කරන ලද මත්ස්‍ය නිෂ්පාදන (අපනයන) රෙගුලාසි ක්‍රියාත්මක කිරීම යටතේ ශ්‍රීලංකාව විසින් මානව පරිභෝජනය සඳහා ජාත්‍යන්තර වෙළඳපොළට අපනයනය කරනු ලබන මත්ස්‍ය නිෂ්පාදනවල ගුණාත්මකභාවය හා සෞඛ්‍ය ආරක්ෂිතභාවය ඉහල නැංවීම මෙම අංශයේ ප්‍රධාන අරමුණවේ.

4.3 කාර්යයන්

ඉහත අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා තත්ත්වපාලන අංශය විසින් පහත සඳහන් ක්‍රියාකාරකම් සිදුකරනු ලැබේ.

- මත්ස්‍ය පිරිසැකසුම් ආයතන සඳහා අනුමැතිය ලබා දීම හා ඒවාට අදාල බලපත්‍ර නිකුත්කිරීම.
- මත්ස්‍ය පිරිසැකසුම් ආයතනවලට අපනයනය සඳහා මසුන් සකස් කිරීමට බලය ලබාදීම.
- HACCP ක්‍රමවේද විශ්ලේෂණ කිරීම හා එම ක්‍රමවේදයන් සඳහා අනුමැතිය ලබා දීම.
- මත්ස්‍ය පිරිසැකසුම් ආයතන නිරන්තරව පරීක්ෂාවට ලක් කිරීම හා නුසුදුසුතා නිවැරදි කිරීමට මග පෙන්වීම හා අවශ්‍ය කටයුතු කිරීම.
- මසුන් ගොඩබෑමේ ස්ථාන පරීක්ෂා කිරීම හා මත්ස්‍ය නිෂ්පාදන වල ගුණාත්මකභාවය හා සෞඛ්‍ය ආරක්ෂිතභාවය තහවුරු කිරීමට අවශ්‍ය පියවර ගැනීම.
- අපනයනය සඳහා මසුන් සපයන ධීවර යාත්‍රා පරීක්ෂා කිරීම හා මත්ස්‍ය නිෂ්පාදන වල ගුණාත්මකභාවය හා සෞඛ්‍ය ආරක්ෂිතභාවය තහවුරු කිරීමට අවශ්‍ය පියවර ගැනීම.
- මසුන් ගොඩබෑමේ ස්ථාන වල සිට සැකසුම් කම්හල් වෙත මසුන් ප්‍රවාහනය පරීක්ෂා කිරීම මත්ස්‍ය නිෂ්පාදන වල ගුණාත්මකභාවය හා සෞඛ්‍ය ආරක්ෂිතභාවය තහවුරු කිරීමට අවශ්‍ය පියවර ගැනීම.
- අපනයනය සඳහා එක් එක් මත්ස්‍ය තොග/ ධීවර නිෂ්පාදන තොග සඳහා සෞඛ්‍ය සහතික නිකුත් කිරීම.
- අපනයනය කරනු ලබන මත්ස්‍ය නිෂ්පාදන වල සෞඛ්‍ය ආක්ෂිතභාවය තහවුරු කරන පරීක්ෂණ වාර්තා (Test Report) නිකුත් කරනු ලබන පරීක්ෂණාගාර අනුමත කිරීම.
- අදාල ස්ථාන වලින් ලබාගත් සාම්පල අනුමත පරීක්ෂණාගාර වලදි පරීක්ෂා වට ලක්කිරීම පිණිස නිල සාම්පල පරීක්ෂා වැඩසටහන ක්‍රියාත්මක කිරීම.
- මසුන් සැකසීමේ ස්ථාන, බෝට්ටු හා මසුන් ගොඩ බාන ස්ථාන රෙගුලාසියේ අඩංගු අදාල කොන්දේසි වලට අනුකූල නොවන අවස්ථාවලදී ඒ සම්බන්ධව නිසි පියවර ගැනීම.
- අපනයනය කරනු ලබන මත්ස්‍ය නිෂ්පාදනවල අනාරක්ෂිත සෞඛ්‍ය තත්ත්වයන් පිළිබඳ ආනයනික රටවලින් ලැබෙන පැමිණිලි සම්බන්ධයෙන් අදාල පියවර ගැනීම.
- මත්ස්‍ය හා මත්ස්‍ය නිෂ්පාදන වල ගුණාත්මකභාවය හා සෞඛ්‍ය ආරක්ෂිතභාවය මෙන්ම අපනයනය සඳහා මසුන් සපයන ධීවර යාත්‍රාවල කාර්යය මණ්ඩල සඳහා මත්ස්‍ය පරිහරණය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් සංවිධානය කිරීම හා ක්‍රියාත්මක කිරීම.
- ජලජ ජීවි වගා නිෂ්පාදන (මසුන්,ඉස්සන්) සඳහා භාවිතා වන ප්‍රතිජීවක බෙහෙත් වර්ග හා රසායනික ද්‍රව්‍ය පාලනය කිරීම පිණිස ජල ජීවී වගා අවශේෂ අධීක්ෂණ වැඩසටහන ක්‍රියාත්මක කිරීම හා එම වැඩසටහන යටතේ දැනුවත් කිරීමේ වැඩසටහන් සංවිධානය කිරීම.
- මත්ස්‍ය නිෂ්පාදන වල නිත්‍යානුකූලභාවය තහවුරු කිරීම සඳහා මසුන් ඇල්ලීමේ සහතික නිකුත් කිරීම.
- සතියේ දින හතම තුල පැය 24 පුරා ක්‍රියාත්මක වන කටුනායක ගුවන්තොටුපොළ තත්ත්ව පාලන උප කාර්යාල මගින් යුරෝපා රටවල් සඳහා මාර්ගගත ක්‍රමවේදය යටතේ ස්වස්ථතා සහතික නිකුත් කිරීම.
- රෙගුලාසින්ට අනුගත නොවන අවස්ථා සඳහා නීතිමය ක්‍රියාමාර්ග ගැනීම සහ ආනයනය කරන රටවල් විසින් කරන ලද දැනුම් දීම් සම්බන්ධයෙන් විමර්ශන සිදුකිරීම.

4.4 ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ අනුමත මත්ස්‍ය සැකසුම්ආයතන

යුරෝපා කොමිසමට අයත් රටවලට අපනයනය සඳහා අනුමත මත්ස්‍ය සැකසුම් ආයතන සංඛ්‍යාව -50

යුරෝපා කොමිසමට අයත් නොවන රටවලට පමණක් අපනයනය සඳහා අනුමත මත්ස්‍ය සැකසුම් ආයතන සංඛ්‍යාව -23

මත්ස්‍ය ඇසුරුම් කටයුතු සඳහා අනුමත ආයතන සංඛ්‍යාව -21

4.5 ක්‍රියාකාරකම් පරීක්ෂා කිරීම සහ අධීක්ෂණය කිරීම සහ නිල සාම්පල් වැඩසටහන ක්‍රියාත්මක කිරීම

මේ යටතේ මත්ස්‍ය නිෂ්පාදන පිරිසැකසුම් ආයතන, ඉස්සන් වගා ගොවිපළ, පරීක්ෂණාගාර, ධීවර වරායන්, අපනයනය සඳහා අමුද්‍රව්‍ය සපයන ධිවර යාත්‍රා පරීක්ෂා කිරීම සහ මත්ස්‍ය නිෂ්පාදන වල සෞඛ්‍ය ආරක්ෂිත භාවය තහවුරු කිරීම සඳහා නිල සාම්පල වැඩසටහන ක්‍රියාත්මක කිරීම අයත් වේ.
ක්ෂුද්‍ර ජීවි විද්‍යා පරීක්ෂණ: ජලය, අයිස් සහ මසුන් සඳහා

රසායනික පරීක්ෂණ: මසුන්ගේ හිස්ටමීන් ප්‍රමාණය/බැරලෝහ/ආදේශක රසායනික

4.6 වගා රසායනික අවශේෂ අධීක්ෂණ ජාතික වැඩසටහන ක්‍රියාත්මක කිරීම

මේ යටතේ 2002 වසරේ ප්‍රකාශිත ජලජීවී වගා අවශේෂ අධික්ෂණ රෙගුලාසිය ක්‍රියාත්මක කිරිමට අදාල අධික්ෂණ, පරීක්ෂණ සාම්පල ලබාගැනීම සහ විශ්ලේෂණද නීතිමය පියවර ගැනීමද සිදුවේ. ඉස්සන් අභිජනන මධ්‍යස්ථාන වල ජලසාම්පල ලබාගෙන මෙම වැඩසටහන ක්‍රියාත්මක කරයි.

සාම්පල පරීක්ෂා සිදුකරන පරාමිතීන්

- ප්‍රතිජීවක ඖෂධ
- දූෂක ද්‍රව්‍ය (බැරලෝහ කාබමේට්, පයිරත්‍රෝයිඩ්)
- කෘමිනාශක අවශේෂ
- වර්ණක (මැලකයිට්ග්‍රීන්, ලියුකොමැලකයිට්, බ්‍රිලියන්ට් ග්‍රීන්,ක්‍රිස්ටල් වයලට්)

4.7 දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම

මේ යටතේ මසුන්ගේ හා මත්ස්‍ය නිෂ්පාදනවල ගුණාත්මකභාවය හා සෞඛ්‍ය ආරක්ෂිතභාවය ආරක්ෂා කිරීම පිළිබඳව අදාල පාර්ශවකරුවන් දැනුවත් කිරීමේ වැඩසටහන් සිදුකිරීම ප්‍රධාන වශයෙන් සිදුවේ.

වගුව 11: 2024 වර්ෂයේ 2024.12.31 දිනට අදාලව තත්ත්ව පාලන අංශයේ කටයුතුවල ප්‍රගතිය

කාර්යය	**වාර්ෂික ඉලක්කය**	**ප්‍රගතිය**	**ප්‍රතිශතය%**
දේශීය වෙළඳපලෙහි ඇති මත්ස්‍ය නිෂ්පාදනයන්ගේ සෞඛ්‍යාරක්ෂිතභාවය හා ගුණාත්මකභාවය තහවුරු කිරීම			
01.වරාය පරීක්ෂණ සිදු කිරීම.	10	1	10%
02.මත්ස්‍ය වෙන්දේසි පොළවල් සහ පොදු මත්ස්‍ය වෙළඳ සැල් පරීක්ෂණ සිදු කිරීම.	4	1	25%
03.දැනුවත් කිරීමේ වැඩසටහන් (ධීවර කාර්මිකයන්/වෙළෙඳුන්)	10	6	60%
අපනයන මත්ස්‍ය නිෂ්පාදනයන්ගේ සෞඛ්‍යාරක්ෂිතභාවය හා ගුණාත්මකභාවය තහවුරු කිරීම			
01.නිල සාම්පල ලබා ගැනීම -ආයතන	300	81	27%
02.දැනුවත් කිරීමේ වැඩසටහන් (තත්ත්ව පාලන නිලධාරීන් /අදාල ක්ෂේත්‍ර නිලධාරීන්)	10	5	50%
03.දැනුවත් කිරීමේ වැඩසටහන් (ජලජීවී වගාකරුවන්/පිරිසැකසුම් ආයතන නිලධාරීන්/ධීවර කාර්මිකයන්)	10	4	40%
04.ධිවර වරාය වල සෞඛ්‍යාරක්ෂිතභාවය සහ සනීපාරක්ෂාව පිළිබඳ පරීක්ෂාකිරීම.	20	1	5%
05.ධිවර යාත්‍රාවල වල සෞඛ්‍යාරක්ෂිතභාවය, සනීපාරක්ෂක තත්ත්ව හා යහපත් පරිහරන ක්‍රම පිළිබඳ පරීක්ෂා කිරීම.	85	15	17.6%

06.අපනයනය සඳහා මත්ස්‍ය පිරිසැකසුම් සිදුකෙරෙන ආයතන පරීක්ෂාව.	සිදුකිරීමට අපේක්ෂිත ආයතන පරීක්ෂා සංඛ්‍යාව	120	85	70.8%
	සිදුකිරීමට අපේක්ෂිත ඇසුරුම් /පොකිරිස්සන් එකතු කරන මධ්‍යස්ථාන පරීක්ෂා සංඛ්‍යාව	15	4	26.67%
07.රසායනාගාර පරීක්ෂා කටයුතු සිදු කිරීම.		5	1	20%
08.අභිජනන මධ්‍යස්ථාන, මිරිදිය ජලජීවී වගා ගොවිපල සහ කිවුල්දිය, සමුද්‍රජීවී වගාබිම් පිළිබඳ පරීක්ෂා කිරීම		40	15	37.5 %
09.ජලජීවී වගා රසායන අවශේෂ පිළිබඳ සිදුකරන රසායනාගාර පරීක්ෂණ		යුරෝපා කොමිසම සහ එක්සත් රාජධානිය මඟින් නිර්දේශිත සැලැස්මට අනුකූලව වාර්ෂිකව තීරණය වේ.	56	
10.ගොඩබෑමේදී/ පිරිසැකැස්මේදී ඉන්ද්‍රීය විභාජක පරීක්ෂා		70	19	27.14%
11.කලාපීය ධීවර කළමනාකරණ සංවිධානයන් මඟින් ස්ථාපිත සංඛ්‍යාලේඛන දත්ත වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.		අවස්ථානුකූව	2	-
12.අපනයන මත්ස්‍ය නිෂ්පාදනයන් සඳහා නිල සාම්පල වැඩසටහන අනුව සිදුකල පර්යේෂණ ප්‍රතිඵළ ප්‍රමිතීන්ට අනුකූල නොවන අවස්ථා සඳහා ගනු ලබන නීත්‍යානුකූල ක්‍රියාමාර්ග ගැනීම.		ප්‍රතිඵල වල පාරාමිතීන්ගේ සම්මත අගයන් ඉක්මවා යාම සිදු වුවහොත් අවස්ථානුකූව	1	-
13.ආනයනික රටවල් (Importing countries) මඟින් මත්ස්‍ය නිෂ්පාදනවල නුසුදුසුතා පිළිබඳව සිදුකරන දැනුම් දීම.		අදාල රටවලින් නුසුදුසුතා දැනුම් දෙන වාර ගණන අනුව අවස්ථානුකූව	12	-
14.අපනයනය සඳහා මත්ස්‍ය නිෂ්පාදන පිරිසැකසුම් ආයතන අනුමත කිරීම.	නව මත්ස්‍ය නිෂ්පාදන පිරිසැකසුම් ආයතන අනුමත කිරීම.	63	5	-
	මත්ස්‍ය නිෂ්පාදන පිරිසැකසුම් ආයතන ලියාපදිංචිය යාවත්කාලීන කිරීම.		60	-
15.මසුන් ඇල්ලීමේ සහතික නිකුත් කිරීම.		17,000	16,832	99%
16.අපනයනය සඳහා ස්වස්ථතා සහතික නිකුත් කිරීම. (යුරෝපා රටවල් සඳහා)		18,000	13,636	75.7%
17.අපනයනය සඳහා ස්වස්ථතා සහතික නිකුත් කිරීම. (යුරෝපා නොවන රටවල් සඳහා)		10,000	12,574	125.74%
18.ප්‍රති අපනයනය සඳහා ආනයනය කරන ලබන මත්ස්‍ය තොග පිළිබඳව පරීක්ෂණසිදු කිරීම. (BIA)		ප්‍රති අපනයනය සඳහා මසුන් ආනයනය කිරීමට ඉල්ලීම් කිරීමත් අනුමැතීන් ලබා දීමත් මත අවස්ථානුකූව	1	-
19.යුරෝපා කොමිසම සහ අනෙකුත් රටවල අදාල නිසි බලධාරී ආයතන (Competent Authorities) සමඟ අවශ්‍ය සම්බන්ධීකරණය පවත්වාගෙන යාම සඳහා ආනයනික රටවල් මඟින් සිදුකරන දැනුම්දීම් මඟින් හෝ විදේශවල පිහිටුවා ඇති ශ්‍රීලංකා තානාපති කාර්යාල වලින් කෙරෙන විමසීම.		සිදු කරන ඉල්ලීම් අනුව අවස්ථානුකූව	34	-

4.8 ටින් මාළු කර්මාන්තය නියාමනය කිරීම

වර්තමානයේ ශ්‍රී ලංකාව තුල ප්‍රචලිත වෙමින් පවතින ටින් මලු කර්මාන්තය අගය වැඩි කිරීම නිෂ්පාදනයක් ලෙස සැලකිය හැකි අතර එය දිගින් දිගටම ඉල්ලුම වැඩිවන ප්‍රෝටීන් වලින් ඉහල ටුනා, සාඩින් හා මැකරල් මත්ස්‍ය විශේෂ යොදා ගනිමින් දිගු කාලයක් කල් තබා ගත හැකි පසසුවෙන් සකස්කර ගත හැකි නිෂ්පාදනයකි. ශ්‍රී ලංකවේ මෙම ටින් මාළු වෙළද පොල සම්පුර්ණයෙන්ම ආනයන වෙළද පොළ මත රදා පවතින අතර මේ වන විට මෙය දේශීය කර්මාන්තයක් බවට පත් කර ගැනීමට අවශ්‍ය පියවර ගනිමින් සිටි. දැනට ටින් මාළු නිෂ්පාදන කිරීම සඳහා දායකත්වය ලබා දෙන දේශීය ව්‍යාපාරිකයින් 30 දෙනෙකු පමණ හදුනා ගෙන එම නිෂ්පාදන වල සෞඛ්‍ය ආරක්ෂිතභාවය හා ගුණාත්මකභාවය ඉහල නැංවීමේ මුලික කටයුතු අප අංශයේ මැදිහත් වීමෙන් ආරම්භ කර ඇත. ඒ අනුව ටින් මාළු ආනයනය සඳහා වැය වන විදේශ සංචිත අප රට තුල රදවා ගැනීමට අපේක්ෂිතය.

රූපය 07: චීන සමුහාණ්ඩුව මගින් මාර්ගගත ක්‍රමයට පවත්වන ලද තත්ත්ව පාලන විසඹන ක්‍රියාවලිය

4.9 ආනයනික රටවල් මගින් සිදු කරනු ලබන විශේෂ පරීක්ෂණ කටයුතු සඳහා පෙනී සිටීම.

එමෙන්ම, මත්ස්‍ය අපනයනය සඳහා පවතින නව වෙළඳපොළ ගවේෂණය කර ජාත්‍යන්තර මට්ටමින් නව අපනයන පිවිසුම් අප රටට ලබාදීමට කටයුතු සම්පාදනය කරනු ලබන්නේද තත්ත්ව පාලනඅංශය මගිනි. එසේ නව මත්ස්‍ය අපනයන පිවිසුමක් ලෙස චීන සමුහාණ්ඩුව, ඔවුන්ගේ වෙළඳපොල, ලාංකීය සියලු මත්ස්‍ය නිෂ්පාදන සඳහා විවර කර දීමට පැවති මාර්ග ගත විගණන ක්‍රියාවලියට අතිසාර්ථකව මුහුණ දෙමින් එම නව අපනයන අවස්ථාව අප රටට ලබාගැනීමට මහඟු සේවයක් අප අංශය මගින් ඉටු කරන ලදී.

රූපය 08: චීන සමූහාණ්ඩුව මගින් මාර්ගගත ක්‍රමයට පවත්වන ලද තත්ත්ව පාලන විගණන ක්‍රියාවලිය

4.10 තත්ත්වපාලන උපකාර්යාලය -කටුනායක ජාත්‍යන්තර ගුවන් තොටුපල

2014 ජනවාරි 13 වන දින කටුනායක බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපලේ තත්ත්වපාලන උපකාර්යාලය පිහිටුවන ලදී. මෙම කාර්යාලය සතියේ දින හත පුරාවට දිවා රාත්‍රී සේවය සපයන (24X7) කාර්යාලය ලෙස මත්ස්‍ය හා මත්ස්‍ය නිෂ්පාදන අපනයන කරුවන් වෙත සේවා සපයන ආයතනයක් ලෙස ක්‍රියාත්මක වේ.

දේශීය මත්ස්‍ය නිෂ්පාදන අපනයන කරුවන්ගේ බලවත් ඉල්ලීමකට අනුව කටුනායක තත්ත්ව පාලන උප කාර්යලය පුළුල් කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලද අතර ඒ අනුව තත්ත්ව පාලන අංශය උප කාර්යාල රාජකාරි පුළුල් කරමින් පවත්වා ගෙන යෑමට හැකි පරිදි 2024-01-26 දින නව පරිශ්‍රයක ස්ථාපිත කරන ලදී. මෙම නව කාර්යාලය විවෘත කිරීමට ධීවර දෙපාර්තමේන්තුව පියවර ගැනීම තුලින් මත්ස්‍ය නිෂ්පාදන සඳහා නිකුත් කරන සවස්තා සහතික බාධාවකින් තොරව සතියේ දින හත තුල පැය 24 පුරා දිවා රාත්‍රී අඛන්ඩ සේවයක් සැපයීම තුලින් අපනයනකරුවන් දිරි ගන්වා විදේශ විනිමය ඉපයීම් ඉහල නැවීම අරමුණු කර ගෙනඇත.

මෙම කාර්යාලය ධිවර අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් ධීවර රාජ්‍ය අමාත්‍ය, ධීවර අමාත්‍යාංශයේ ලේකම්තුමිය, ධීවර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා සහ අපනයනකරුවන්ගේ නියෝජිතයන්ගේ සහභාගිත්වයෙන් පවත්වන ලදී.

ආරම්භයේදී යුරෝපා කොමිසමේ රටවලට අපනයනය කරන මත්ස්‍ය නිෂ්පාදනවල නීත්‍යානුකූලභාවය තහවුරුකිරීම සඳහා මසුන් ඇල්ලීමේ සහතික සත්‍යයෝක්ෂණය කිරීම පමණක් මෙම කාර්යාලය මගින් සිදුකල අතර මේ වනවිට අදාල අපනයනය කරන සියලුම මත්ස්‍ය තොග සඳහා අවශ්‍ය ස්වස්ථා සහතික හා ඇල්ලීමේ සහතික මෙම කාර්යාලය මගින් සතියේ දින හත තුල ලබා ගැනීමට හැකි වන පරිදි පහසුකම් සපයා ඇත.

5. විමර්ශන හා පුහුණු අංශය

5.1 ධීවර ප්‍රජාව, ධීවර නිළධාරී හා අනෙකුත් පාර්ශවකරුවන්ගේ මනා සබඳතාවයක් ගොඩනැඟීම

ශ්‍රී ලංකාවේ ධීවර කර්මාන්තය නීති විරෝධී, අවිධිමත් හා වාර්තා නොවන ධීවර කටයුතු වලින් තොරව, ධීවර සම්පතෙහි තිරසාර පැවැත්ම තහවුරු කිරීම සඳහා 1996 අංක 02 දරණ ධිවර හා ජලජ සම්පත් පනත හා ඒ යටතේ පනවා ඇති රෙගුලාසි ක්‍රියාත්මක කිරීම විමර්ශන අංශයේ ප්‍රමුඛතම කාර්යය වේ.

නව තාක්ෂණය යොදා ගනිමින් ජාත්‍යන්තර සාගර නීති සහ සම්මුතීන්ට අනුකූලව සම්පත් කළමනාකරණය තුළින් ශ්‍රී ලංකා ජාතික ආර්ථිකයට ඵලදායි දායකත්වයක් ලබාදීම සඳහා ධීවර කර්මාන්තය තිරසාර ලෙස සංවර්ධනය කිරීමත් අරමුණ වේ.

අනාගත පරපුර සඳහා ධීවර සම්පත් ආරක්ෂා කර ගැනීම උදෙසා ධීවර ප්‍රජාව, ධීවර ක්ෂේත්‍රය නියාමනය සිදු කරන ධීවර නිළධාරීන් සහ ධීවර ක්ෂේත්‍රයට අදාලවන අනෙකුත් පාර්ශවකරුවන් දැනුවත් කිරීම සහ පුහුණු කිරීම මෙහි පුහුණු අංශයේ කාර්යභාරය වේ.

වගුව 12: විමර්ශන හා පුහුණු අංශය 2024 -ජනවාරි මස සිට දෙසැම්බර් මස දක්වා ප්‍රගතිය

අනු අං	ක්‍රියාකාරකම	ඉලක්කය	ප්‍රගතිය
1	දිස්ත්‍රික් මට්ටමේ වැටලීම් සහ නීති විරෝධී ධීවර කටයුතු වලට එරෙහි විමර්ශන හා නෛතික කටයුතු සුපරීක්ෂණය	නිශ්චිත ඉලක්ක ලබාදිය නොහැක	යාවත්කාලින දත්ත වාර්තාව සක්‍රියව පවත්වා ගෙන යනු ලැබේ
2	පරිපාලන දඩ පැනවීම සඳහා සියළු දිස්ත්‍රික් කාර්යාල වලින් යොමු වන ඉල්ලීම්, අදාලක්‍රි යාවලියට අනුව , ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව විසින් පරිපාලන දඩ පැනවීමේ ක්‍රමවේදය සකස් කිරීම.		37
3	තහවුරුවන නීති විරෝධී කටයුතු වලට එරෙහිව අධිකරණයේ නඩු පැවරීම.		0
4	යාත්‍රා නිරීක්ෂණ පද්ධතිය මඟින් හඳුනාගන්නා ලද නීති කඩ කිරීම සඳහා වන විමර්ශන කටයුතුසිදු කිරීම.		800
5	විශේෂ වැටලීම් සිදු කිරීම.	15	0
6	ධීවර යාත්‍රා, වරාය, ධීවර ආම්පන්න, නිෂ්පාදන සහ ධීවර ඇම සැපයුම් ආයතන සම්බන්ධ පරික්ෂා කිරීම් සහ විමර්ශන කටයුතු.	36	16
		නිශ්චිත ඉලක්ක ලබාදිය නොහැක	0
7	අදාල පාර්ශවකරුවන්(STAK HOLDER) සඳහා ධීවර නීතිය සහ නීත්‍යානුකූල ධීවර යෙදවුම් පිළිබඳව දැනුවත් කිරීම් සිදු කිරීම.	4	9
8	දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සහ ධීවර කාර්මිකයන් දැනුවත් කිරීම සඳහා වාර්ෂික පුහුණු සැලැස්ම සකස්කිරීම.	1	වාර්ෂික පුහුණු කිරීමේ සැලැස්ම සකස් කර ඇත
9	දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන් සහ ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවිධානය කිරීම.	40	32
10	දිස්ත්‍රික් මට්ටමින් සිදු කරන ධීවර කාර්මික දැනුවත් කිරීම් සංවිධානය කිරීම.	15	118
11	දෙපාර්තමේන්තුවේ නිළධාරීන් බාහිර ආයතන වල පැවැත්වෙන පුහුණු වැඩසටහන් /පශ්චාත් උපාධිඩිප්ලෝමා / පාඨමාලා වෙත යොමු කිරීම.	10	17
12	විශ්ව විද්‍යාල/කාර්මික විද්‍යාල සිසුන් සඳහා කර්මාන්ත ක්ෂේත්‍ර පුහුණුව ලබාදීම සම්බන්ධ බාහිර අධීක්ෂක ලෙස ක්‍රියාකිරීම	5	4
13	පුහුණු වැඩසටහන් සම්බන්ධ ප්‍රතිපෝෂණය හා විශ්ලේෂණය.	20	0

5.2 ධීවර යාත්‍රා, වරාය, ධීවර ආම්පන්න, නිෂ්පාදන සහ ධීවර ඇම සැපයුම් ආයතන සම්බන්ධ පරික්ෂා කිරීම්

රූපය 09: ධීවර යාත්‍රා, වරාය, ධීවර ආම්පන්න, නිෂ්පාදන සහ ධීවර ඇම සැපයුම් ආයතන පරීක්ෂා කරන අයුරු

5.3 අදාල පාර්ශවකරුවන් (stake holder) සඳහා ධීවර නීතිය සහ නීත්‍යානුකූල ධීවර යෙදවුම් පිළිබඳව දැනුවත් කිරීම් සිදු කිරීම.

රූපය 10: මහනුවර තලාතුඔය ශිල්ප නාවික හමුදා කඳවුරෙහි පුහුණු නාවික හමුදා නිළධාරී කණ්ඩායම් සඳහා පැවැත්වූ වැඩසටහන් 2024.08.06 /2024.03.27 -

රූපය 11: දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන් සහ ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවිධානය කිරීම

රූපය 12: මැදවච්චිය, පූනෑව, ශික්ෂා නාවික හමුදා කඳවුරෙහි පුහුණු නාවික හමුදා නිළධාරීන් සඳහා පැවැත්වූ වැඩසටහන 2024.09.09 -

5.4 දිස්ත්‍රික් මට්ටමින් සිදු කරන ධීවර කාර්මික දැනුවත් කිරීම් සංවිධානය කිරීම

රූපය 13: හලාවත ධීවර දිස්ත්රික්කයේ ධීවර කාර්මික දැනුවත් කිරීම

රූපය 14: මීගමුව ධීවර දිස්ත්‍රික්කයේ ධීවර කාර්මික දැනුවත් කිරීම

රූපය 15: බේරුවල ධීවර දිස්ත්‍රික්කයේ ධීවර කාර්මික දැනුවත් කිරීම

රූපය 16: වෙල්ලමංකර ධීවර දිස්ත්‍රික්කයේ ධීවර කාර්මික දැනුවත් කිරීම

6.0 තොරතුරු තාක්ෂණ අංශය

6.1 අරමුණ

මෙම අංශයේ ප්‍රධාන පරමාර්ථය වන්නේ ධීවර සම්පත් කළමනාකරණය කිරීම සඳහා මාර්ගගත යෙදුමක් ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාමයි. දෙපාර්තමේන්තු ජාලය නඩත්තුකිරීම, මාර්ගගත යෙදුම් පද්ධතිය ක්‍රියාත්මක කිරීම, අදාළ දෘඩාංග හැසිරවීම, පුළුල් දත්ත විශ්ලේෂණය හා වාර්තා කිරීම, තොරතුරු තාක්‍ෂණය පිළිබඳ පුහුණුව ප්‍රධාන අවධානය යොමු කළයුතු අංශවේ.

6.2 ප්‍රධාන ක්‍රියාකාරකම්

- දෙපාර්තමේන්තු සේවාදායකයන් තුළ දෙපාර්තමේන්තු ජාල මෘදුකාංග ක්‍රියාත්මක කිරීම.
- දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියේ නඩත්තුව සහ අන්තර්ගත කළමනාකරණය.
- දෙපාර්තමේන්තු ජාලය සහ මූලික තොරතුරු තාක්ෂණය පිළිබඳ නිලධාරී පුහුණුව.
- ඊ- ලොග් පද්ධතියේ භාවිතය වැඩිදියුණු කිරීම සඳහා ඊ කණ්ඩායම් අධීක්ෂණය සහ සහායදීම.
- ගතික වාර්තාකරණ පද්ධතිය හඳුන්වාදීම සහ ක්‍රියාත්මක කිරීම.
- දත්ත විශ්ලේෂණය සඳහා R භාෂාවේ භාවිතය වැඩිදියුණු කිරීම.
- දෙපාර්තමේන්තුව සඳහා දෘඩ පද්ධතිය නඩත්තු කිරීම.
- කාර්යමණ්ඩල පාදක නිරීක්ෂක පද්ධතිය ක්‍රියාත්මක කිරීම
- දෙපාර්තමේන්තු පරිගණක දෘඩාංග හා මෘදුකාංග නඩත්තු කිරීම.
- විවෘත මෙහෙයුම් පද්ධතියක් සහ යෙදුම් හඳුන්වාදීම.
- R සංඛ්‍යාලේඛන පිළිබඳ නිලධාරීන් 20 දෙනෙකු පුහුණු කිරීම.
- විවෘත මෙහෙයුම් පද්ධතිය සහ යෙදුම හඳුන්වාදීම.
- නව යාත්‍රා නිරීක්ෂණ පද්ධතිය හඳුන්වාදීම හා එය බහුදින යාත්‍රා 4,800 ක් පමණ සවිකර අවසන් කිරීම. ප්‍රධාන කාර්යාලයෙන් සහ ධීවර කාර්යාල වලින් නිරතුරුව එය අධීක්ෂණය කිරීමේ කටයුතු සැලසීම.

6.3 දෙපාර්තමේන්තුවේ සේවාවන් ජාලගත මෘදුකාංගය මගින් ක්‍රියාත්මක කිරීම.



රූපය 17: නිල වෙබ් අඩවිය

දෙපාර්තමේන්තු ජාල මෘදුකාංගය සංවර්ධනය කරනුයේ දෙපාර්තමේන්තුවේ ක්‍රියාදාමයන් 30 කට වැඩි ප්‍රමාණයක් ඩිජිටල් ක්‍රියාවලියක් බවට පරිවර්තනය කිරීමටයි.

ධීවරයින් ලියාපදිංචි කිරීම, බෝට්ටු ලියාපදිංචි කිරීම, විද්‍යාත්මක දත්ත එක්රැස් කිරීම යනාදිය හා තවත් බොහෝ ක්‍රියාදාමයන් ඊට ඇතුළත්ය. දෙපාර්තමේන්තු ජාල මෘදුකාංගයට ප්‍රධාන අංග දෙකක් ඇත, ඇන්ඩ්‍රොයිඩ් යෙදුම සහ ජාවා යෙදුම එම ප්‍රධාන අංගයන් වේ. ජාවා යෙදුම දැනට දෙපාර්තමේන්තු සර්වර් පද්ධතිය තුළ ක්‍රියාත්මක වන අතර එය http://msdfar.com භාවිතයෙන් ප්‍රවේශවිය හැකිය.ඇන්ඩ්‍රොයිඩ් යෙදුම දැනටමත් ස්මාර්ට් උපාංග 500කට වඩා ස්ථාපනය කර ඇති අතර අනුවාද යාවත්කාලීන කිරීම් කිහිපයක් සිදු කර ඇත. දෙපාර්තමේන්තු ජාල මෘදුකාංගය භාවිතා කරමින් ධීවරයින් 42,000 ක්, යාත්‍රාංගන 99ක් (පැරණි දත්ත ඇතුළුව), බෝට්ටු 7,000කට වැඩි ප්‍රමාණයක්, නියමුවන් 7,300ක් දැනටමත් ලියාපදිංචි කර ඇති අතර මෙහෙයුම් බලපත්‍ර 7,000කට වැඩි ප්‍රමාණයක් නිකුත්කර ඇත. 2022 වර්ෂය සඳහා මාර්ගගත පිටත්කිරීමේ පද්ධතිය හරහා මාර්ගගත පිටත්කිරීම් 107,000කට වැඩි ප්‍රමාණයක් සිදුකරනලදී. මෙම ක්‍රියාවලිය 2021 වර්ෂයේ සිට අඛණ්ඩව සිදුකරමින් පවතී. 2022 වර්ෂයේ හොඳම ජාලගත මෘදුකාංගය ලෙස MSDFAR පද්ධතිය සඳහා ජාලගත මෘදුකාංග භාවිතා කරන රාජ්‍ය ආයතන තේරීමේ තරගාවලියෙන් රන් පදක්කමක් ද, 2024 රාජ්‍ය සේවා හොඳම නව්‍ය නිෂ්පාදනය/ ව්‍යාපෘතිය තේරීමේ තරඟාවලියෙන් දෙවන ස්ථානය ද හිමි විය.

6.4 දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියේ නඩත්තුව සහ අන්තර්ගත කළමනාකරණය. www.fisheriesdept.gov.lk.

රූපය 18: නිල වෙබ් අඩවිය

දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියේ නඩත්තුව සහ අන්තර්ගත කළමනාකරණය පිළිබඳ තොරතුරු තාක්ෂණ අංශය වගකීම දරයි. දෙපාර්තමේන්තු වෙබ් අඩවිය දිනපතා යාවත් කාලීන වන අතර දෙපාර්තමේන්තු ක්‍රියාදාමයන් පිළිබඳ විස්තර ඇතුළත් වේ. දෙපාර්තමේන්තුවේ සෑම අංශයකටම තමන්ගේම පිටුවක් ඇති අතර එහි එම අංශය වගකිවයුතු ක්‍රියාකාරකම් ඇතුලත් කර තිබේ. නිලධාරීන්ගේ සම්බන්ධතා තොරතුරු වෙබ් අඩවියෙන් ලබාගත හැකි අතර ඒවා නිරන්තරයෙන් යාවත්කාලීන වේ. සියලුම ලියාපදිංචි අපනයනකරුවන්, ආනයනකරුවන්, අංගන සහ සැපයුම්කරුවන්ගේ ලැයිස්තුව වෙබ් අඩවිය තුළ පවත්වාගෙන යනු ලබන අතර එය යාවත්කාලීන වේ. වෙබ් අඩවියේ ඇති ප්‍රවේශය හරහා නිලධාරීන්ට දෙපාර්තමේන්තුවේම සියලුම පද්ධතියනට ප්‍රවේශවිය හැකිය. දෙපාර්තමේන්තු වෙබ් අඩවිය හොඳම සිංහල වෙබ් අඩවිය සඳහා රන් පදක්කම සහ 2020 හොඳම වෙබ් තරඟයේ හොඳම රජයේ වෙබ් අඩවිය සඳහා කුසලතා ත්‍යාගය දිනාගත්තේය.

6.5 දෙපාර්තමේන්තු නිලධාරීන්ගේ ජාලගත මෘදුකාංගය භාවිතය පිළිබද ඇගයීම.

දෙපාර්තුමේන්තු ජාලගත මෘදුකාංග (MSDFAR) පද්ධතිය භාවිතා කරමින් සිය රාජකාරීන් ඉටු කළ නිලධාරීන් සඳහා ඇගයීමක් ලෙස ලකුණු ලබා දීමේ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කළ අතර ඉන් වැඩි ලකුණු ලබාගත් නිලධාරීන් සඳහා දිරිගැන්වීමක් ලෙස නවතම වර්ගයේ ටැබ්ලට් යන්ත්‍ර ලබාදෙන ලදි. ඒ මගින් සියලුම නිලධාරීන් මෙම පද්ධතිය ඔස්සේ රාජකාරී ඉටු කිරීමට යොමු කරවන ලදි.

6.6 දෙපාර්තමේන්තු නිලධාරීන්ගේ ජාලගත මෘදුකාංග භාවිතය පිළිබදව නිලධාරී පුහුණුව.

ධීවර දිස්ත්‍රික්ක 15 හි මෘදුකාංග පද්ධතිය ක්‍රියාත්මක කරන ආකාරය වෙන වෙනම නිරීක්ෂණය කරන අතර ඒ සඳහා අප අංශයේ නිලධාරීන් කැපවී සිටී. ඔවුන්ට ඇතිවන ගැටළු කඩිනමින් ඉටුකරන අතර පුහුණුවක් අවශ්‍ය බව දන්වන ලද සියලුම දිස්ත්‍රික්ක සඳහා පුහුණුවීම් පවත්වන ලදි.

6.7 SLCERT සමඟ දෙපාර්තමේන්තුවේ සේවාදායකයන් සහ ජාල මෘදුකාංගවල ආරක්ෂක තක්සේරුවක් සිදු කිරීම.

රූපය 19: SLCERT මඟින් ආරක්ෂක තක්සේරුවක් සිදු කිරීම

සර්වර් පද්ධතියෙහි සහ යෙදුම්වල ඇති අවදානම් හඳුනාගැනීම සහ අවම කිරීම සඳහා තොරතුරු තාක්ෂණ අංශය දෙපාර්තමේන්තුවේ සේවාදායකයන්, ජාල මෘදුකාංග සහ සියලුම දෙපාර්තමේන්තුවේ ඇන්ඩ්‍රොයිඩ් යෙදුම් පිළිබඳ ආරක්ෂක තක්සේරුවක් සංවිධානය කෙරුණි.

6.8 ඊ- ලොග් පද්ධතියේ භාවිතය වැඩිදියුණු කිරීම.



රූපය 20: ඊ- ලොග් පද්ධතිය

මෙහෙයුම් අංශයේ සම්බන්ධීකරණයෙන් තොරතුරු තාක්‍ෂණ අංශය වරාය 23ක කාර්යාල සියල්ලටම ඊ-ලොග් පද්ධතිය හඳුන්වා දී ඇත. එදිනෙදා මසුන් ඇල්ලීමේදී ඊ-ලොග් ක්‍රමය භාවිතයෙන් දත්ත ලබා දීම සාර්ථකව සිදුවන අතර මීට අමතරව සෑම වරායක් සඳහාම ලොග් පිටු දත්ත ඇතුලත් කිරීම සඳහා මෙම පද්ධතිය ලබා දී ඇත. මේ වන විට මෙය සාර්ථකව සිදුකරන අතර දැනට වසර 2 ක මසුන් ඇල්ලුම් දත්ත වාර්තා සකස් කරන ලද්දේ ඊ-ලොග් පද්ධතියෙන් ලබාගත් දත්ත භාවිතා කිරීම මගිනි. ඉන්දියානු සාගර ටූනා කොමිසම (IOCT) සඳහා දත්ත වාර්තා කිරීම සිදු කරනුයේ ඊ-ලොග් පද්ධතිය මගින් ලබාගත් දත්ත භාවිතා කිරීම මගිනි.

6.9 දත්ත විශ්ලේෂණය සඳහා R භාෂාවේ භාවිතය වැඩි දියුණු කිරීම.



රූපය 21: R-Script සහ R –Shinyයන මෘදුකාංග නිර්මාණය

ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ දත්ත විශ්ලේෂණය සඳහා තොරතුරු තාක්‍ෂණ අංශය මගින් R-Script සහ R–Shinyයන මෘදුකාංග නිර්මාණය, සංවර්ධනය හා ක්‍රියාත්මක කිරීම සිදු කරයි. තොරතුරු තාක්ෂණ අංශය විසින් ඒවා භාවිතා කරමින් සිතියම් හා වාර්තා 50 කට වඩා නිර්මාණය කර ඇති අතර බහුතරයක් දත්ත IOTC වෙත වාර්තා කිරීමට භාවිතා කර ඇත.

7.0 මෙහෙයුම් අංශය

7.1 ධීවර යාත්‍රා හා ගොඩබිම අතර ගුවන් විදුලි පණිවිඩ හුවමාරුව සඳහා සන්නිවේදන පහසුකම් ලබාදීම

ධීවර යාත්‍රා හා ගොඩබිම අතර ගුවන් විදුලි පණිවුඩ හුවමාරු සන්නිවේදන පහසුකම් ලබාදීමේ කටයුතු ප්‍රාදේශීය ගුවන් විදුලි මධ්‍යස්ථාන හරහා කොළඹ ප්‍රධාන මෙහෙයුම් මැදිරිය විසින් සම්බන්ධීකරණය කරනු ලැබේ. සන්නිවේදන පහසුකම් වැඩි දියුණු කරමින් ගොඩබිම හා ධීවර යාත්‍රා අතර සම්බන්ධතාවක් පැය 24 පුරා තබා ගැනීමට කටයුතු කර ඇත. මෙමගින් ධීවර යාත්‍රා සඳහා කාලගුණ වාර්තා සහ හදිසි අයහපත් කාලගුණ තත්ත්ව පිළිබඳ පූර්ව අනතුරු ඇඟවීම් දෛනිකව ලබාදෙන අතර යාත්‍රා හිමියන් විසින් මුහුදේ ඇති තම යාත්‍රාව සමග සිදුකරනු ලබන අත්‍යවශ්‍ය පණිවුඩ හුවමාරු කටයුතු සිදු කිරීම සඳහා පහසුකම් සපයනු ලබයි. ධීවර යාත්‍රාවලින් හදිසි පණිවුඩ ලැබුණු අවස්ථාවේ සිට සහන/මුදාගැනීම් කටයුතු සිදුකරන අවස්ථාව දක්වා ශ්‍රී ලංකා නාවික හමුදාව, වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව සහ කලාපීය සමුද්‍රීය බේරාගැනීමේ සම්බන්ධීකරණ මධ්‍යස්ථානය සමග අවශ්‍ය සම්බන්ධීකරණ කටයුතු සිදුකරනු ලබයි. මෙම කාර්යයන් සඳහා කොළඹ ප්‍රධාන කාර්යාලය සමග ප්‍රාදේශීය ගුවන් විදුලි මධ්‍යස්ථාන 18 කටයුතු කරනු ලබයි.

මෑතකදී ආරම්භ කරන ලද මයිලඩ්, දික්ඕවිට, වෙල්ලමන්කර, කලමැටිය සහ කප්පරතොට යන ධීවර වරායන් වල ප්‍රාදේශීය ගුවන් විදුලි මධ්‍යස්ථාන ආරම්භ කිරීමට යෝජිතව ඇත. ධීවර දෙපාර්තමේන්තුව සතුව පවතින පැරණි ගුවන් විදුලි යන්ත්‍ර උපයෝගී කරගෙන දැනට සෝදිසි මෙහෙයුම් කටයුතු සාමාන්‍ය පරිදි සිදු කරනු ලබන අතර ඉහත ධීවර වරායන් සඳහා නව ගුවන් විදුලි යන්ත්‍ර වල අවශ්‍යතාවය දැඩි ලෙස ඇති වී ඇත.

7.2 ධීවර යාත්‍රාවල සන්නිවේදන කටයුතු සඳහා බලපත්‍ර ලබාදීමට හා ඇමතුම් සංඥා ලබාදීමට කටයුතු කිරීම.

අන්තර්ජාතික නීති රීතිවලට අනුකූලවීම සඳහා මහ මුහුදේ ධීවර කටයුතුවල නිරත ධීවර යාත්‍රා සඳහා අන්තර්ජාතික ඇමතුම් සංඥා ලබාදීම ධීවර දෙපාර්තමේන්තුවේ නිර්දේශය මත විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් ආරක්ෂක අමාත්‍යාංශයේ අනුමැතියට යටත්ව සිදුකරනු ලබයි. ධීවර යාත්‍රා හිමියන්ගේ අයදුම්පත් ලබාගෙන විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව හා එක්ව කටයුතු කරමින් ධීවර යාත්‍රාවල ගුවන් විදුලි පණිවිඩ හුවමාරුකිරීමේ යන්ත්‍ර භාවිතා කිරීම කඩිනම් කිරීම සඳහා සෝදිසි මෙහෙයුම් අංශය මැදිහත්වී කටයුතු කරනු ලබයි.

වගුව 13: ඉල්ලුම්පත් ප්‍රමාණය

ලබා දෙන ලද ගුවන් විදුලි පණිවුඩ හුවමාරු යන්ත්‍ර බලපත්‍ර සඳහා ඉල්ලුම්පත් ප්‍රමාණය	638

7.3. ධීවර යාත්‍රා හා ධීවර කාර්මිකයින්ට වන අනතුරුවලදී රක්ෂණ ආවරණ ලබාගැනීමට අවශ්‍ය තොරතුරු සනාථ කර දීම.

ධීවර යාත්‍රාවලට හා ධීවර කාර්මිකයින්ට වන අනතුරුවලදී ඒ සම්බන්ධයෙන් කටයුතු කිරීමේදී හා ඔවුන් විසින් රක්ෂණ වන්දි ලබාගැනීමේදීද රක්ෂණ ආයතන වලට ධීවර යාත්‍රාවන් විසින් ලබාදෙන සියලු පණිවිඩ හුවමාරු තොරතුරු අදාල ප්‍රාදේශීය කාර්යාල වලින් හා ප්‍රධාන කාර්යාලයෙන් ලබාගන්නා සටහන් ද භාවිතා කොට සහතික කර ඉදිරිපත් කරනු ලබයි.

මෙම දෙපාර්තමේන්තුව සතුව ආපදාවට ලක්වන ධීවර යාත්‍රා හා ධීවර කාර්මිකයන් බේරා ගැනිම, හදිසි ප්‍රතිකාර ලබා දිමට හා කඩිනමින් ගොඩබිමට රැගෙන ඒමට මුදාගැනීමේ යාත්‍රා නොමැති බැවින් නාවික හමුදාවේ සහ වෙරල ආරක්ෂක දෙපාර්තමේන්තුවේ සහය ලබා ගනු ලබයි.

වගුව 14: අනතුරු සංඛ්‍යාව

මහ මුහුදේදී වාර්තා වූ හදිසි අනතුරු සංඛ්‍යාව	212
මහ මුහුදේ සිදු වූ පුද්ගල මරණ සහ අතුරුදහන් වීම්	18
හදිසි අනතුරු නිසා විනාශයට පත් ධීවර යාත්‍රා සංඛ්‍යාව	04

7.4. විදේශීය රටවලදී අත්අඩංගුවට පත් ධීවරයින් හා යාත්‍රා මුදාගැනීම හා මෙරටට ගෙන්වා ගැනීම.

වගුව 15: විදේශීය රටවලදී අත්අඩංගුවට පත් ධීවරයින් හා යාත්‍රා මුදාගැනීම හා මෙරටට ගෙන්වා ගැනීම

රට	අත්අඩංගුවට පත් ධීවරයින් සංඛ්‍යාව	අත්අඩංගුවට පත් යාත්‍රා සංඛ්‍යාව	මුදාගත් ධීවරයින් සංඛ්‍යාව	මුදාගත් යාත්‍රා සංඛ්‍යාව
ඉන්දියාව	52	15	33	-
මාලදිවයින	43	07	32	04
සීසෙල්ෂ්	36	06	30	01

මෙම නිදහස් කර ගැනීම සඳහා විදේශ කටයුතු අමාත්‍යාංශයේ කොන්සියුලර් අංශය මගින් ඉන්දියාව, මාලදිවයින, ප්‍රංශ මෙන්ම ලන්ඩනයේ පිහිටි ශ්‍රී ලංකා මහකොමසාරිස් කාර්යාල වල සහය ලබා ගනු ලබයි.

7.5 දේශීය, ජාත්‍යන්තර හා විදේශ රටවලට අයත් මුහුදු සීමාවන්හී පාවී යමින් තිබෙන යාත්‍රා බේරා ගැනීමට කටයුතු කිරීම.

වගුව 16: මුදාගත් ධීවරයින්, යාත්‍රා සංඛ්‍යාව

මුදාගත් ධීවරයින් සංඛ්‍යාව	මුදාගත් යාත්‍රා සංඛ්‍යාව	අත්හැර දමන ලද යාත්‍රා සංඛ්‍යාව
1,272	212	04

එන්ජින් අක්‍රියවීම නිසා ආසන්න රටවල් වල මුහුදු සීමාවන්ට පාවී යන ලද, මුහුදේදී හදිසි අනතුරු වලට ලක් වන ලද ධීවර යාත්‍රා හා හදිසි අසනීප තත්වයන්ට පත් වූ ධීවර කාර්මිකයින් ශ්‍රීලංකා නාවික හමුදාවේ/වෙරල ආරක්ෂක දෙපාර්තමේන්තුවේ යාත්‍රා, වෙළඳ නැව් හා ධීවර යාත්‍රා මගින්ම බේරා ගැනීම් කටයුතු සිදු කරන ලද අතර වෛද්‍ය ප්‍රතිකාර සඳහා කඩිනමින් රෝහල් ගත කරන ලදි.

7.6 කුඩා / එක්දින යාත්‍රා සඳහා සන්නිවේදන පහසුකම් ලබාදීම

වෙරළාසන්න ධීවර රැකියාවේ යෙදෙන කුඩා යාත්‍රා හා ධීවර පිරිස් සඳහා හදිසි කාළගුණික වෙනස්වීම් පුර්ව කාළගුණික අනතුරු ඇඟවීම් ඉක්මණින් ධීවර ප්‍රජාව වෙත ලබා දී ජිවිත හානි වළක්වා ගැනිමේ අරමුණින් යුතුව ඩයලොග් ආයතනය, කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව හා මෙම දෙපාර්තමෙන්තුව ගිවිසුම් ගත විය. ඒ අනුව 2023 වර්ෂයේ මේ වන විට ධීවර කාර්මිකයින් සහ ඔවුන්ගේ පවුල් වල සාමාජිකයන් 100,000 ක් පමණ මෙම තොරතුරු සේවාවේ ලියාපදිංචි වී ඇති අතර ඔවුන් මෙහි ප්‍රතිලාභ භුක්ති විදිමින් සිටි.

7.7 ධීවර ප්‍රජාව දැනුවත් කිරිම.

ධීවර ප්‍රජාව/ ධීවර කාර්මිකයින් හා යාත්‍රා අයිතිකරුවන් දැනුවත් කිරිම් සිදු කිරිම අත්‍යාවශ්‍ය කරුණක් වුවද ධීවර කාර්මිකයින්ගේ ජිවිත ආරක්ෂාව සඳහා වන උපදෙස් හා හදිසි අනතුරකදි අනුගමනය කල යුතු ආකාරය මෙන්ම ගොඩබිම හා සම්බන්ධ වි හදිසි උපකාර සේවා ලබා ගන්නා ආකාරයද හදිසි කාලගුණ විපර්යාසයන්ට අනුව ඇතිවන සුලි කුණාටු වලදි ජිවිත ආරක්ෂා කිරිමට අනුගමනය කරන ක්‍රමවේදයන් හා ගුවන් විදුලි යන්ත්‍ර සඳහා බලපත් ලබා ගන්නා ආකාරය පිලිබදව දැනුවත් කිරිම් සිදුකිරිමට අත්‍යාවශ්‍ය බව පෙනී ගියද මෙරට තුල පවතින ආර්ථික අර්බුද තත්වය මත නිසියාකාරව ඉටුකර ගැනිමට නොහැකි විය.

යාත්‍රාවල යෙදෙනන්ගේ මත් ද්‍රව්‍ය භාවිතාව ඉහල යාම හා එමගින් ඇති වු අහිතකර ප්‍රවණතාවක් ලෙස නැව් මාර්ගයේ අනතුරු සිදුවිම් ඉහල ගොස් ඇති අතර ජිවිත හානි/යාත්‍රා විනාශවීම් වැඩි වි ඇත. එමෙන්ම සංවිධානාත්මක අනවසර සංක්‍රමණ සඳහා යාත්‍රා යොදා ගැනිම බහුල වී ඇත. යාත්‍රා විශාල ප්‍රමාණයක් මහ මුහුදේදි යාන්ත්‍රික දෝෂ සහිත විම ඉහල ගොස් ඇති අතර විශේෂයෙන්ම වෙනත් රටවල මුහුදු සිමා ආසන්නයේ සිදු වන ආපදා තත්වයන් වැඩි වී ඇති බැවින් වෙනත් රටවල් සමගින් නිරන්තරයෙන් රාජත්‍රාන්තික මැදිහත්විම් මගින් ඒ ඒ රටවල බේරා ගැනිමේ මධ්‍යස්ථාන වෙත දන්වා යැවිමට සිදුවී ඇත. එබැවින් යාත්‍රා හිමියන් යාත්‍රා පිටත් කර යැවිමට ප්‍රථම නැවතත් තම යාත්‍රා නාවික ගමන් සඳහා යෝග්‍ය තත්ත්වයක පවතිද යන්න පරීක්ෂා කිරිම සඳහා උනන්දු කරවිමට දැනුවත් කිරිම් කළ යුතුය.

වගුව 17: එක් එක් වරායෙන් පිටත් වූ ධීවර යාත්‍රා සඳහා ලබා දුන් පිටත්වීම් ගණන-2024.01.01 - 2024.12.31

	වරාය	පිටත්වීම් ගණන
1	කල්පිටිය	375
2	මීගමුව	7,152
3	දික්ඕවිට	1,244
4	බේරුවල	5,757
5	අම්බලන්ගොඩ	1,417
6	හික්කඩුව	1,229
7	ගාල්ල	7,098
8	මිරිස්ස	2,718
9	දෙවිනුවර	4,749
10	කෝට්ටෙගොඩ	1,131
11	නිල්වැල්ල	2,611
12	කුඩාවැල්ල	6,136

	වරාය	පිටත්වීම් ගණන
13	තංගල්ල	1,924
14	හම්බන්තොට	1,956
15	කිරින්ද	722
16	වාලච්චේන	17,876
17	ත්‍රිකුණාමලය	3,413
18	පොයින්ට්පේද්‍රරු	409
19	මයිලඩි	433
20	වෙල්ලමන්කරය	1,276
21	කප්පරතොට	452
22	ගන්දර	1,276
23	කලමැටිය	490

7.8 වාර්තා සහ යාත්‍රා ඡායාරූප දත්ත ගබඩාවට ඇතුලත් කිරිම හා කළමනාකරණය

වගුව 18:ලොග් වාර්තා සහ යාත්‍රා ඡායාරූප දත්ත ගබඩාවට ඇතුලත් කිරිම හා කළමනාකරණය - 2024.01.01 -2024.12.31

1.	මහ මුහුදේ මෙහෙයුම් වලට අදාලව ඒකකය වෙත ලැබුණු ලොග් පිටපත් ගණන	2,197
2.	මෙහෙයුම් වලට අදාලව නිකුත් කරන ලද සත්‍යාපන වාර්තා ගණන	2,150
3.	ලොග් දත්ත ගබඩාව වෙත ඇතුළු කරන ලද ලොග් පිටපත් ගණන	30,490
4	IOTC අවශ්‍යතා සඳහා පවත්වා ගන්නා යාත්‍රා ඡායාරූප දත්ත පද්ධතිය වෙත ඇතුලත් කරන ලද වාර්තා ගණන	352

2015 වරාය රාජ්‍ය පියවරයයන් ක්‍රියාත්මක කිරීමේ නියෝග මාලාවට අනුව ශ්‍රී ලංකාවේ වරාය පහසුකම් ලබාගැනීමට මසුන් ගොඩබෑමට හෝ ප්‍රතිනැව්ගත කිරීමට පැමිණෙන විදේශීය ධීවර යාත්‍රා සඳහා බලපත්‍ර නිකුත් තිරීම් හා යාත්‍රා පරීක්ෂාවන් සිදු කරනු ලබයි. ඉන්දියානු සාගර ටූනා කොමිසමේ 16/11 සම්මුතියට අනුව ශ්‍රී ලංකාවේ වරායවලට පිවිසෙන විදේශීය ධීවර යාත්‍රා වලින් අවමය 5% කට අදාලව සිදු කරනු ලබන පරීක්ෂණ වාර්තා ඉන්දියානු සාගර ටූනා කොමිසම වෙත ඉදිරිපත් කළයුතුව ඇත.

වගුව 19: සේවාවන්

සේවාවන්	**නිකුත් කරන ලද බලපත්‍ර සංඛ්‍යාව**	**පරීක්ෂාවන් සංඛ්‍යාව**
මසුන් ප්‍රති නැව් ගත කිරීම	19	14
නඩත්තු කටයුතු හා සැපයුම් සේවා	08	01
ආරක්ෂ නිලධාරීන් හා විදේශී ධීවර කාර්මිකයින් හුවමාරු කටයුතු සේවා	07	-
එකතුව	34	15

ඉන්දියානු සාගර ටූනා කොමිසමේ 11/04 සම්මුතියට අනුව මහ මුහුදේ ධීවර කර්මාන්තයේ යෙදෙන ධීවර යාත්‍රා වලින් අවමය 5% ක් වන පරිදි විද්‍යාත්මක ධීවර යාත්‍රා නිරීක්ෂකයින් යොදවා තොරතුරු ඉන්දියානු සාගර ටූනා කොමිසම වෙත ඉදිරිපත් කළයුතුව ඇත.

ඒලෙස 2023 වර්ෂය තුළ දී මීටර 24 ට වඩා වැඩි දිගින් යතු යාත්‍රා සඳහා යෙදවූ නිරීක්ෂකයින් සංඛ්‍යාවත්, එම යාත්‍රා සිදුකල මෙහෙයුම් සංඛ්‍යාවත් පහත වගුවේ පරිදි වේ.

වගුව 20: ධීවර යාත්‍රා

මුළු ධීවර යාත්‍රා සංඛ්‍යාව > 24m	**2024 ට සක්‍රිය යාත්‍රා සංඛ්‍යාව**	**මුළු ධීවර මෙහෙයුම් ගණන**	**විද්‍යාත්මක ධීවර යාත්‍රා නිරීක්ෂණ සංඛ්‍යාව**
05	04	07	01

7.9 ඉන්දියනු සාගර ටූනා කොමිසම (IOTC), ලෝක ආහාර හා කෘෂිකර්ම සංවිධානය (FAO), යුරෝපා සංගමය (EU) වැනි ජාත්‍යන්තර ආයතන හා සඳහා කාලීන වාර්තා සැපයීම සහ වාර්ෂික රැස්වීම් සඳහා ශ්‍රී ලංකාව නියෝජනය කිරීම.

- ඉන්දියනු සාගර ටූනා කොමිසම සඳහා වාර්ෂිකව සැපයිය යුතු වාර්තා අදාල දින වකවානු වලට යටත්ව සපයනු ලබයි.
- ඉන්දියානු සාගර ටූනා කොමිසමෙහි 10/11 සම්මුතියට අනුව සංවර්ධනය වෙමින් පවතින සාමාජික රටවලට කමිටු රැස්වීම් සහ සැසිවාර වලට සහභාගීවීම සඳහා ලබාදෙන අරමුදල් යටතේ අදාල තාක්ෂණික නිලධාරීන් වාර්ෂික රැස්වීම සඳහා සහභාගී වන ලදී.
- ඒ අනුව ශ්‍රී ලංකාව 2010 වසරේ සිට පහත පරිදි අනුකූලතා ප්‍රගතිය පෙන්නුම් කර ඇත.

වගුව 21: අනුකූලතා ප්‍රගතිය

2010	2011	2012	2013	2014	2015	2016	2017	2018	2019	2020	2021	2022	2023
5%	18%	47%	51%	60%	74%	77%	82%	87%	90%	86%	76%	83%	73.8%

7.10 බහුදින ධීවර යාත්‍රා සඳහා ධීවර යාත්‍රා නිරීක්ෂණ උපකරණ 4200ක් (VMS) සවි කිරීම

ශ්‍රී ලංකාව ධීවර කර්මාන්ත අතින් ඉතා පොහොසත් රටක් වන අතර දැනට පවුල් 300,000 පමණ ධීවර කර්මාන්තයේ යෙදී සිටිති. ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකාවේ එම සම්පත් කළමනාකරණය සහ සංවර්ධනය කිරීමේ වගකීම දරයි. කළමනාකරණය සම්බන්ධයෙන් ,අධීක්ෂණය අතිශයින් වැදගත් වන අතර DFAR හි ධීවර අධීක්ෂණ මධ්‍යස්ථානයක් (FMC) නිර්මාණය කර වැඩිදියුණු කරනු ලබන්නේ ඉහත කාරණය සඳහා පමණි. FMC ප්‍රධාන වශයෙන් ඉලක්ක කරනු ලබන්නේ බහුදින යාත්‍රා 5,200 සහ ඒවායේ ධීවර කටයුතු නිරීක්ෂණ කිරීමයි.

2015 වසරේ සිට යාත්‍රා 1,500 මෙම VMS පද්ධතිය හරහා මහ මුහුදේ යාත්‍රා පාලනය සහ අධීක්ෂණය සිදු කෙරුණද, සෙසු යාත්‍රා (යාත්‍රා 4200ක් පමණ) VMS වලින් ආවරණය වී නොමැත. එබැවින් සියලුම බහුදින යාත්‍රා සඳහා VMS සවි කිරීම සඳහා සම්පූර්ණ බහුදින යාත්‍රාව අධීක්ෂණය කිරීමේ කාලෝචිත අවශ්‍යතාවයක් සහ මෙය කිරීමට හොඳම හා ලාභදායී ක්‍රමය විය. කෙසේ වෙතත්, ඔස්ට්‍රේලියානු රජය අවබෝධතා ගිවිසුමක් හරහා ඉහත VMS ඒකක 4,200 මිලදී ගැනීම සඳහා අරමුදල් සමඟ සහයෝගය මේ සම්බන්ධයෙන් ඔස්ට්‍රේලියානු රජය IOM (සංක්‍රමණය සඳහා වූ ජාත්‍යන්තර සංවිධානය) ස්වාධීන ආයතනයක් හරහා ජාත්‍යන්තර ලංසුවක් පවත්වා සුදුසු සැපයුම්කරුවෙකු තෝරා ගනු ලැබිණි. ඒ අනුව නව VMS පද්ධතියක්; (Blue Tracker VMS) ශ්‍රී ලංකාවේ බහුදින ධීවර අංශයට හඳුන්වා දෙන ලදී. බ්ලූ ට්‍රැකර් ට්‍රාන්ස්පොන්ඩරය චන්ද්‍රිකා සේවාවක් ලෙස Iridium භාවිතා කරයි, එය අධීක්ෂණ කාර්යය සඳහා වඩාත්ම ලාභදායී සහ තාක්‍ෂණිකව පිළිගත හැකි ය. "දෙවන තිරය" ලෙස හැඳින්වෙන VMS පද්ධති මෘදුකාංගය අත්තිකාරම් වාර්තා සහ ඇඟවීම් පහසුකම වැනි බොහෝ අත්තිකාරම් විශේෂාංග හරහා අධීක්ෂණය කිරීමේ හැකියාව ඇත.

VMS පද්ධතිය හරහා ධීවරයින්ට ඵලදායි සේවා සැපයීමට හැකි වන පරිදි වෙබ් පාදක පද්ධතියක් හරහා වරාය නිලධාරියාට අධීක්ෂණ පහසුකම ලබා දිය හැක. ශ්‍රී ලංකාවේ යාත්‍රා බලඇණියේ ඇති බෝට්ටු වර්ග සඳහා ද මෙම උපකරණ සුදුසුය. එබැවින් අනාගතයේදී VMS පද්ධතිය කාර්යක්ෂමව ක්‍රියාත්මක වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

2020 අගෝස්තු අග දී VMS ස්ථාපනය ආරම්භ කරන ලද අතර එය මේ වන විට නිමකර ඇත. VMS දිවයින වටා ඇති වරායන් 15 ක පමණ සවි කර ඇත. දෙවන තිර මෘදුකාංග විනාාස කර ඇති අතර සියලුම භූ කලාප උඩුගත කර ඇත. බෝට්ටු හිමිකරුවන්ගෙන් චන්ද්‍රිකා ගාස්තු අය කර ගන්නා ලද අතර ඒ අනුව DFAR මගින් සමාගමට මාසික බිල්පත් ගෙවනු ලැබේ. බිල්පත් ගෙවීම සහ උපකරණ නඩත්තු කිරීම ද ධීවර දෙපාර්තමේන්තුවේ තොරතුරු තාක්ෂණ අංශය විසින් සකස් කරන ලද මෘදුකාංගයක් හරහා සිදු කෙරේ. නිලධාරීන්, බෝට්ටු හිමිකරුවන් සහ නායකයින් පද්ධතිය සහ එහි ක්‍රියාකාරී අංශ පිළිබඳව දැනුවත්ය. තවද බෝට් වීල් හවුස් තුළ ස්ටිකර් සවි කර ඇති අතර එමඟින් යානයේ වීඑම්එස් ක්‍රියාත්මක කිරීමට තාක්ෂණික සහ නීතිමය අවශ්‍යතා පිළිබඳව නායකයින් දැනුවත් කෙරේ.

වත්මන් VMS බෝට්ටු හිමිකරුවන්ට ලාභදායී සහ කාර්යක්ෂම සේවා සැපයීමේ හැකියාව ඇත. මෙහිදී යාත්‍රාවේ සවි කර ඇති ඇන්ටනාව ඉතා අඩු බල අවශ්‍යතාවයකින් (2W) ක්‍රියා කරන අතර ප්‍රධාන බල සැපයුම නොමැති විට දින 3ක් දක්වා එහි උපස්ථ බලය භාවිතා කිරීමට හැකියාව ඇත. FMC කාර්ය මණ්ඩලයට පහසු සහ සුමට මෙහෙයුම් සිදු කිරීමට ඉඩ සලසන වාතය හරහා වැඩසටහන් කිරීමට පද්ධතියේ උපකරණ හැකියාව ඇත. බෝට්ටුව වෙනත් ප්‍රාන්තවල EEZ වැනි පාලිත ප්‍රවේශ ප්‍රදේශ අසල ඇති විට ස්වයංක්‍රීය අනතුරු ඇඟවීම් නිර්මාණය කරයි.

EEZ තුළ ගමන් කිරීම සඳහා අහිංසක මාර්ග භාවිතා කිරීමේදී වාර්තා කිරීමේ වාර ගණන පැය 04 සිට පැය 01 දක්වා වැඩි කර FMC කාර්ය මණ්ඩලයට යාත්‍රාව සමීපව නිරීක්ෂණය කිරීමට ඉඩ සලසයි. විකල්ප අවශ්‍යතා ලෙස සැපයුම්කරු විසින් යාත්‍රා තුළ සවි කිරීමට LED Conbox (සංදර්ශකය) ලබා දෙන අතර VMS පද්ධතිය සමඟ කටයුතු කරනු ඇත, ධීවර දෙපාර්තමේන්තුවට සහ යාත්‍රා හිමිකරුට මාළු සොයා ගැනීම, අනතුරු ඇඟවීම්, දේශගුණය පිළිබඳ දේශීය භාෂාව සමඟ සන්නිවේදනය කිරීමට ඉඩ සලසයි. යාත්‍රාවේ හිමිකරුවන්ට ස්මාර්ට් ජංගම දුරකථනය හරහා තනි තනිව තම යාත්‍රා නිරීක්ෂණය කළ හැකි වන පරිදි විකල්ප සේවාවක් ලෙස බෝට්ටු හිමිකරුට ජංගම අතුරු මුහුණත ලබා දීමට පද්ධතියට හැකියාව ඇත.

ශ්‍රීලංකාව බහුවිධ අර්බුදයකට මුහුණ දී සිටියද, පළමු කොවිඩ් 19 වසංගතය සහ වර්තමානයේ ආර්ථික අර්බුදයක් ඇති වුවද, එහි පාර්ශවකරුවන්ගේ සහාය ඇතිව, නීති විරෝධී, වාර්තා නොකළ සහ නියාමනය නොකළ (IUU) මසුන් ඇල්ලීම අවම කිරීම සහ මුහුදේ ධීවර ආරක්ෂාව වැඩිදියුණු කිරීම සඳහා එහි අධීක්ෂණ හැකියාවන් යටතේ තවත් යාත්‍රා 2,000 ක් එක් කිරීමට DFAR සැලසුම් කරයි.

VMS පද්ධතියට අදාළ සියලුම වරාය කාර්යාල හරහා ප්‍රවේශ විය හැකි අතර DFAR හි ප්‍රධාන කාර්යාල පරිශ්‍රයේ පිහිටා ඇති ධීවර අධීක්ෂණ මධ්‍යස්ථානය (FMC) මගින් මධ්‍යගතව කළමනාකරණය කරයි. දැනට FMC යාත්‍රා 24x7 නිරීක්ෂණය කරයි. විදේශ රටවලට ඇතුළු වීම, VMS හානි කිරීම වැනි සැක කටයුතු හැසිරීම් හඳුනා ගැනීම FMC හි ප්‍රධාන රාජකාරි වලින් එකකි. FMC දිනපතා සංඥා නොමැති හෝ අඩු සංඥා සහිත යාත්‍රා (නිහඬ යාත්‍රා ලෙස හැඳින්වේ) යාත්‍රා හඳුනාගෙන ඔවුන්ගේ යාත්‍රාව නැවත අදාල ක්‍රමවේදයට ඇතුලත් වන තුරු යාත්‍රා පිටත්වීම අවලංගු කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලැබේ.

දීර්ඝ කාලසීමාවක් සහිත VMS අක්‍රිය යාත්‍රා ඇතුළු සියලු සැක කටයුතු යාත්‍රා පිළිබඳ තොරතුරු පරීක්ෂණ පැවැත්වීම සඳහා විමර්ශන අංශය වෙත යොමු කරනු ලැබේ. මිනිස් ජාවාරම්, මත්ද්‍රව්‍ය ජාවාරම් සහ දේශසීමා තරණය වැනි නීතිවිරෝධී ක්‍රියාකාරකම් සඳහා යොදා ගත හැකි අවදානම් යාත්‍රා හඳුනාගැනීම සඳහා ආදර්ශයක් සකස් කිරීම සඳහා අඛණ්ඩ සමීක්ෂණ පවත්වන ලදී. නීතිවිරෝධී ක්‍රියාකාරකම් සඳහා භාවිතා කළ හැකි යාත්‍රා හඳුනා ගැනීම සඳහා රටා හඳුනාගැනීම් හඳුන්වා දීමට FMC අපේක්ෂා කරයි.
ඕස්ට්‍රේලියාව-ශ්‍රී ලංකා VMS ව්‍යාපෘතිය යටතේ FMC සියලු නවීන තාක්ෂණයෙන් ද නවීකරණය කර ඇති අතර ඒ අනුව ශ්‍රී ලංකා FMC ආසියාවේ අති නවීන අධීක්ෂණ මධ්‍යස්ථානයක් ලෙස හඳුනාගෙන ඇත.



රූපය 22: යාත්‍රා අධීක්ෂණ මධ්‍යස්ථානය

03
ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය
(NAQDA)

දැක්ම

ජලජීවී වගාව සහ මිරිදිය ධීවර කර්මාන්තයෙහි තිරසාර සංවර්ධනය සහ කළමණාකාරීත්වය තුළින් ජනතාවගේ ආහාර සුරක්ෂිතතාවය සහ ජීවන තත්ත්වය උසස් කිරීම ප්‍රමුඛතම ආයතනය බවට පත් වීම

මෙහෙවර

කුඩා, මධ්‍යම සහ විශාල පරිමාණ ජලජීවී ව්‍යවසායන් සංවර්ධනය දිරිමත් කිරීම හා තිරසාර ලෙස ජලජ සම්පත් කළමනාකරණය තුලින් මිරිදිය හා කිවුල්දිය මසුන් සුලභ කිරීමට පහසුකම් සැලසීමෙන් ග්‍රාමීය සමාජයේ දුප්පත්කම තුරන් කිරීම සහ සමාජ ආර්ථික තත්ත්වයන් දියුණු කිරීමට දායක වීම.

කාර්යභාරය

- ජලජීවී වගාව, ජලජීවී වගා මෙහෙයුම් සහ නිත්‍ය සහ කාලීන ජලාශයන්හි වගාව පදනම් කරගත් සංවර්ධනය තුළින් මත්ස්‍ය නිෂ්පාදනය සහ මත්ස්‍ය පරිභෝජනය වැඩි කිරීම.
- මිරිදිය සහ කිවුල්දිය ජලජීවී වගාව සංවර්ධන කිරීම තුළින් ධීවර ක්ෂේත්‍රයේ රැකියා අවස්ථා සුලභ කිරීම.
- අපනයනය සඳහා වැඩි වටිනාකමක් ඇති ආහාරමය මත්ස්‍ය වගාව, විසිතුරු මත්ස්‍ය සහ ජලජ පැළෑටි වගාව දියුණු කිරීම.
- පරිසර හිතකාමී ක්‍රමවේදයන් අනුගමනය කරමින් ජලජීවී සම්පත් උපරිම ලෙස ප්‍රයෝජනයට ගැනීම.
- කුඩා, මධ්‍යම, සහ විශාල පරිමාණයේ ජලජීවී ආයෝජන ප්‍රවර්ධනය කිරීම, පහසුකම් සැලසීම සහ වැඩිදියුණු කිරීම.
- ජෛව විවිධත්ව ආරක්ෂා වන පරිදි ජලජීවී වගාව, ජලජ සම්පත් හා වගාව පදනම් කරගත් ධීවර කර්මාන්තය කළමනාකරණය, සංරක්ෂණය සහ සංවර්ධනය සඳහා කටයුතු කිරීම.
- ජලජ සම්පත් ආනයනය, අපනයනය, විකිනීම සහ බෙදාහැරීම පිළිබඳ ව්‍යාපාරිකයෙකු, පහසුකම් සපයන්නෙකු සහ බෙදාහරින්නෙකු ලෙස කටයුතු කිරීම සහ ඒ කටයුතු වලට සහාය වීම.
- ජලජීවී වගාව, ජලජීවී වගා මෙහෙයුම් සහ වගාව පදනම් කරගත් ධීවර කර්මාන්තය සංවර්ධනය සඳහා සැලසුම් හා වැඩසටහන් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම.

මිරිදිය මත්ස්‍ය හා ජලජීවී වගා නිෂ්පාදනය

මිරිදිය ධීවර හා ජලජීවී වගා අංශය ශ්‍රී ලංකාවේ ග්‍රාමීය ආර්ථිකය ශක්තිමත් කිරීම හා ආහාර සුරක්ෂිතතාව, ජනතාවගේ පෝෂණය, රැකියා/ජීවනෝපාය අවස්ථා සැපයීම සහ විදේශ විනිමය ඉපැයීම සඳහා වැදගත් කාර්යභාරයක් ඉටු කරන අතර. රටෙහි සමස්ත මත්ස්‍ය නිෂ්පාදනයෙන් 25-30% ක පමණ දායකත්වයක් මිරිදිය ධීවර හා ජලජීවී වගා අංශය මගින් සපයයි.

ඉලක්කය 2024 (මෙ.ටොන්)	මිරිදිය මත්ස්‍ය හා ජලජීවී වගා නිෂ්පාදනය (මෙ.ටොන්) (ජනවාරි - නොවැම්බර්)	ඉලක්ක සපුරාලීම
135,230	97,130	72%

2024 වසරේ නොවැම්බර් මස වන විට නිත්‍ය ජලාශ වල වගා පාදක ධීවර කර්මාන්තයෙන් හා මිරිදිය ජලජීවී වගාව තුලින් මෙ.ටොන් 88,060ක මත්ස්‍ය නිෂ්පාදනයක් ලබා ගෙන ඇත. එමෙන්ම කිවුල්දිය ඉස්සන් ඇතුළුව වෙරළබඩ ජලජීවී වගාව තුලින් මෙ.ටොන් 9,110 ක ජලජීවී නිෂ්පාදනයක් ලබා ගෙන ඇත.

මත්ස්‍ය ඇඟිල්ලන් හා මිරිදිය ඉස්සන් පසුකීටයන් ජලාශ වල තැන්පත් කිරීම

2024 වර්ෂයේ මත්ස්‍ය ඇඟිල්ලන් හා මිරිදිය ඉස්සන් පසුකීටන් තැන්පත් කිරීමේ ඉලක්ක සහ ප්‍රගතිය රූපසටහන් 1 මගින් පෙන්වා ඇත.



රූපසටහන 1: මත්ස්‍ය ඇඟිල්ලන් හා මිරිදිය ඉස්සන් පසුකීටන් තැන්පත් කිරීම

මත්ස්‍ය බීජ තැන්පත් සඳහා රජයේ විශේෂ ආධාර වැඩසටහන

2024 වර්ෂය සඳහා සඳහා රජය විසින් මිරිදිය ධීවර අංශයේ සංවර්ධනය වෙනුවෙන් රු. මිලියන 200ක් වෙන් කරන ලදි. එමෙන්ම මෙම වැඩසටහනේ තිරසාර බව පවත්වා ගැනීම සඳහා ප්‍රජා සහභාගීත්වයෙන් චක්‍රීය අරමුදලක් පිහිටුවා ධීවර ප්‍රජාව දිරිගැන්වීමේ වැඩපිළිවෙළක් සකස් කිරීමට යෝජනා කර ඇත.

මෙම වැඩසටහන යටතේ මත්ස්‍ය ඇඟිල්ලන් මිලියන 30ක්, මත්ස්‍ය ඇසිත්තන් මිලියන 19.68ක් සහ මිරිදිය ඉස්සන් පසු කීටයන් මිලියන 24.53ක් තැන්පත් කර ඇත.

මිරිදිය මත්ස්‍ය බීජ නිෂ්පාදනය

මත්ස්‍ය නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා ජලාශ වල තැන්පත් කිරීම සඳහා අවශ්‍ය මත්ස්‍ය බීජ නිෂ්පාදනය කිරීම අධිකාරියේ ප්‍රධාන කාර්යභාරයක් වේ. උඩවලව, දඹුල්ල, ඉඟිනියාගල, ඉරණමඩු, කලාවැව, නුවරඑළිය, පොළොන්නරුව සහ මුරුතවෙල යන ජලජීවී වගා සංවර්ධන මධ්‍යස්ථාන වල නිෂ්පාදනය කරන මත්ස්‍ය ඇසිත්තන් මත්ස්‍ය ඇඟිල්ලන් දක්වා වර්ධනය කිරීමට පෞද්ගලික පොකුණු, කොටු, කූඩු, ප්‍රජා මූලික කුඩා පරිමාණ මත්ස්‍ය බීජ නිෂ්පාදන ඒකක සඳහා ලබා දේ. එමෙන්ම පම්බල, කහඳමෝදර හා කල්ලරාව මධ්‍යස්ථාන වල මිරිදිය ඉස්සන් පසුකීටයන් නිෂ්පාදනය කරනු ලැබේ.
අගෝස්තු මාසය දක්වා වන මත්ස්‍ය බීජ නිෂ්පාදනය රූපසටහන 2 හි රූපසටහන 3හි දක්වා ඇත.



රූපසටහන 2: ජලජීවී වගා සංවර්ධන මධ්‍යස්ථාන වල මත්ස්‍ය හා ඉස්සන් බීජ නිෂ්පාදනය



රූපසටහන 3: පෞද්ගලික පොකුණු , කුඩා පරිමාණ මත්ස්‍ය බීජ නිෂ්පාදන ඒකක, කූඩු, කොටු වල මත්ස්‍ය ඇඟිල්ලන් නිෂ්පාදනය

මිරිදිය ධීවර ක්ෂේත්‍රය යටතේ ක්‍රියාත්මක විදේශ අරමුදල් සහිත ව්‍යාපෘති

- ශ්‍රී ලංකාවේ ග්‍රාමීය ප්‍රජාවන්හි ආහාර සහ පෝෂණ සුරක්ෂිතතාව සහ ජීවනෝපාය වැඩිදියුණු කිරීම් සහතික කිරීම සඳහා වගා පාදක මිරිදිය ධීවර කර්මාන්තය ස්වයං තිරසාර ලෙස සංවර්ධනය කිරීම

ධීවර අමාත්‍යාංශය සමඟ එක්ව මිරිදිය ධීවර කර්මාන්තය ශක්තිමත් කිරීමට සහ ග්‍රාමීය ජීවනෝපාය වැඩිදියුණු කිරීමට ජපාන රජය එක්සත් ජාතීන්ගේ ආහාර හා කෘෂිකර්ම සංවිධානය (FAO) වෙත ඇමරිකානු ඩොලර් මිලියන 3 ක ප්‍රදානයක් ලබා දී ඇත. මේ යටතේ ආහාර සහ පෝෂණ සුරක්ෂිතතාව ඉහළ නංවන අතර තිරසාර බව ශක්තිමත් කරනු සඳහා මත්ස්‍ය බීජ අභිජනන ධාරිතාවය වැඩිකිරීම සඳහා මඩකලපුව, මුලතිව්, අනුරාධපුර සහ මොණරාගල දිස්ත්‍රික්කවල ප්‍රජා මූලික කුඩා පරිමාණ මත්ස්‍ය අභිජනනාගාර 4ක් ස්ථාපිත කිරීම, ජලජීවී වගා සංවර්ධන මධ්‍යස්ථාන 4ක් සහ ප්‍රජා මූලික කුඩා පරිමාණ මත්ස්‍ය අභිජනන ඒකකයක් වැඩිදියුණු කිරීම, තෝරාගත් ජලාශවල මත්ස්‍ය ඇඟිල්ලන් ගහණය වැඩිකිරීම, මඩ මත්ස්‍ය ගහණය වර්ධනය කිරීම, ධීවර ප්‍රජාවන් අතර කූඩු තුල මත්ස්‍ය වගාව ප්‍රවර්ධනය කිරීම ආදී වැඩසටහන් සැලසුම් කර ඇත. මෙම වසරක ව්‍යාපෘතිය මඟින් මත්ස්‍ය බීජ ප්‍රවාහනය සඳහා බවුසර් රථ 3ක් අධිකාරිය වෙත ලබා දීම, මිරිදිය ධීවර කර්මාන්තයට ඩිජිටල් තාක්ෂණය ඒකාබද්ධ කිරීම සහ මිරිදිය ධීවර නිෂ්පාදනය, කළමනාකරණය, සැකසීම සහ අගය එකතු කිරීම සම්බන්ධව නිලධාරීන්ගේ සහ ධීවරයින්ගේ තාක්ෂණික හැකියාවන් ඉහළ නැංවීමට ද කටයුතු කරනු ඇත.

දළ වශයෙන් මිරිදිය ධීවරයින් 3,000ක්, කුඩා පරිමාණ මත්ස්‍ය අභිජනන ඒකක වල වගාකරුවන් 40 දෙනෙකු සහ මත්ස්‍ය ආහාර සැකසීමේ පුද්ගලයින් 20 දෙනෙකු මෙම ව්‍යාපෘතියේ ඍජු ප්‍රතිලාභීන් වේ. තව ද , මේ යටතේ ධීවර පවුල් වල සාමාජිකයන්, පාරිභෝගිකයින් සහ කරවල නිෂ්පාදකයින් ඇතුළු වක්‍ර ප්‍රතිලාභීන් සඳහා ප්‍රතිලාභ රැසක් ලබා දීම ද අරමුණු කෙරේ.

වෙරළබඩ ජලජීවී වගා සංවර්ධනය

කිවුල්දිය ඉස්සන් වගාව

මෙය ශ්‍රී ලංකාවේ විශාලතම වාණිජ ජලජීවී වගා ක්‍රියාකාරකම වේ. ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියෙහි අඛණ්ඩ නිරීක්ෂණ සහ අධීක්ෂණ කටයුතු හේතුවෙන් අද ඉස්සන් කර්මාන්තය ඵලදායී මට්ටමකට පැමිණ ඇත. 2024 වර්ෂයේ මෙ.ටොන් 7,109 ක අස්වැන්නක් ලබා ගෙන ඇත.

මුහුදු කූඩැල්ලන් අභිජනනය හා වගාව

මුහුදු කූඩැල්ලන් වගාව ශ්‍රී ලංකාවේ ජලජීවී වගා ක්ෂේත්‍රය තුල ප්‍රචලිත වෙමින් පවතින අංශයකි. විශේෂයෙන් චීනය සහ අනෙකුත් නැගෙනහිර ආසියාතික රටවල ප්‍රණීත ආහාරයක් ලෙස සලකනු ලබන සහ ඖෂධීය ගුණ ඇති මුහුදු කූඩැල්ලන් සඳහා ජාත්‍යන්තර වෙළඳපොළේ ඉහළ මිලක් පවතී. අපනයන වෙළෙඳපොළ තුළ මුහුදු කූඩැල්ලන් සඳහා වැඩි ඉල්ලුමක් පවතින බැවින් දේශීය ධීවර ප්‍රජාවගේ ජීවනෝපාය සඳහා සහ රටට අවශ්‍ය විදේශ විනිමය ගෙන ඒම සඳහා මුහුදු කූඩැල්ලන් වගාව ප්‍රවර්ධනය කිරීමට පියවර ගෙන ඇත.

පෞද්ගලික අංශය විසින් මන්නාරම, කිළිනොච්චිය, යාපනය සහ පුත්තලම යන දිස්ත්‍රික්ක වල මුහුදු කූඩැල්ලන් වගාව ක්‍රියාත්මක කරන අතර 2024 වර්ෂයේ මෙ.ටොන් 479 (තෙත් බර) අස්වැන්නක් ලබා ගෙන ඇත. මුහුදු කූඩැල්ලන් අපනයනය ඉහළ නැංවීම සඳහා මුහුදු කූඩැල්ලන් ගම්මාන කිලිනොච්චිය හා යාපනය දිස්ත්‍රික්ක වල ක්‍රියාත්මක වේ.

මොදා මත්ස්‍ය වගාව

ත්‍රිකුණාමලය, ගම්පහ, ගාල්ල, යන දිස්ත්‍රික්කවල මෝදා මත්ස්‍ය වගාව සඳහා පුද්ගලික අංශය යොමු වී ඇත. තව ද මහා පරිමාණ කූඩු තුල මොදා මත්ස්‍ය වගා ව්‍යාපෘතියක් පෞද්ගලික සමාගමක් විසින් ත්‍රිකුණාමල මුහුදේ පවත්වා ගෙන යන අතර මෙය ශ්‍රී ලංකාවේ ප්‍රථම මුහුදු මත්ස්‍ය ගොවිපල වේ. 2024 වර්ෂයේ මෙ.ටො. 973 ක මොදා මත්ස්‍ය අස්වැන්නක් ලබා ගෙන ඇත.



මුහුදු පැළෑටි වගාව

උතුරු හා වයඹ පළාත් මුහුදේ මුහුදු පැළෑටි වගාව ප්‍රජා සහභාගීත්වයෙන් සිදුකිරිමට ජලජීවී වගා සංවර්ධන අධිකාරිය විසින් පියවර ගෙන ඇත. 2024 වර්ෂයේ මෙ.ටො. 795 (තෙත් බර) අස්වැන්නක් ලබා ගෙන ඇත.

විසිතුරු මත්ස්‍ය වගාව

ජලජීවී වගා සංවර්ධන අධිකාරිය විසින් මසුන්ගේ නව ප්‍රභේද බිහිකිරිම, තාක්ෂණ සංවර්ධනය, මව් මසුන් සැපයීම, මත්ස්‍ය රෝග නිර්ණයන, පුහුණුව සහ තාක්ෂණ උපදෙස් සැපයීම යනාදීය මඟින් විසිතුරු මසුන් හා ජලජ පැලෑටි වගාව මෙන්ම අපනයන සඳහා ද සහාය වෙනු ලබයි.

රඹබඩගල්ල, ගිණිගත්හේන සහ සෙවනපිටිය ජලජීවී වගා සංවර්ධන මධ්‍යස්ථාන විසිතුරු මසුන් සහ ජලජ පැලෑටි වගාව සංවර්ධනයට අදාල කාර්යයන් සඳහා වෙන්කර ඇත. මෙම මධ්‍යස්ථාන මඟින් 2024 වර්ෂයේ විසිතුරු මසුන් මිලියන 4.03 ක් ගොවීන්ට හා අපනයනකරුවන්ට අළෙවිකර ඇත. තවද රඹබඩගල්ල විසිතුරු මත්ස්‍ය අභිජනන හා පුහුණු මධ්‍යසථානය මඟින් 1,029 දෙනෙකු සඳහා පුහුණු පාඨමාලා පවත්වා ඇත.

මිරිදිය විසිතුරු මසුන් වඩාත් වර්ණවත් හා කැපී පෙනෙන ගප්පි, ස්වෝඩ්ටේල්, ප්ලේටි, බාර්බ්ස්, ටෙට්‍රා, ඒන්ජල්, ගුරමි සහ කැට්ෆිෂ් විශේෂ වලින් සමන්විත වේ. ශ්‍රී ලංකාවෙන් අපනයනය කරන ලද මෙම මිරිදිය විශේෂ අතුරින් 50-60% පමණ ගප්පි වලින් සමන්විත වේ. ශ්‍රී ලංකාවේ නිත්‍ය අපනයන සමාගම් 60 ක් පමණ ඇත. ශ්‍රී ලංකාවේ විසිතුරු මසුන් සඳහා ප්‍රධාන ගැනුම්කරුවන් වන්නේ ඇමරිකා එක්සත් ජනපදය, චීනය, එක්සත් රාජධානිය, ජර්මනිය, ඕස්ට්‍රේලියාව, කැනඩාව, සවුදි ආරබිය, එක්සත් අරාබි එමීර් රාජ්‍යය සහ ඉතාලිය.

මිරිදිය විසිතුරු මසුන් හා සසඳන විට කරදිය විසිතුරු මත්ස්‍යයන්ට ඉතා ඉහළ මිලක් හිමිවන අතර ජාත්‍යන්තර වෙළෙඳපොළේ ඉහළ ඉල්ලුමක් පවතී. විසිතුරු මත්ස්‍ය නිෂ්පාදන පරාසය වැඩිකිරීම, කරදිය විසිතුරු මත්ස්‍ය නිෂ්පාදනය වැඩිකිරීම තුලින් අපනයන ආදායම වැඩිකිරීම, තාක්ෂණික දැනුම ලබා දීමේ අරමුණු ඇතිව පුත්තලම බංගදෙනියෙහි කරදිය විසිතුරු මත්ස්‍ය අභිජනන මධ්‍යස්ථානය ඉදිකර ඇත.

<u>**කෘෂිකාර්මික නවීකරණ වැඩසටහන යටතේ උසස් තාක්ෂණය යොදා ගනිමින් දැනට පවතින විසිතුරු මත්ස්‍ය ගොවිපළවල් වැඩිදියුණු කිරීම**</u>

සාර්ථක විසිතුරු මත්ස්‍ය වෙළඳාමක් සඳහා ප්‍රධානතම සාධකය වන්නේ ලෝක වෙළඳපොළට උසස් ප්‍රමිතියෙන් යුත් විවිධ වර්ගවල මසුන් අඛණ්ඩව සැපයීමේ හැකියාවයි. විසිතුරු මත්ස්‍ය කර්මාන්තය කුඩා හා මධ්‍ය පරිමාණ වගාකරුවන් මත බෙහෙවින් රඳා පවතී. මෙම වගාකරුවන්ට විසිතුරු මත්ස්‍ය නිෂ්පාදනය සහතික කිරීම සඳහා දියුණු තාක්‍ෂණයන් සහිත නවීකරණය කරන ලද පහසුකම් අවශ්‍ය වේ. එබැවින් එම අංශයේ කුඩා පරිමාණ සහ මධ්‍ය පරිමාණ වගාකරුවන්ට සහයෝගය ලබා දීම ක්ෂේත්‍රයේ තිරසාර සංවර්ධනය සඳහා වන මූලික අවශ්‍යතාවයකි.

ඒ අනුව දැනට පවතින විසිතුරු මත්ස්‍ය ගොවිපළ වැඩිදියුණු කිරීම සඳහා රු. මි. 35ක් කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ කෘෂිකර්ම නවීකරණ වැඩසටහන යටතේ වෙන් කර ඇත. මෙම වැඩසටහන යටතේ තෝරාගත් ප්‍රතිලාභීන් සඳහා රුපියල් 500,000.00 ක උපරිම ණය මුදලක් ලබා දීමටත් මාස 2ක සහන කාලයක් සහිතව මාස 24කින් එම ණය මුදල අයකර ගැනීමටත් සැලසුම් කර ඇත. 2024 දෙසැම්බර් 31 වන විට ප්‍රතිලාභීන් 19 දෙනෙකු සඳහා රු. මිලියන 8.80 ක් වටිනා ණය මුදලක් නිකුත් කරන ලද අතර තවත් ප්‍රතිලාභීන් 75 දෙනෙකුට රු. මි. 34.66 ක් වටිනා ණය මුදලක් නිකුත් නිකුත් කර ඇත.

ජලජීවී නිෂ්පාදන අපනයනය

මත්ස්‍ය විශේෂය	2024 (ජනවාරි - නොවැම්බර්)	
	අපනයන ප්‍රමාණය (මෙ.ටො.)	අපනයන වටිනාකම (රු.මි)
ඉස්සන්	3,219	8,352.3
විසිතුරු මසුන්	-	6,812.8
මුහුදු කූඩැල්ලන්	232	3,011.7

04
ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතනය (NARA)

දැක්ම

කලාපයේ ජලජ සම්පත් සංරක්ෂණය, කළමනාකරණය සහ සංවර්ධනය පිළිබඳ විද්‍යාත්මක පර්යේෂණ සඳහා ප්‍රමුඛතම ආයතනය වීම.

මෙහෙවර

විද්‍යාත්මක හා තාක්‍ෂණික දැනුම සහ සම්පත් පදනම උපයෝගී කරගනිමින් ජලජ සම්පත් අංශයේ ජාතික සංවර්ධන ගැටලු සඳහා නව්‍ය විසඳුම් ලබාදීම.

කාර්යභාරය

- ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතනය (NARA) යනු ජලජ සම්පත් ආශ්‍රිත පර්යේෂණ, සංවර්ධන සහ කළමනාකරණ ක්‍රියාකාරකම් සිදු කිරීම සහ සම්බන්ධීකරණය කිරීම සඳහා වගකිව යුතු ප්‍රධාන ජාතික ආයතනයයි.
- ජීවී හා අජීවී ජලජ සම්පත් සම්බන්ධ ජාතික සංවර්ධන වැඩසටහන සඳහා විද්‍යාත්මක හා තාක්‍ෂණික විශේෂඥතාව යොදා ගැනීම සහතික කිරීම.
- පහත සඳහන් ක්ෂේත්‍රවල ජලජ සම්පත් හඳුනා ගැනීම, තක්සේරු කිරීම, කළමනාකරණය, සංරක්ෂණය සහ සංවර්ධනය සඳහා යොමු වූ පර්යේෂණ ක්‍රියාකාරකම් සිදුකිරීම සහ ප්‍රවර්ධනය කිරීම;
  - සාගර විද්‍යාව සහ ජල විද්‍යාව.
  - ධීවර යාත්‍රා, ධීවර ආම්පන්න සහ උපකරණ සහ ධීවර ක්‍රම වැඩිදියුණු කිරීම සහ සංවර්ධනය කිරීම.
  - ධීවරයින්ගේ සහ ඔවුන්ගෙන් යැපෙන්නන්ගේ සුභසාධනය ඇතුළුව ධීවර කර්මාන්තයේ සමාජ හා ආර්ථික අංශ.
  - මත්ස්‍ය හා ජලජ නිෂ්පාදන සැකසීම, සංරක්ෂණය සහ අලෙවි කිරීම.
  - අභ්‍යන්තර ජලාශ, වෙරළබඩ තෙත් බිම් සහ වෙරළාසන්න ප්‍රදේශවල ජලජ සම්පත් සංවර්ධනය, කළමනාකරණය සහ සංරක්ෂණය.
  - ජලජ සම්පත් සුරාකෑම, කළමනාකරණය, සංරක්ෂණය සහ සංවර්ධනය සම්බන්ධ විද්‍යාත්මක, තාක්‍ෂණික සහ නීතිමය කාරණා සම්බන්ධයෙන් උපදේශන සහ උපදේශන සේවා සැපයීම.
- ජලජ සම්පත් සුරාකෑම වැළැක්වීම, සැලසුම් කිරීම, පර්යේෂණ, සංවර්ධනය, සංරක්ෂණය, පාලනය සහ කළමනාකරණය සම්බන්ධව ආයතන අතර සම්බන්ධීකරණ කටයුතු සිදුකිරීම.
- ශ්‍රී ලංකාවේ ජලජ සම්පත් කළමනාකරණය, සංරක්ෂණය සහ සංවර්ධනය සහ ධීවර කර්මාන්තය සඳහා ප්‍රයෝජනවත් වන තොරතුරු සහ දත්ත රැස් කිරීම, බෙදා හැරීම සහ ප්‍රකාශනය කිරීම භාර ගැනීම.
- නියෝජිතායතනයේ කටයුතු කරගෙන යාමට හෝ සහාය වීමට අවශ්‍ය පුද්ගලයින් සඳහා පුහුණුව ලබා දීම.

2024 වසර සඳහා වෙන්කරන ලද ප්‍රතිපාදන වලින් කරන ලද විශේෂිත පර්යේෂණ වැඩසටහන්

1. **ජලජ සම්පත් තිරසාර ලෙස භාවිතා කිරීම සඳහා තාක්ෂණයන් නවීකරණය කිරීම සඳහා වන විද්‍යාත්මක නවෝත්පාදන හඳුන්වාදීමේ ව්‍යාපෘතිය (රු.මි.26.88)**

ව්‍යාපෘතිය 1.1: ජලජීවී වගාව සහ අභ්‍යන්තර ධීවර කර්මාන්තය සංවර්ධනයට අදාළ තාක්‍ෂණ නවීකරණය සඳහා විද්‍යාත්මක නවෝත්පාදන විධික්‍රම යොදාගැනීම

ජලය ප්‍රතිචක්‍රීකරණය පද්ධති වන ජලජීවී වගා පද්ධති පිළිබඳව පසුගිය වසරේ සිදු කරන ලද පර්යේෂණයන්ගේ දත්ත උපයෝගී කර ගනිමින් නව පද්ධතියක් ජලජීවී පර්යේෂණ ඒකකයේ ස්ථාපනය කරන ලදී. මෙම නව පද්ධතිය ලීටර 450 යුත් නිෂ්පාදිත ඒකකයකින් හා ලීටර 320 පරිමාවකින් යුත් පෙරණ පද්ධතියකින් සමන්විත වේ. මෙම පෙරණ පද්ධතිය යාන්ත්‍රික පෙරණ පද්ධතියකින් ජීවී පෙරණ පද්ධතියක් හා UV පෙරණ පද්ධතියකින් යුක්ත වේ. පද්ධතිය සඳහා මසුන් තැන්පත් කිරීමට ප්‍රථම මෙහි ක්ෂුද්‍ර ජීවීන්ගේ ක්‍රියාකාරීත්වය අවශ්‍ය පරිදි සකසා ගැනීම සිදු කරන ලදී. පද්ධතියේ ජලයේ ක්ෂාරීය බව 250mg/l මට්ටමේ පවත්වා ගැනීම ක්ෂුද්‍ර ජීවීන්ගේ ක්‍රියාකාරීත්වය වර්ධනය කිරීම සඳහා වැදගත් වේ. මෙම පද්ධතියේ ජලයේ ක්ෂාරීයතාව වැඩි කිරීම සඳහා 250ml, $NaHCO_3$ පද්ධතියට එකතු කරන ලදී. එවිට ජලයේ ක්ෂාරීයතාව 35mg/l සිට 280mg/l දක්වා වැඩි විය. ක්ෂුද්‍ර ජීවීන්ගේ වර්ධනය සිදුවීම සඳහා ඇමෝනියා සංඝටක අවශ්‍ය බැවින් මසුන් සඳහා ලබාදෙන ආහාර 5g බැගින් නිෂ්පාදිත ටැංකි වලට එක් කරන ලදී. මෙම තත්ත්ව යටතේ පද්ධතිය ක්‍රියාකරවීමේදී සතියකට පසුව ජලයේ ඇමෝනියා සාන්ද්‍රණය හිතකර අගයකට ගැනීමට හැකිවුවත් NO_2 සාන්ද්‍රණය මත්ස්‍යයන්ට හිතකර නොවන මට්ටමක පැවතුණි. එබැවින් ලුණු 300g/l සාන්ද්‍රණයෙන් පද්ධතියට එක්කරන ලදී. මෙලෙස පද්ධතිය ක්‍රියාත්මක සති දෙකක කාලයකින් පසුව පද්ධතියේ ක්‍රියාකාරිත්වය මත්ස්‍ය වගාවන් සඳහා හිතකර මට්ටමකට පත්කර ගැනීමට හැකි විය. මෙහි ඉදිරි පර්යේෂණ කටයුතු සඳහා මසක් වයස ගප්පි මසුන් මිලදී ගන්නා ලදී.

තර්ජනයට ලක්ව ඇති අපනයන තහනම් ආවේණික මත්ස්‍ය විශේෂ යොදා ගනිමින් දෙමුහුන් විසිතුරු ප්‍රභේදයක් සංවර්ධනය කිරීම සඳහා සිදු කරන ලද අඛණ්ඩ අභිජනන දෙමුහුන්කරණය සාර්ථක විය. දෙමුහුන් වූයේ දත්කුඩුපෙතියා ගැහැණු × දත් කොළ පෙතියා පිරිමි සහ දත් කොළ පෙතියා ගැහැණු × දත්කුඩුපෙතියා පිරිමි මසුන් 2:1 අනුපාතය වන අතර එහි ප්‍රතිඵලය වූයේ 60% දත් කුඩු පෙතියාවර්ණ මසුන්ය. දෙමුහුන් ආකාර දෙකෙහිම පැටවුන් < 57% ක පැවැත්මේ ප්‍රතිශතයක්, ඉහළ වර්ධන වේගය, ගහනයේ සාමාන්‍ය මත්ස්‍යයකුගේ දිග> 8cm සහ මාපිය යුගල හා සසඳන විට තීව්‍ර වර්ණ පෙන්නුම් කළේය. ආරම්භක අවධියේදී සියල්ලන්ම දත්කොළ සාලයා බාල මසුන් සමාන විය. සති 8කට පසු ඇතැමුන් දත්කුඩුපෙතියා වර්ණ රටාව 100% සමාන බව පෙන්වීමට පටන් ගත්හ. ප්‍රතිඵලය පෙන්වා දෙන්නේ ජෛව මංකොල්ලකෑම අවදානම අවමකරන පිරිසිදු මත්ස්‍ය විශේෂ වෙනුවට දෙමුහුන් අභිජනනයෙන් නිපදවන මසුන් අපනයනය කළ හැකි බවයි. කෙසේ වෙතත්, දෙමුහුන්කරණයේ අනුකූලතාවයේ හැකියාව ගවේෂණය කිරීමට වැඩිදුර පර්යේෂණ අවශ්‍ය වේ.පෙතියා මත්ස්‍ය විශේෂ සමඟ අත්හදා බැලූ සමාන දෙමුහුන්අභිජනන සාර්ථක නොවූ නමුත් ස්වාභාවික පරිසරයෙන් අල්ලන ලද නව මව් සතුන් පර්යේෂණය සඳහා යොදා ගනිමින් නැවතත් මෙම පයේෂණය සිදු වෙමින් පවතී. බුලත් හපයා මත්ස්‍ය යුගල 50ක් සමඟ ප්‍රජා බෝ කිරීම අවසන් වූයේ අඩු පැටවුන් සංඛ්‍යාවකින් (යුගලයකට පැටවුන් 15ක්). මහවැලි ගංගා ද්‍රෝණියෙන් එකතු කරන ලද පරිණත ගැහැණු සතුන් තුළ ඉතා අඩු බිත්තර ප්‍රමාණයක් (< 20) ඇති බව සොයා ගන්නා ලදී. මෙය දේශගුණික විපර්යාස නිසා විය හැකිබවට අනුමාන කෙරිණි.

ශාක පටක රෝපණ රසායනාගාරයේ ජලජ පැළෑටි නිෂ්පාදනය ආරම්භ කර ඇත. පටක රෝපණය මගින් ලබාගන්නා ලද *Cryptocoryne wendtii* පැළ 2000ක් පමණ මේ වන විට නිෂ්පාදනය කර ඇත. ශාක වගා කරන්නන් සඳහා අඛණ්ඩ සැපයුම සඳහා, පූර්වක පටක වගා කිරීම අඛණ්ඩව සිදු කෙරේ. *Anubias barterivar nana* පැළ නිෂ්පාදනය ආරම්භ කරන ලදී.

පටක රෝපණ වගා කරන ලද *Cryptocoryne wendtii* ශාක භාවිතයෙන් ප්‍රතිචක්‍රීකරණය පද්ධති (RAS)වල අත්හදා බැලීම් සිදු කරන ලදී. RAS පද්ධතියේ විසිතුරු ගප්පි පැටවුන් විවිධ ඝනත්වයන් යටතේ භාවිතා කර ඇත. එක් ටැංකියකට පටක රෝපණ පැළ9ක් තබා ඇත. මුලදී, මත්ස්‍ය බර මනින ලදී. ශාක හරිතප්‍රද, පත්‍රවල සාමාන්‍ය දිග, පත්‍රසංඛ්‍යාවලබා ගන්නා ලදී. pH, ඇමෝනියා, පොටෑසියම් වැනි ජල තත්ත්ව පරාමිතීන් පරීක්ෂා කරන ලදී. දිනපතා සහ සතිපතා දත්ත රැස් කරයි. RAS වල අත්හදා බැලීම්

මාස තුනක් දිගටම කරගෙන යාමට සැලසුම් කරයි. ස්ථිරකාලීන ජලාශ දහයකින් ජල සාම්පල ලබාගැනීම සිදුකරන ලදී. මෙම සාම්පල ජලාශවලට ජලය ලැබෙන ස්ථානවලින්ද ජලාශයන්ගෙන් ජලය පිටවන ස්ථානවලින් හා ජලාශ මධ්‍යයෙන් ලබාගන්නා ලදී. එම ජල සාම්පලවල නයිට්‍රේට, පොස්පේට්, ඇමෝනියා ක්ෂාරීයතාව සඳහා විද්‍යාගාරයේදී විශ්ලේෂණය සිදුකරන ලදී. මෙම ජලාශයන්ගේ ධීවර සමිති මගින් මත්ස්‍ය අස්වැන්න පිළිබඳ වාර්තා තබාගන්නා ලොග් පොත් භාවිතයෙන් එක් එක් ජලාශයේ මත්ස්‍ය අස්වැන්න ධීවර කර්මාන්තයේ යෙදෙන ධීවර සංඛ්‍යාව පිළිබඳ දත්ත ලබාගන්නා ලදී. එමෙන්ම ජලාශ පිළිබඳව අවශ්‍යවන දත්ත වාරිමාර්ග දෙපාර්තමේන්තුව මඟින්ද ලබාගන්නා ලදී.

පුත්තලම ආටීමියා ගොවි ගම්මානයේ තෝරාගත් වගාකරුවෙකුට ආටීමියා වගා කිරීමට ප්‍රමාණවත් දැනුමක් සහ හරිත ක්ෂුද්‍ර ඇල්ගී, ක්ලෝරෙල්ලා නියැදියක් (රූපය1) ලබා දෙන ලදී. අපගේ උපදෙස් අනුගමනය කරමින්, 35-40 ppt දක්වා වර්ධනයවූ ආටීමියා පෝෂණය කළ හැකිවන පරිදි ඔවුන්ගේ එළිමහන් ඇල්ගී තොග (රූපය 2) වැඩි කිරීමට ගොවියාට හැකි විය. මේ අතර, 50, 80, 90, 100, 120 සහ 150 ppt ජලයෙන් සමන්විත ලුණු පොකුණුවලින් ජල සාම්පල ලබා ගන්නා ලදී. ජල සාම්පල නාරා ආයතනයේ ඇල්ගී රසායනාගාරයට ගෙන එන ලදී. එම ජල සාම්පලවල ඇති ඇල්ගී විශේෂ වෙන්කර රසායනාගාර තත්ව යටතේ වගා මාධ්‍ය තුළ වගා කරන ලදී. වර්තමානයේ, අධිලවණ ජලයෙන්වෙන්කර ගත්ඇල්ගී රසායනාගාරයේ ඔවුන්පෙර විසූ ලවණ ජලය තුළ වගා කෙරේ. ඇල්ගී වගා කිරීම සඳහා ලී රාක්කයක් පුත්තලමේ අදාළ භූමියේදී නිර්මාණය කරන ලදී (රූපය 3). පසුව, රසායනාගාර තත්වයන් යටතේ සංවර්ධිත ඇල්ගී ගොවිපල වෙත මාරු කරනු ලැබේ. ලබා දෙන ඇල්ගී මුල් සාම්පල අනාගතයේ දී තමා විසින්ම පවත්වා ගැනීමට වගාකරුට හැකි වනු ඇත. සංවර්ධිත ඇල්ගී වර්ග භාවිතා කරමින් ආහාර ගැනීමේ රටාව අධ්‍යනය සඳහා පරීක්ෂණයක් ලබන මාසයේ වර්ධනය වන ආටීමියා යොදාගෙන පරීක්ෂා කරනු ලැබේ.

රූපය1.ක්ලෝරෙල්ලා නියැදිය ලබාදීම හා දැනුම ලබාදීම

රූපය 2. එළිමහනේ වගා කරන ලද ඇල්ගී



රූපය 3. ඇල්ගී වගා කිරීම සඳහා නිර්මාණය කරන ලද ලී රාක්කය

කොළ පැහැති මට්ටි අභිජනනය සහ කීටයන් ඇති කිරීමට ප්‍රමිතිගත ක්‍රියාවලි සංවර්ධනය කිරීම සඳහා සිදුකරන ලද අධ්‍යනයකි. මෙය අවසානයේදී හරිත මට්ටි වාණිජමය වගාවට සහාය වන අතර ස්වාභාවික ගහනයට ඇති බලපෑම අඩු කරයි. මීගමුව කලපුවෙන් කොළ මට්ටි සාර්ථකව එකතු කරන ලදී. මෙම ස්ථානය තෝරාගෙන ඇත්තේ එහි සැලකිය යුතු ගහනයක් පවතින නිසා සහ මෙම ප්‍රදේශයේ මට්ටි සඳහා ඇති ඉහළ ඉල්ලුම නිසාය. මුල් අභිජනන පරීක්ෂණ විවිධ ප්‍රතිකාර සමඟ සිදුකර ඇත. එකතු කරන ලද හරිත මට්ටි පැටවුන් බිහිකිරීම දිරිමත් කිරීම සඳහා පාලිත රසායනාගාර තත්ව යටතේ පර්යේෂණය සකස් කරන ලදී. මූලික ප්‍රතිඵලවලින් පෙනීයන්නේ ක්ෂුද්‍ර ඇල්ගී පෝෂණය සමඟින් මට්ටි පාලිත පරිසරයට හොඳින් ප්‍රතිචාර දැක්වූ අතර ගැහැණු සතුන් බිත්තර දැමීමට සාර්ථක ලෙස ප්‍රේරණය වූ බවයි.

තිරසාර කරදිය විසිතුරු කර්මාන්තයක් සංවර්ධනයට දායකවෙමින් cleaner shrimps අභිජනනය සහ කීටයන් ඇති කිරීමට පිහිටුවීම සඳහා අධ්‍යයනයක් සිදුකරන ලදී. cleaner shrimps අනාගත අභිජනන පරීක්ෂණ සඳහා සහාය වීමට සජීවී ආහාර වගා පද්ධතියක් ස්ථාපිතකර දැනට පවත්වාගෙන යනු ලැබේ. ඉස්සන්ගේ කීටයන් සඳහා විශ්වාසනීය සහ උසස් තත්ත්වයේ ආහාර ප්‍රභවයක් සහතික කිරීම සඳහා මූලික වශයෙන් ක්ෂුද්‍ර ඇල්ගී සහ රොටිෆර්වලින් සමන්විත සජීවී ආහාර පාලන තත්ව යටතේ වගා කෙරේ.

ව්‍යාපෘතිය 1.2. ජලජ සම්පත් සංවර්ධනය සඳහා ජෛව තාක්ෂණ ක්‍රම භාවිතයෙන් ඉස්සන් වගා කර්මාන්තය තුළ රෝග කළමනාකරණය හා ඉස්සන් වගා ගොවිපලවලින් වෙන් කර ගත් ඉස්සන් හා ජල සාම්පල වල ප්‍රතිජීවක ප්‍රතිරෝධය පෙන්වන බැක්ටීරියා හඳුනා ගැනීම හා ප්‍රතිජීවක ප්‍රතිරෝධී ජාන හඳුනා ගැනිම.

ශ්‍රී ලංකාවේ ඉස්සන් වගා කර්මාන්තය තුළ රෝග කළමනාකරණ උපාය මාර්ග වැඩි දියුණු කිරීමේ අරමුණින් ඉස්සන් වගාවේ රෝග අධීක්ෂණ කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලදී. මෙමගින් රෝග පැතිරවීම අවමකිරීම හා ඉන් සිදුවන පාඩු අවම කිරීම අරමුණු කරන ලද අතර ඒ හරහා නිෂ්පාදනවල ගුණාත්මක හා ප්‍රමාණාත්මක හානිය යන දෙකම එකවර අවම කිරීම හරහා කර්මාන්තයේ ඉපැයුම් වැඩි කිරීම අරමුණු කරන ලදී. මෙම අධ්‍යනය සඳහා ඉස්සන් වගාව බහුලව සිදු කරනු ලබන වයඹ පළාතේ ඉස්සන් වගා කලාප පහම නියෝජනය වන පරිදි සිදු කරනු ලබයි. ඉස්සන් (*Penaeus vannamei, P. monodon*) සහ ඉස්සන් පොකුණු ආශ්‍රිතව ජීවත් වන ජීවීන් විශේෂ (කකුළුවන්, බෙල්ලන් සහ ගැඩවිලන්) මේ අධ්‍යනය සඳහා යොදාගත් අතර ඉස්සන් සඳහා වැළදෙන රෝග අටක් PCR තාක්ෂණය හරහා පරීක්ෂාවට ලක් කරන ලදී. මීට අමතරව පොකුණු වල ජල තත්වයද, බැක්ටීරියා තත්වයද අධ්‍යනයට ලක්කරන ලදී. ඉස්සන් ගොවිපළ 30කින් ලබාගත් නියැදි මේ යටතේ අධ්‍යනයට ලක්කරන ලදී.

අධ්‍යනය කරන ලද රෝග අට අතරින් කලාප 5හිම නියැදි 59% කම EHP රෝගය වාර්තා විය. මෙම රෝගය *P. vannamei* සහ *P. monodon* විශේෂ දෙකහිම වාර්තා වූ අතර, *P. vannamei* හි සැළකිය යුතු ව්‍යාප්තියක් දක්නට ලැබුණි. EHP රෝගය 23.3%ක ඉහළ ප්‍රතිශතයක් නිරීක්ෂණය කරන ලද්දේ කලාප අංක 03 වන අතර, දෙවන ඉහළ රෝග වාර්තාව 16.66% වූ අතර එය කලාප අංක 02න් වාර්තා විය. මීට අමතරව EHP සඳහා පරීක්ෂා කරන ලද පොකුණු පරිසරයෙන් එකතු කරගත් කකුළුවන්, කූනිස්සන් සහ බෙල්ලන් PCR පරීක්ෂාවේදී ධනාත්මකවූ අතර ඒ අනුව මෙම ජීවීන් EHP රෝග වාහකයන් ලෙස හඳුනා ගන්නා ලදී.

ජල තත්ව පරාමිතීන් පරීක්ෂා කිරීමේදී EHP රෝගය ඇතිවීමේ ප්‍රවණතාවය ඉහළ ලවණතාවය (28-31ppt), අඩු pH අගය(5.7-8.0) සහ ඉහළ ජල උෂ්ණත්වය (31-33°C) සමග සම්බන්ධ වන බව තවදුරටත් අනාවරණය විය. මේ අනුව EHP රෝගය පාලනය කිරීම සඳහා පොකුණු පරිසරයේ pH අගය, ලවණතාවය සහ උෂ්ණත්වය සුදුසු පරාසවල පවත්වා ගැනීම වැදගත් බව ප්‍රතිපල වලින් අනාවරණය විය. එපමණක් නොව ඉස්සන් වගා පද්ධති අතර රෝග පැතිරීම වළක්වා ගැනීම සඳහා එම පොකුණු පද්ධති තුළ සිටින කකුළුවන්, බෙල්ලන් හා කූනිස්සන් වැනි අමතර සතුන් මර්ධනය වැදගත් බවද මෙම අධ්‍යනයෙන් අණාවරණය විය.

ප්‍රතිජීවක ප්‍රතිරෝධය(AMR) යනු ලෝකය පුරාම අවධානය ලබාගත් ගැටළුවක් වන අතර, ප්‍රතිජීවක ප්‍රතිරෝධී බැක්ටීරියා මිනිස් සිරුරට ඇතුළු වී එදිනෙදා නිර්දේශ කරන ප්‍රතිජීවක ඖෂධ සඳහා ප්‍රතිරෝධය

දක්වන ජාන මිනිස් සිරුර තුල ඇති කරනු ලබයි. නව ප්‍රතිජීවක ඖෂධ නිෂ්පාදනය සිදු නොවන බැවින්,දැනට පවත්නා ප්‍රතිජීවක ඖෂධ විවිධ අසාත්මිකතා හා රෝග වලට ප්‍රතිකාර කිරිමට ඇති එකම විකල්පය වේ. මෙම අධ්‍යනය ඉලක්ක කර ඇත්තේ ශ්‍රී ලාංකීය වගා ගොවිපල වල මිනිස් පරිභෝජනය උදෙසා වගා කරන ඉස්සන් ආශ්‍රිත ප්‍රතිජීවක ප්‍රතිරෝධය දක්වන ව්‍යාධිකාරක බැක්ටීරියාඇතිදැයි හඳුනා ගැනීම උදෙසා වේ.

ඉස්සන් සාම්පල 30ක්, ඉස්සන් වගා පොකුණු වලින් රැගෙන හා ජල සාම්පල 10කින් ඊ කෝලයි නියැදි 16ක් හා සැල්මෙනෙල්ලා නියැදි 10ක් හඳුනා ගත් අතර, එම බැක්ටීරියා නියැදි ප්‍රතිජීවක ඖෂධ 5කට ප්‍රතිරෝධයක් දක්වන්නේද නැද්ද යන වග පරීක්ෂා කරන ලදි. එම පරීක්ෂා කල ප්‍රතිජීවක ඖෂධ වන්නේ, ඇමොක්සිලින් (30mlg), ඔක්සිටෙට්‍රාසයික්ලින් (30 mlg), ක්ලොරම්ෆෙනිකොල් (30 mlg) එරිත්රොමයිසින් (10 mlg), ටෙට්‍රාසයික්ලින් (10 mlg). ඉස්සන් සාම්පල වලින් වෙන් කර ගත් ඊ කෝලයි නියැදි 13ක් අතුරින් 53.84% (7/13) ක ප්‍රමාණයක් එරිත්‍රොමයිසින් ප්‍රතිජීවක ඖෂධයට ප්‍රතිරෝධී බව පෙන්වන ලද අතර, 34.86% ක් ඇමොක්සිලින් හා ටෙට්‍රාසයික්ලින් වලට ප්‍රතිරෝධය පෙන්වන ලදි.

ඊ කෝලයි සාම්පල ක්ලෝරම්ෆෙනිකෝල් ප්‍රතිජීවක ඖෂධයට සංවේදී බවක් පෙන්වන ලදි.තවද වගා පොකුණු ජලයෙන් වෙන් කර ගත් ඊ කෝලයි සාම්පල 33.33% කින් එරිත්රොමයිසින් හා ටෙට්රාසයික්ලින් යන ප්‍රතිජීවක ඖෂධවලට ප්‍රතිරෝධය දක්වන බව පෙන්නුම් කෙරින. සියලුම සැල්මොනෙල්ලා නියැදි වල ඉහලම ප්‍රතිරෝධය 44.44% (4/9) කින් එරිත්රොමයිසින් වලට හා 11.11%ක (1/9) අඩුම ප්‍රතිරෝධයක් ටෙට්‍රාසයික්ලින් හා ඇමොක්සිලින් වලට පෙන්වන ලදි.



රූපය 4: බහු ප්‍රතිජීවක ප්‍රතිරෝධය පෙන්වන සැල්මොනෙල්ලා සාම්පලයක්



රූපය 5: බහු ප්‍රතිජීවක ප්‍රතිරෝධය පෙන්වන ඊ කෝලයි සාම්පලයක්

ව්‍යාපෘති අංක 1.3. පරිසර පද්ධතිය මත පදනම් වූ ප්‍රවේශය යටතේ කලපු ගතිකත්වය සහ පරිසර විද්‍යාව ප්‍රතිෂ්ඨාපනය කිරීම සහ ශ්‍රී ලංකාවේ තෝරාගත් කලපු වල මත්ස්‍ය සහ ජලජ ජීවීන් සඳහා ජල තත්ත්ව මාර්ගෝපදේශ සංවර්ධනය කිරීම: හලාවත, පුත්තලම,කොග්ගල සහ නයාරු කලපු පිළිබඳ පූළුල් අධ්‍යයනයක් සිදු කිරීම.

තෝරාගත් කලපුවල ජල තත්ත්ව පරාමිතීන් තක්සේරු කිරීම

හලාවත, පුත්තලම සහ කොග්ගල යන තෝරා ගත් කලපු තුනෙහි ජල තත්ත්ව පරාමිතයන් තක්සේරු කිරීම සඳහා එම කලපු ජලයෙහි ක්ෂුද්‍ර ජීව විද්‍යාත්මක තත්ත්ව, රසායනික සහ භෞතික තත්ත්ව නිර්ණය කිරීම සහ අධ්‍යනය කිරීම සිදු කරන ලදී. විද්‍යාත්මක පර්යේෂණ සඳහා අත්‍යවශ්‍ය වන කලපු ජලයේ රසායනික, භෞතික සහ ක්ෂුද්‍ර ජීව විද්‍යාත්මක තත්ත්ව පිළිබඳ මෑතකාලීන මූලික දත්ත නොමැතිකම මෙම අධ්‍යනයට මූලික සහ ප්‍රධාන හේතුව විය. මෙම කලපු වල ජලය කෙරෙහි කාර්මිකකරණයේ පාරිසරික බලපෑම අවබෝධ කර ගැනීම ඉතා වැදගත් වන අතර එම නිසා මෙම ව්‍යාපෘතිය පාරිසරික අධ්‍යයන අංශය (ESD) සමඟ සහයෝගීතාවය මත සිදු කරන ලදී. එම අංශය මඟින් ජල සාම්පලයන්හි භෞතික හා රසායනික තත්ත්ව පරාමිතීන් ඇගයීමට ලක් කරන ලදී.

ස්ථානීය ජල තත්ත්ව පරීක්ෂාව සහ රසායනාගාර විශ්ලේෂණ මඟින් ජල උෂ්ණත්වය, pH අගය, විද්‍යුත් සන්නායකතාව, පූර්ණ ද්‍රාවිත ඝන ද්‍රව්‍ය ප්‍රමාණය, ලවණතාවය, ද්‍රවිත ඔක්සිජන් ප්‍රමාණය, ආවිලතාව, ජෛව රසායනික ඔක්සිජන් ඉල්ලුම, රසායනික ඔක්සිජන් ඉල්ලුම, ඇමෝනියා, නයිට්‍රයිට්, නයිට්‍රේට්, තෙල් සහ ග්‍රීස් මට්ටම, ක්ලොරොෆිල් -a සාන්ද්‍රණය විශ්ලේෂණය කර නු ලැබේ.

පසු තාක්ෂණ අංශය මගින් විවිධ ස්ථාන **10** කදී එකතු කර ගන්න ලද ජල සාම්පල වලින් මල අපද්‍රව්‍ය තුළ අඩංගු වන කොලිෆෝම් සහ ඊ කෝලයි ගණනය තක්සේරු කරමින් ක්ෂුද්‍ර ජීව විද්‍යාත්මක පරාමිතීන් කෙරෙහි අවධානය යොමු කර අධ්‍යනය සිදු කරන ලදී. ව්‍යාපෘතිය සඳහා නියැදි එකතු කිරීම **2024** ජුනි සිට අගෝස්තු දක්වා මාසවලදී සිදු කරන ලදී.



රූපය 5. - පුත්තලම (වම) සහ කොග්ගල (දකුණ) කලපුවල සාම්පල එකතු කර ගත් ස්ථානයන්

ක්ෂුද්‍ර ජීව විද්‍යාත්මක ප්‍රතිඵල මගින් කලපු තුනෙහිම මල අපද්‍රව්‍ය වල අඩංගු වන කොලිෆෝම් සහ ඊ කෝලයි සඳහා ලබා ගත් අගයන් පුළුල් පරාසයක් තුළ විචලනය වීම පෙන්නුම් කරන ලදී.

පුත්තලම කලපුවේ මල අපද්‍රව්‍ය වල අඩංගු වන කොලිෆෝම් මට්ටම ND සිට 35 MPN/mL දක්වා වූ අතර ඊ කෝලයි මට්ටම ND සිට 25 MPN/mLදක්වා පරාසයක විචලනය වීම පෙන්නුම් කරන ලදී. කොග්ගල කලපුවේ මල අපද්‍රව්‍ය වල අඩංගු වන කොලිෆෝම් මට්ටම 5 MPN/mLසිට 1600 MPN/mL දක්වා වූ අතර ඊ කෝලයි මට්ටම 5MPN/mLසිට 1600 MPN/mL දක්වා පරාසයක පැවතුණි. හලාවත කලපුවේ මල අපද්‍රව්‍ය වල අඩංගු කොලිෆෝම්මට්ටම11 MPN/mL සිට 1800 MPN/mL දක්වා වූ අතර ඊ කෝලයි මට්ටම ND සිට 1600 MPN/mL දක්වා පරාසයක විචලනය විය.

මෙම ව්‍යාපෘතිය අවසානයේදී, නිර්දේශ/මාර්ගෝපදේශ වැඩි දියුණු කිරීම සඳහා, මෙම එකතුකරගත් දත්ත සුදුසු සංඛ්‍යාන ක්‍රමවේද භාවිතයෙන් විශ්ලේෂණය කරනු ඇත. එම ප්‍රතිඵල ප්‍රතිපත්ති සම්පාදන ක්‍රියාපටිපාටි සහ කළපු ජලයේ ගුණාත්මකභාවය පිළිබඳව ඉදිරි පර්යේෂණ කටයුතු සඳහා භාවිතා කරනු ඇත. එමගින් කලපු පරිසර පද්ධතිවල තිරසාරභාවය, ඒ හා සම්බන්ධ ආර්ථික,විනෝදාත්මක සහ සංස්කෘතික වටිනාකම් වැඩි දියුණු කිරීමට සහ පරිසර දූෂණය හා මානව ක්‍රියාකාරකම් අවම කරගැනීමට හැකිවනු ඇත.

ව්‍යාපෘතිය 1.4. සාගරික මත්ස්‍ය ගොවිපල තාක්ෂණය සහ මසුන් ඒකරාශී කිරීමේ ඇටවුම් (FAD) ස්ථාපනය කිරීම තුලින් වෙරළබඩ ධීවර කර්මාන්තය ප්‍රතිස්ථාපනය සහ වැඩිදියුණු කිරීම.

මානව ක්‍රියාකාරකම් සහ දේශගුණික විපර්යාස ගැටලු හේතුවෙන් සිදුවන සාගරික පරිසර විනාශය සමඟ ලොවපුරා වෙරළබඩ ධීවර කර්මාන්තයේ වියැකීයාම මෙන්ම සාගරික පරිසරයේ තිරසාර සංවර්ධනය බරපතල ලෙස අභියෝගයට ලක්ව ඇත. මේ අනුව, පවතින මුහුදු ආහාර ප්‍රභවයන් කොපමණ කාලයක් ලෝක අවශ්‍යතා සපුරාලනු ඇත්ද යන්න පිළිබඳව වැඩි අවධානයක් යොමු වී ඇති අතර, ආහාර සුරක්ෂිතතාව සහතික කිරීම සඳහා ලෝක ආහාර හා කෘෂිකර්ම සංවිධානය (FAO) සංකල්පමය වශයෙන් හඳුන්වා දෙන ලද "නීල/ හරිත වර්ධන" (Blue Growth) සංකල්පය මගින් දේශගුණික විපර්යාස අනුවර්තනයක් ලෙස මෙන්ම ආහාර සුරක්ෂිතතාව සඳහා මත්ස්‍ය ගහන වැඩිදියුණු කිරීම සහතික කිරීම සඳහා වෙරළබඩ ප්‍රදේශවල මත්ස්‍ය ඒකරාශී කිරීමේ ඇටවුම් (FAD) ස්ථාපනය කිරීම සහ සාගරික මින්මැදුරු තාක්ෂණය (Marine Ranching) යෝජනාකර ඇත.

මේ අනුව, නාරා ආයතනයේ ධීවර තාක්ෂණ අංශය විසින් 2024 වර්ෂයේදී ශ්‍රී ලංකාවේ වෙරළබඩ ජලයේ මත්ස්‍ය ඒකරාශී කිරීමේ ඇටවුම් ස්ථානගත කිරීම් සහ ඒවා අධීක්ෂණ වැඩසටහන් ආරම්භ කර ඇති අතර එම වැඩසටහන 2026 වර්ෂය දක්වා ක්‍රියාත්මක වනු ඇත. මේ වන විට නාරා ආයතනය විසින්, අඩි 07 ක් දිගැති හරස්කඩ වර්ගඵලය අඟල් 04 x 04 ප්‍රමාණයේ කොන්ක්‍රීට් තීරු 18බැගින්යොදා ගනිමින් සකසන ලද මුහුදු මින්මැදුරුආකාරයේ කොන්ක්‍රීට්ව්‍යුහයන්හතරක් සහ, පෙර සඳහන් ප්‍රමානයේම කොන්ක්‍රීට් තීරු 24 බැගින් යොදාගත් කොන්ක්‍රීට් ව්‍යුහයන් තුනක් කප්පරතොට මුහුදු ප්‍රදේශයේ ස්ථාපනය කර ඇත. ඒ තුලින් ප්‍රස්තුත මුහුදු පරිසර පද්ධතියේ දැනට අඩු වී ඇති මත්ස්‍ය ගහනයන් නැවත ඒකරාශී කරවීමට සහ ප්‍රදේශයේ ධීවර ප්‍රජාවට ආහාරයට ගත හැකි සහ විසිතුරු මත්ස්‍ය නිෂ්පාදනය (edible & colorfish) වැඩිදියුණු කිරීමට හැකි වන සාගරික පරිසර පද්ධතියක් නිර්මාණය කිරීම මෙන්ම ප්‍රදේශයේ සංචාරක කර්මාන්තය වැඩිදියුණු කිරීමට අපේක්ෂා කෙරෙනු ඇත. තවත් එවැනිම වූ කොන්ක්‍රීට් තීරු කට්ටලයක් මේ වනවිට ඉදිවෙමින් පවතින අතර එය පොල්හේන මුහුදු ප්‍රදේශයේ ස්ථාපනය කිරීමට යෝජිතය. ප්‍රදේශයේ ධීවර ප්‍රජාව සහ කිමිදුම්කරුවන් සමඟ සිදුකරන ලද සාර්ථක දැනුවත් කිරීමේ වැඩසටහන් දෙකකින් පසු මෙම සියලු ස්ථාපනයන් සිදුකරන ලද අතර, ධීවර ප්‍රජාවගේ නිබඳ සහයෝගයද ඒ සඳහා ලැබිණි.

මීගමුව මුහුදු ප්‍රදේශයේ මත්ස්‍ය ඒකරාශී කිරීමේ ඇටවුමක් ලෙස මතුපිට බෝයාවක් යෙදවීමට සැලසුම් කර ඇති අතර, ධීවර දෙපාර්තමේන්තුව සහ එම ප්‍රදේශයේ ධීවර ප්‍රජාව සමඟ බෝයාව යෙදවීම සඳහා සුදුසු ස්ථානයක් තෝරාගැනීම පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහනක් පවත්වන ලදී. යෝජිත බෝයාව දැනට ඉදිවෙමින් පවතී. මේ අතර, ත්‍රිකුණාමලය මුහුදු ප්‍රදේශයේ යල්පැන ගිය වාහන ගිල්වා ඇති ස්ථානය ආශ්‍රිත පරිසර පද්ධතියේ පරිසරානුයෝජනය සහ එහි වත්මන් පරිසර තත්වය නිරීක්ෂණය කිරීම සඳහා නියැදි අවස්ථා දෙකක් සහ දිය යට නිරීක්ෂණය කිරීම්ද සිදු කරන ලදී. තවද, කප්පරතොට සහ පොල්හේන මුහුදු ප්‍රදේශවල අලුතින් යොදවා ඇති මසුන් ඒකරාශී කිරීමේ ඇටවුම් ආශ්‍රිතව තවත් නියැදි එක්රැස් කිරීම් සහ දිය යට නිරීක්ෂණයන් දෙකක් සිදුකරන ලදී. මෙසේ සිදු කරන ලද ක්ෂේත්‍ර නිරීක්ෂණයන් මගින් වැඩිදුරටත් අනාවරණය වුයේ විසිතුරු මසුන් පමණක් නොව, ආහාරයට ගත හැකි මසුන්ගේ ඒකරාශීවීමද මෙම ඇටවුම් ආශ්‍රිතව සැලකිය යුතු ලෙස වර්ධනය වී ඇති බවයි. එසේම මෙම මත්ස්‍ය ඒකරාශි වීම හේතුවෙන් දැනටමත් ප්‍රදේශයේ ධීවර ප්‍රජාව මෙම වැඩසටහන ගැන සිය ප්‍රසාදය පළකර සිටිති.

රූපය 7. ස්ථාපනය කරන ලද මත්ස්‍ය ඒකරාශී කිරීමේ ඇටවුම්

ව්‍යාපෘතිය 1.5: තිත් සහිත මුහුදුකුකුළා (පොතුබරි) මත්ස්‍යයාගේ (*Canthidermis maculatus*) සම භාවිතයෙන් ජෙලටින් නිස්සාරණය කිරීම සහ එහි ලක්ෂණ අධ්‍යනය කිරීම.

ගවමස් හා ඌරුමස් වලින් ලබා ගන්නා වටිනා අතුරු නිෂ්පාදනයක් වන ජෙලටින්, විකල්පයක් ලෙස මත්ස්‍යයන්ගෙන් ද නිස්සාරණය කළ හැක. මෙම අධ්‍යයනයේදී අවධානය යොමු වූයේ මුහුදු කුකුලාගේ සමෙන් ජෙලටින් වෙන් කර විශ්ලේෂණය කර, එය වාණිජමය වශයෙන් ලබාගත හැකි ජෙලටින් සමග සංසන්දනය කිරීම මෙම අධ්‍යයනයේ ඉලක්කය විය. මත්ස්‍යය සමෙන් ජෙලටින් නිස්සාරණය කර ගැනීම සඳහා 0.2M සෝඩියම් හයිඩ්‍රොක්සයිඩ් (NaOH) හා 0.05M ඇසිටික් අම්ලය අඩංගු ද්‍රවයක් භාවිතා කරන ලදී. මත්ස්‍යය සමෙන් නිස්සාරණය කළ ජෙලටින් ප්‍රමාණයආසන්න වශයෙන් 10.35% ක් වූ අතර එහි රසායනික සංයුතිය, භෞතික ලක්ෂණ හා ක්‍රියාකාරි ගුණාංග පිළිබද වැඩිදුර විශ්ලේෂණය සිදු කරන ලදී.

මුහුදු කුකුළා මත්ස්‍යයන්ගෙන් නිස්සාරණය කරගත් ජෙලටින් තුළ ප්‍රෝටීන් 85.25 ±0.75, තෙතමනය 6.25 ±0.03, මේද අන්තර්ගතය 0.57 ±0.11 හා අළු 2.72 ±0.13 අන්තර්ගතවන බව සොයාගන්නා ලදී. වාණිජමය වශයෙන් පවතින ජෙලටින් තුළ ප්‍රෝටීන්86.30 ±1.17, තෙතමනය 10.30 ±0.01, මේද අන්තර්ගතය 0.24 ±0.01 හා අළු 1.14 ±0.10 අන්තර්ගත විය. මුහුදු කුකුළාගේ ජෙල් ශක්තිය 52.67 ±8.39ක් ලෙස ප්‍රමාණය කෙරුණු අතර, එය වාණිජමට ජෙලටින් වලට සාපේක්ෂව (120.70 ±13.80) අඩු විය. දුස්ස්‍රාවිතාවයද මුහුදු කුකුළාගේ 15.51 ± 1.02 ක් ලෙස අඩු අගයක පැවති අතර වාණිජමය වශයෙන් පවතින ජෙලටින් තුළ 17.53 ± 1.08ක් විය. ජලය රදවා ගැනීමේ හැකියාව පිළිබද සලකන විට මුහුදු කුකුළාගේ එය 233.9 ±15.6ක් ලෙස අඩු අගයක පැවති අතර වාණිජමය වශයෙන් පවතින ජෙලටින් තුළ 457.4 ± 1.05ක ඉහළ අගයක පැවතුණි. මුහුදු කුකුළාගේ SSG පෙන්නුම් කරන පරිදි 376.5 ± 43.0ක් වන මේද බන්ධන හැකියාව වාණිජමය ජෙලටින් තුළමේද බන්ධන හැකියාවට වඩා වැඩි අගයක් පෙන්වයි, 258.8 ± 3.92. මුහුදු කුකුලාගේ ජෙලටින් වල නිෂ්පාදන ධාරිතාවය, 66.67 ± 0.00 වාණිජමය ජෙලටින් තුළනිෂ්පාදන ධාරිතාවයට 23.33 ± 4.71 වැඩි අගයක් පෙන්වයි. මෙම අධ්‍යයනය මත පදනම්ව මුහුදු කුකුලාගේ සමෙන් ලබාගත් ජෙලටින් හොද ආදේශකයක් ලෙස භාවිතා කිරීමට හැකියාව ඇති බව තහවුරු විය.



රූපය 8. මුහුදු කුකුළා මත්ස්‍යයන්ගෙන් ජෙලටින් නිෂ්පාදනය කරන පිලිවෙළ

2. සාගර සම්පත් ගවේෂණය සහ තක්සේරු කිරීම (රු.මි.12.70)

ව්‍යාපෘතිය 2.1 & 2.2. ධීවර ස්වාධීන සමීක්ෂණ (ධ්වනි සහ ට්‍රෝල්) සහ R/V සමුද්‍රිකා පර්යේෂණ නෞකාව භාවිතයෙන් සජීවී සාගර සම්පත් පිළිබඳ සාගර විද්‍යාත්මක සමීක්ෂණය

ශ්‍රී ලංකාවේ සමස්ත මත්ස්‍ය ප්‍රමාණයෙන් 60% කට ආසන්න ප්‍රමාණයකට නොගැඹුරු වෙරළබඩ ධීවර කර්මාන්තය දායක වේ. නොගැඹුරු වෙරළබඩ ප්‍රදේශවල කුඩා සාමුද්‍රික මසුන් අධික ලෙස ඇල්ලීම නිසා තර්ජනයට ලක් වී ඇත. මෙම ධීවර කර්මාන්තය ඵලදායී ලෙස කළමනාකරණය කිරීම සඳහා මත්ස්‍ය බහුලත්වයේ වෙනස්කම් අවබෝධ කරගැනීම ඉතා වැදගත් වේ. ධීවර කර්මාන්තය මත යැපෙන දත්ත තොග තක්සේරු කිරීම් සඳහා භාවිතා කර ඇති අතර, ධීවර ආම්පන්න තේරීම සහ අනෙකුත් සාධක හේතුවෙන් ධීවර ස්වාධීන සමීක්ෂණ අවශ්‍ය වේ. ශ්‍රී ලංකාවේ කුඩා සාමුද්‍රික මසුන් සඳහා ස්වාධීන සමීක්ෂණ පිළිබඳ මනාව ස්ථාපිත කාලයක් තිස්සේ එකතු කරන ලද දත්ත (කාල ශ්‍රේණි දත්ත) නොමැත.

මෙම ව්‍යාපෘතිය ධීවර පර්යේෂණවල සැලකිය යුතු හිඩැසක් වන ධ්වනි ක්‍රම භාවිතයෙන් එවැනි දත්ත පද්දතියක් ස්ථාපිත කිරීම අරමුණු කරයි.

ඉස්සන් සහ bycatch ජෛව ස්කන්ධය පිළිබඳ කාලශ්‍රේණි දත්ත කට්ටලයක් ස්ථාපිත කිරීම සඳහා කල්පිටිය ඉස්සන් පිටියේදී අඛණ්ඩව තෙවැනි වරටත් ට්‍රෝල් සමීක්ෂණයක් පවත්වන ලදී. මෙම අධ්‍යයනයේ අරමුණ වූයේ පෙර වසරවලට සාපේක්ෂව වර්තමාන ඉස්සන් තොග තත්ත්වය තක්සේරු කිරීම සහ ඉස්සන් ජෛව ස්කන්ධ මත ට්‍රෝල් තහනමේ බලපෑම විමර්ශනය කිරීමයි. 2022 ට්‍රෝල් තහනමෙන් පසුව විශේෂයෙන් තියුනු පහත වැටීමක් සමඟ, 2008 මූලික මට්ටමේ සිට ඉස්සන් ජෛව ස්කන්ධයේ සැලකිය යුතු අඩුවීමක් පෙන්නුම් කරයි.

2024 දී මුළු ඉස්සන් ජෛව ස්කන්ධය ටොන් 0.146ක් ලෙස ඇස්තමේන්තුකර ඇති අතර, එය 2021 දී වාර්තා වූ ටොන් 1.66 ට සහ 2023 දී ටොන් 0.556 ට වඩා බෙහෙවින් අඩුය. මෙය 2021 ට සාපේක්ෂව 11 ගුණයක අඩුවීමක් සහ 2021 ට සාපේක්ෂව 2023 ට සාපේක්ෂව සිව්ගුණයක අඩුවීමක් නියෝජනය කරයි. අනෙක් අතට, ට්‍රෝල් තහනමෙන් පසුව පෝනිෆිෂ් ජෛව ස්කන්ධයේ විශාල වැඩිවීමක් නිරීක්ෂණය විය. පෝනිෆිෂ් සඳහා නිශ්චිත ජෛව ස්කන්ධ අගයන් විස්තරකර නොතිබුණද, මෙම විශේෂයේ වර්ධනය විභව පරිසර පද්ධති මාරුවක් යෝජනා කරයි. මේ අනුව ට්‍රෝලිං ක්‍රියාකාරකම් නොමැතිකම පෝනිෆිෂ් බෝවීම සඳහා හිතකර පරිසරයක් නිර්මාණය කර ඇති බව පෙනේ.

ඉස්සන් සහ පෝනිෆිෂ් ගහනයේ මෙම ප්‍රතිවිරුද්ධ ප්‍රවණතා සඳහා නිශ්චිත හේතු පැහැදිලි නැත. ට්‍රෝල් තහනම, ඉස්සන් ජෛව ස්කන්ධ අඩුවීමට සහ පෝනිෆිෂ් වැඩිවීමට දායක වන සාධකයක් වන අතර, ජල උෂ්ණත්වයේ වෙනස්වීම්, ලවණතාව හෝ ආහාර ලබාගැනීමේ වෙනස්වීම් වැනි වෙනත් පාරිසරික සාධකද මෙම ජනගහන ගතිකත්වයට බලපෑම් කළ හැකිය. කල්පිටිය ප්‍රදේශයේ සාගර පරිසර පද්ධතියට බලපාන සාධකවල සංකීර්ණ අන්තර් ක්‍රියාකාරිත්වය පැහැදිලි කිරීම සඳහා වැඩිදුර පර්යේෂණ අවශ්‍ය වේ.

මීට අමතරව, පුත්තලම කලපුවේ, විශේෂයෙන්ම කලින් සමීක්ෂණය කරන ලද ඉස්සන් බිම් වලින් පිටත ප්‍රදේශවල පෝනිෆිෂ් බහුලත්වය සහ ව්‍යාප්තිය පිළිබඳව විමර්ශනය කිරීම සඳහා ධ්වනි සමීක්ෂණයක් පවත්වන ලදී. මෙම සමීක්ෂණයේ අරමුණ වූයේ පෙලැජික් මත්ස්‍ය ජෛව ස්කන්ධය සහ බහුලත්වය පිළිබඳ ධීවර - ස්වාධීන දත්ත සැපයීමයි. කලක් ඉස්සන් මසුන් ඇල්ලීම සඳහා මූලික වශයෙන් ප්‍රසිද්ධියටපත් පුත්තලම කලපුව 2017 දී ට්‍රෝල් තහනමක් පැනවීමෙන් පසු සැලකිය යුතු පාරිසරික වෙනස්කම් වලට භාජනය වී ඇත. ට්‍රෝලිං නොමැතිකම හේතුවෙන් පෝනිෆිෂ් ගහනය ඉහළ ගොස් ඇති අතර පර්යේෂණ අවධානය යොමු කිරීම අවශ්‍ය වේ. මෙම ධ්වනි සමීක්ෂණය මෙම මසුන් අධ්‍යයනය කිරීම සඳහා නව ප්‍රවේශයක් නියෝජනය කරයි.

සමීක්ෂණය මූලික වශයෙන් ඉලක්ක කර ඇත්තේ ලන්දේසි බොක්ක ඇතුළු කලපුවේ ගැඹුරු උතුරු කොටසයි. ඇස්තමේන්තුගත සම්පූර්ණ පෝනිෆිෂ් ජෛව ස්කන්ධය ටොන් 101.05 දක්වා ළඟා වූ අතර, 0.35 ක විචල්‍ය සංගුණකයක් සමඟ, සංකීර්ණ සමුද්‍ර පරිසර පද්ධතිය සහ ධ්වනි සමීක්ෂණවල ආවේනික අභියෝග බහුල ඇස්තමේන්තුවල නිරවද්‍යතාවය සීමා කරයි.

මෙම සොයාගැනීම්වල විද්‍යාත්මක අගය වැඩිදියුණු කිරීම සඳහා, ඵලදායී ධීවර කළමනාකරණය සහ පරිසර පද්ධති අධීක්ෂණය සඳහා ශක්තිමත් කාලශ්‍රේණි දත්ත කට්ටලයක් ස්ථාපිත කිරීම සඳහා වාර්ෂික ධ්වනි සමීක්ෂණ නිර්දේශ කරනු ලැබේ. පොනිෆිෂ් ගහනයේ ගතිකත්වය සහ අනෙකුත් විශේෂ සමග ඔවුන්ගේ අන්තර්ක්‍රියා අවබෝධ කර ගැනීමෙන්, පුත්තලම කලපුවේ පාරිසරික සෞඛ්‍යය සහ තිරසාර ධීවර භාවිතයන් සමතුලිත කිරීමට තීරණගත හැකිය.

ව්‍යාපෘතිය 2.3: මසුන් ගැවසෙන ප්‍රදේශ පිළිබඳ පුරෝකථන සහ ධීවර තොරතුරු සේවාව

ධීවර කටයුතු සඳහා සුදුසු මසුන් බහුල ධීවර ප්‍රදේශ හඳුනා ගැනීම, අක්වෙරළ/මහ මුහුදේ ධීවර කටයුතු ප්‍රශස්ත කිරීම සඳහා අත්‍යාවශ්‍ය වේ. මෙම ව්‍යාපෘතියේ මූලික අරමුණ වන්නේ බහුදින ධීවර යාත්‍රා සඳහා ටූනා මසුන් ඇල්ලීමේ විභවයන් පිළිබඳ තොරතුරු ලබා දීමෙන් ආර්ථික හා කාල කාර්යක්ෂමතාව ඉහළ නැංවීමයි. මෙම ව්‍යාපෘතිය මගින් කෙලවල්ලා මසුන් සඳහා පුරෝකථන 89 සහ බලයා මසුන් සඳහා පුරෝකථන 79 නිර්මාණය කර, ඊමේල්, දුරකථන සහ WhatsApp හරහා බෙදාහරින ලදී. ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව විසින් සිදුකරනු ලබන ගැඹුරේ එළන මරුවැල් පන්නයක් හඳුන්වාදීමේ

පරීක්ෂණයට සහාය වීම සඳහා 2024 ජූලි 12 සිට ඇස්ගෙඩි කෙලවල්ලා සඳහා නව මසුන් ගැවසෙන ප්‍රදේශ පිළිබඳ පුරෝකථන සකස්කර ක්‍රියාත්මක කරන ලදී. මෙම සියලු උපදේශන සේවාවන් සෘජුවම WhatsApp ග්‍රාහකයින් 900 ක් පමණ සහ විද්‍යුත් තැපැල් ග්‍රාහකයින් 380කට බෙදාහරින ලද අතර සහ අමතරව ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව විසින් SSB රේඩියෝ මධ්‍යස්ථ හරහා විකාශය කෙරේ. ධීවර බිම් උපදේශන වැඩි දියුණු කිරීම සඳහා 2024 අගෝස්තු 31 වන විට මත්ස්‍ය සහ ස්ථානීය දත්ත රැස් කිරීම සඳහා උෂ්ණත්ව ගැඹුර පටිගත කරන (TDR) සංවේදක දත්ත රැස්කිරීමේ කටයුතු ක්‍රමයෙන් ඉදිරියට ගොස් ඇති අතර ඉලක්ක 8න් 3 අවසන් කර ඇත. බහුදින ධීවර යාත්‍රාවල ප්‍රධානීන් සහ හිමිකරුවන් අතර නාරා බහුදින යාත්‍රා සඳහා මසුන් ගැවසෙන ප්‍රදේශ පිළිබද පුරෝකථනය පිළිබඳව දැනුවත් කිරීම ව්‍යාපෘතියේ සාර්ථකත්වය සඳහා ඉතා වැදගත් වේ. දික්ඕවිට, බේරුවල, අම්බලන්ගොඩ, හික්කඩුව, ගාල්ල, මිරිස්ස, දෙවිනුවර, සුදුවැල්ල, නිල්වැල්ල, කුඩාවැල්ල, තංගල්ල, හම්බන්තොට, වාලවේනයි, ත්‍රිකුණාමලය ධීවර වරායන් ඇතුළු ස්ථාන කිහිපයක දැනුවත් කිරීමේ වැඩසටහන් 11ක් (ඉලක්කය 16) බහුදින ධීවර යාත්‍රා හිමියන් සහ ධීවරයින් ඉලක්කකර පවත්වන ලදී. මෙහිදී සිංහල සහ දෙමළ භාෂාවලින් දැනුවත් කිරීමේ පත්‍රිකා බෙදාහැරීමද සිදුකරන ලදී. එක් විද්‍යාඥයෙකු පමණක් ව්‍යාපෘතියට සම්බන්ධවීම සහ අතිරේක විද්‍යාඥයින් සහ පර්යේෂණ සහායකයිනගේ ඌනතාවය හේතුවෙන් නාරා හි මසුන් ගැවසෙන ප්‍රදේශ පිළිබඳ පුරෝකථන හැකියාව ඉතා අවදානමට ලක්ව ඇත. ව්‍යාපෘතියේ තිරසාර සාර්ථකත්වය සඳහා මෙම අභියෝගවලට මුහුණදීම ඉතා වැදගත් වේ.



රූපය 9: මාසිකව නිකුත් කරන ලද මසුන් ගැවසෙන ප්‍රදේශ පිළිබඳ පුරෝකථන ඉලක්ක සමඟ සංසන්දනය කිරීම; (වම) කෙලවල්ලා, (දකුණ) බලයා

3. නාරා ආයතනය සතුව පවතින 'සමුද්‍රිකා' පර්යේෂණ නැව භාවිතා කරමින් අජීවී සාගර සම්පත් පිළිබඳ සාගර විද්‍යාත්මක සමීක්ෂණය (රු.මි.9.60)

ව්‍යාපෘතිය 3.1: අජීවී සම්පත් ගවේෂණය සහ තක්සේරු කිරීම

ශ්‍රී ලංකාව නාවික සැතපුම් 200 ක් දක්වා වූ සුවිශේෂී ආර්ථික කලාපයක් සහිත දූපත් රාජ්‍යයක් වනඅතර, එය භූමි ප්‍රමාණය මෙන් අට ගුණයකි. එබැවින් ආර්ථික වශයෙන් වැඩි ඉල්ලුමක් පවතින මූලද්‍රව්‍ය සැපයීමේ හැකියාවක් ශ්‍රී ලංකාව සතුව පවතී. කෙසේ වෙතත්, මහාද්වීපික තටකයේ සහ වෙරළ තීරයේ ඇති අධික ඛනිජ විභවයන් සඳහා ශ්‍රී ලංකාව අඩු අවධානයක් යොමු කර ඇත . මෙම සමීක්ෂණය මගින් නිරිතදිග සහ බටහිර වෙරළ තීරයේ අක්වෙරළ (offshore) සහ ප්‍රධාන ගංගා ආශ්‍රිතව ඉල්මනයිට්, රූටයිල්, සර්කෝන් සහ මොනසයිට් වැනි බැර ඛනිජ විභවයන් පිළිබඳ අධ්‍යයනය කිරීමට අදහස් කෙරේ. එබැවින්, මෙම අධ්‍යයනයේ අරමුණ වන්නේ නාරා ආයතනය සතුව පවතින පර්යේෂණ යාත්‍රාව වන 'සමුද්‍රිකා' උපයෝගී කර ගනිමින් ශ්‍රී ලංකාවේ නිරිතදිග / දකුණු වෙරළ තීරයේ සහ අක්වෙරළ (offshore) ප්‍රදේශවල බැර ඛනිජ ව්‍යාප්තිය පිළිබඳ පුළුල් ගවේෂණයක් සිදු කිරීමයි.

රූපය 10: මුහුදු පතුල ඛනිජ විභවයන් සඳහා Vibro-corerභාවිතා කිරීම (වම) විශ්ලේෂණය සිදු කරන ප්‍රදේශය (දකුණ)

මෙම සාගර විද්‍යාත්මක සමීක්ෂණයට අමතරව, එම ප්‍රදේශවල පවතින ව්‍යාපෘති සඳහා ඉඩම් ගොඩකිරීම් (Port city වැනි) සඳහා වැඩි ඉල්ලුමක් පවතින බැවින් අක්වෙරළ වැලි කැණීම් වැඩි වශයෙන් සිදු කෙරේ. ශ්‍රී ලංකාවේ බටහිර වෙරළට ආසන්න වෙරළ තීරයක අක්වෙරළ වැලි කැණීමේ බලපෑම පිළිබඳව මෙම ව්‍යාපෘතිය යටතේ විමර්ශනයට ලක් කෙරේ.

කෙසේ වෙතත්, නියාමනය සඳහා වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අනුව ගැඹුර මීටර් 15 ට අඩු සහ වෙරළ තීරයේ සිට කිලෝ මීටර 2 කට අඩුදුරක් ඇති ප්‍රදේශවල පතල් කැණීමට අවසර නොදෙන බවයි. ප්‍රායෝගිකව, උපරිම ක්‍රියාකාරී ගැඹුර ඉක්මවනවිට සහ කැණීම් ස්ථානය වෙරළට ඈතින් පිහිටි විට අක්වෙරළ වැලි කැණීම ආර්ථික වශයෙන් වඩාත් දුෂ්කරය. එබැවින් ශ්‍රී ලංකාවේ ජලය තුල වැලි කැණීමේ උපාය මාර්ගයක් සකස් කළ යුතු අතර, කැණීම් ස්ථාන (දුර සහ ගැඹුර) සහ ප්‍රමාණ (වැලි පරිමාව/උප මතුපිට ස්ථර) පිළිබඳ සැලකිළිමත් විය යුතුය.

2024 අප්‍රේල් මාසයේදී 'සමුද්‍රිකා'පර්යේෂණ යාත්‍රාව නොමැති වීම හේතුවෙන් සමීක්ෂණය සිදු කිරීමට නොහැකි විය. සමීක්ෂණය 2024 ඔක්තෝම්බර් මාසයට නැවත යොදා ඇත.

ව්‍යාපෘතිය 3.2: ශ්‍රී ලංකාවේ දකුණු සිට ගිනිකොන දිග වෙරළබඩ ප්‍රදේශයේ බැර ඛනිජ සංචිත ප්‍රමාණනය කිරීම

ගාර්නට් යනු ශ්‍රී ලංකාවේ ගිනිකොනදිග වෙරළ තීරයේ බහුලව දක්නට ලැබෙන සුප්‍රසිද්ධ ඛනිජයකි. මෙම අධ්‍යයනයේ අරමුණ වන්නේ ගාර්නට් සහ අනෙකුත් බැර ඛනිජ වර්ග සහ ඒවායේ ඍතුමය වශයෙන් වෙනස්කම් ප්‍රමාණනය කිරීමයි.

2024 මාර්තු සිට අප්‍රේල් දක්වා කාලය තුළ වෙරළාසන්න ප්‍රදේශ කිහිපයක සහ සහ මුහුදු වෙරළේ වැලි නියැදීම සිදු කරන ලදී. මෙහි ලබා ගන්න ලද core සාම්පල 0.3cm, 0.7 cm සහ 1m ලෙස කොටස්වලට වෙන් කරගන්න ලදී. මෙම සාම්පල වල ඇති කොරල් කැබලි, සිප්පිකටු ආදිය ඉවත් කිරීම සඳහා NaOHසහ HCl සමග ප්‍රතික්‍රියා කරවන ලදී. පසුව ගුරුත්වාකර්ෂණ වෙන් කිරීම සඳහා සාම්පල panned කරන අතර වෙන් කරන ලද සාම්පල අන්වීක්ෂයක් මගින් නිරීක්ෂණය කරන ලදී.
මෙම ව්‍යාපෘතිය මගින් ආවරණය කරන ලද භූමි ප්‍රමාණය 30m X 6 Km වූ අතර ගැඹුරු මුහුදේ 25 km^2 ක ප්‍රමාණයක් ආවරණය වන පරිදි සාම්පල ලබා ගැනීම සිදු විය. මෙසේ ඉහත සඳහන් ක්‍රමවේදයන්ට අනුව වෙන් කරන ලද සාම්පල වල බැර ඛනිජ කොටස "mineral pan" භාවිතයෙන් වෙන් කරන ලදී. නියැදි වෙන් කිරීම තවමත් සිදුවෙමින් පවතින අතර එබැවින් කිසිදු නිගමනයකට එළඹිය නොහැක. - කිරින්ද offshore හි ලබාගත් grab සාම්පල ද තවමත් විශ්ලේෂණය සඳහා සූදානම් වෙමින් පවතී.

රූපය 11: මූලික සාම්පලයෙන් වෙන්කරන ලද සාම්පල

4. දේශගුණික විපර්යාස ධීවර හා ජලජීවී වගාවට බලපෑම් (රු.මි.4.50)

4.1. මුහුදු මට්ටම නිරීක්ෂණය සහ සාගර අනාවැකි

මුහුදු මට්ටම නිරීක්ෂණය කිරීම

වෙරළබඩ සංවර්ධනය, දේශගුණික විපර්යාස බලපෑම සහ සාගර පදනම් වූ අනතුරුදායක තත්ත්වයන් සඳහා වැදගත් දත්ත සපයයි. දැනට ත්‍රිකුණාමලය, පේදුරුතුඩුව, කොළඹ, මිරිස්ස සහ හම්බන්තොට යන ප්‍රදේශවල ස්වයංක්‍රීය මුහුදු මට්ටම නිරීක්ෂණ මධ්‍යස්ථාන පහක් ක්‍රියාත්මක වේ. දෙවුන්දර මුහුදු මට්ටම නිරීක්ෂණ මධ්‍යස්ථාන ඉදිකිරීම සඳහා කටයුතු ක්‍රියාත්මක වන අතර 2024 සැප්තැම්බර් මාසයේදී

සම්පූර්ණයෙන්ම ඉදිකර අවසන් කිරීමට නියමිතය. හම්බන්තොට ධීවර වරායේ මුහුදු මට්ටම නිරීක්ෂණ මධ්‍යස්ථාන ඉදිකිරීම සඳහා ඉඩම් වෙන්කරවා ගැනීම සම්පූර්ණ කර ඇත. ආපදා කළමණාකරණ මධ්‍යස්ථානය වෙත මුහුදු මට්ටම ආශ්‍රිත විනාශකාරී විනාශකාරී අනතුරු ඇඟවීම් වාර්තා 6ක් නිකුත් කරන ලදී. මාසික මුහුදු මට්ටම දත්ත නිෂ්පාදන කර නාරා වෙබ් පිටුව ඔස්සේ නිකුත් කරන ලදී.

රූපය 12: දෙවුන්දර ධීවර වරායේ අලුතින් ඉදිකරන ලද මුහුදු මට්ටමේ නිරීක්ෂණ

ව්‍යාපෘති අංක 4.2 : හදිසි අධ්‍යයනයන් සිදු කිරීම සහ ජාතික වශයෙන් වැදගත් පරිසර තක්සේරු විමර්ශනය කිරීම, ඇගයීම

පාරිසරික හදිසි අවස්ථාවක් යනු, ස්වාභාවික තාක්ෂණික හෝ මානව ප්‍රේරිත සාධක නිසා ඇතිවන හදිසි ව්‍යවසනයක්, දරුණු පාරිසරික හානියක්, මිනිස් ජීවිත හෝ දේපළ හානියක් හෝ මේවායේ එකතුවකි.

උදා :- හදිසි මත්ස්‍ය මියයෑම
තෙල් කාන්දුවීම්
රසායනික අනතුරු
මතුපිට හෝ භූගත ජල දූෂණය
හානිකර ඇල්ගී වර්ධනය වීම්

මෙම සිදුවීම් වල බලපෑම් දිර්ඝකාලීන විය හැකි නිසා ඒවායේ හානිය අවම කරගැනීමට වහාම පියවර ගත යුතුය. මෙම ව්‍යාපෘතිය මගින් එවැනි හදිසි අවස්ථා 10ක් පිලිබඳව (මුන්දලම කළපුව, තොණ්ඩ මනාරු කළපුව, වැලි ඔය, මුතූර්, කොට්ටාව දිය මංකඩ සහ මිරිස්ස යන ස්ථාන වල සිදු වූ හදිසි මත්ස්‍ය මියයෑම්, මන්නාරම, කිලිනොච්චි කිරංචි සහ යාපනය ප්‍රදේශ වල මුහුදු කූඩැල්ලන් වගා කිරීමේ ගොවිපළ ඇගයීම්, වලෙයි කළපුව සහ අම්බලන්ගොඩ යන කළපු සමීක්ෂණය කිරීම් NARA (නාරා) ආයතනයේ සියලු තාක්ෂණික අංශයන් එක්ව පරීක්ෂණ සිදු කර ඇත. එමෙන්ම අවශ්‍යතාවය මත වැඩි දුර පරීක්ෂා සඳහා අවශ්‍ය ජලය, ප්ලවාංග, අවසාධිත හෝ මත්ස්‍ය නියැදි එකතුකර ගනු ලැබේ. මෙම අධ්‍යයන කටයුතු සඳහා ස්ථානීය පරීක්ෂණ, රසායනාගාර විශ්ලේෂණ වලට අමතර තොරතුරු එක්රුස් කිරීම සඳහා සංසිද්ධි මත පදනම් සමීක්ෂණ, ප්‍රශ්නාවලි , කණ්ඩායම් සාකච්ඡා ආදී ගුණාත්මක පර්යේෂණ ක්‍රම යොදාගෙන ඇත. අවශ්‍ය පරීක්ෂණ සිදුකිරීමෙන් පසු සියළු වාර්තා හා නිර්දේශ (හදිසි තත්වය අවම කිරීම පිළිබඳව) අදාළ බලධාරීන්ව ලබාදෙනු ලැබේ.

5. ජාතික සිතියම් වැඩසටහන (රු.මි.17.50)

ව්‍යාපෘතිය 5.1. "කොළඹ සිට වැලිගම" දක්වා නාවික සිතියමින් ආවරණය වන ප්‍රදේශය සඳහා නාවික සිතියම් නිර්මාණය හා GEBCO (General Bathymetric Chart of the Oceans) / නිපොන් පදනම යටතේ ක්‍රියාත්මක "Sea Bed 2030" ව්‍යාපෘතියට සමගාමීව සමූහ මූලාශ ජලශාස්ත්‍රීය දත්ත ගබඩාවක් සහ මාර්ගගත දත්ත (online data) සැකසීමේ ඒකකයක් ස්ථාපිත කිරීම

ඉන්දියන් සාගරයේ කේන්ද්‍රීය ස්ථානයක පිහිටා ඇති දූපත් රාජ්‍යයක් වීම නිසා නිල් ආර්ථික උපාය මාර්ගයක් අනුගමනය කිරීම ශ්‍රී ලංකාවට අනිවාර්ය අවශ්‍යතාවයක් වේ. නාරා ආයතනයේ ජාතික ජලශාස්ත්‍රීය කාර්යාලය නාවික සිතියම් නිර්මාණය කිරීම මගින් ශ්‍රී ලංකාව අවට මුහුදේ ආරක්ෂාව වැඩි දියුණු කිරීම, සමුද්‍රීය පරිසරයේ ආරක්ෂාව වැඩි කිරීම සහ වඩාත් කාර්යක්ෂම සහ ආරක්ෂිත සමුද්‍රීය ප්‍රවාහනය සඳහා ප්‍රමුඛ ජාතික සංවර්ධන කටයුතු ප්‍රවර්ධනය කිරීම සිදු කරයි. නාවික සිතියම් නිර්මාණය

කර තිබීම නාවික ගමනාගමනයේ ආරක්ෂාව සහ සාගර සම්පත් සාමකාමී සහ තිරසාර ලෙස භාවිතා කිරීම ප්‍රවර්ධනය කරයි.



රූපය 13. නාවික සිතියම් නිර්මාණය කරනු ලබන මුහුදු තීරය

ව්‍යාපෘතිය 5.2. ජාතික ආර්ථිකය වැඩි දියුණු කිරීමේ සඳහා කරනු ලබන ජලශාස්ත්‍රීය සහ භූවිද්‍යාත්මක අධ්‍යයනයන්

කලපු සංවර්ධන වැඩසටහන්



රූපය 14. චලෙයි කලපුවේ ජල හුවමාරුව වැඩි දියුණු කිරීම සඳහා සිතියම් නිර්මාණය කිරීම

රට තුළ සමුද්‍රික ජලජීවී වගාව ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් නාරා ආයතනය මගින් උතුරු අර්ධද්වීපයේ පමණක් සුදුසු මුහුදු ප්‍රදේශ හෙක්ටයාර 5,000ක් හඳුනාගෙන ඇති අතර මුහුදු කූඩැල්ලන් සහ මුහුදු පැලෑටි වගාව සඳහා සුදුසු මුහුදු ප්‍රදේශයන් හඳුනාගෙන සීමා මායිම් සලකුණු කර වගාවන් කරගෙන යාම සඳහා ලබා දීමට කටයුතු කර ඇත (වගුව 1).



රූපය 15. මුහුදු පැලෑටි වගාව සඳහා වලෙයිපාඩු ප්‍රදේශයේ හඳුනාගනු ලැබූ මුහුදු තීරයන්

වගුව 1. කිලිනොච්චි දිස්ත්‍රික්කය තුළ සමුද්‍රික ජලජීවී වගාව සඳහා හඳුනාගනු ලැබූ සුදුසු මුහුදු ප්‍රදේශයන්

මුහුදු කුඩැල්ලන් සහ මුහුදු පැලැටි වගාබිම් (ජනවාරි 1- අගෝස්තු 31, 2024)			
	ප්‍රදේශය	සැළසුම් කරන ලද කොටස්	සීමා ලකුණු කරන ලද කොටස්
මුහුදු පැලැටි බිම් කොටස්	වලෙයිපාඩු	363	201
මුහුදු කුඩැල්ලන් වගා බිම් කොටස්	නාච්චිකුඩා	24	24
	කිරන්චි (2)		22
	කිරන්චි (3)	191	128
	පල්ලිකුඩා		13
මුළු මුහුදු කුඩැල්ලන් වගා බිම් කොටස්			**187**

විශේෂ ව්‍යාපෘතින්

i. ඔලුවිල් වරාය

ඔලුවිල් වරායේ වැලි ගොඩවීම සම්බන්ධයෙන් පුළුල් විද්‍යාත්මක අධ්‍යයනයක් කරන ලෙස ධීවර අමාත්‍යාංශය නාරා ආයතනයෙන් කරන ලද ඉල්ලීමට අනුව 2024 ජූලි 18 සිට ජූලි 24 දක්වා කාලය තුළ ඔලුවිල් වරායේ ජලශාස්ත්‍රීය අධ්‍යයනයක් සිදු කර ඇත. සිතියම්ගත කිරීමේ කටයුතු සිදු වෙමින් පවතී.

රූපය 16. ඔලුවිල් වරායේ ජලශාස්ත්‍රීය සහ භූවිද්‍යාත්මක අධ්‍යයනය

ii. සීපාස් ව්‍යාපෘතිය (CEFAS) යටතේ කැළණි ගඟේ සිදුකරන ලද ජලශාස්ත්‍රීය සහ භූවිද්‍යාත්මක අධ්‍යයනය

සීපාස් ව්‍යාපෘතිය යටතේ කැළිකසළ එකතුකිරීම සඳහා උපකරණයක් සවි කිරීම සඳහා කැළණි ගං මෝයෙන් ආරම්භ කර ගං මෝයේ සිට රට අභ්‍යන්තරයට කැළණි ගඟ දිගේ කි.මී 10ක් දුරක් දක්වා ජලශාස්ත්‍රීය සමීක්ෂණයක් සිදු කර ඇත.

රූපය 17. කැළණි ගගේ ජලශාස්ත්‍රීය සිතියම

6. සමාජ ප්‍රතිලාභ සඳහා තොරතුරු බෙදා හැරීම (රු.මි.11.03)

ව්‍යාපෘතිය 6.1: ශ්‍රී ලංකාවේ සාමුද්‍රික ධීවර කර්මාන්තයේ ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව ගුණාත්මක වැඩ පිළිවෙත් සහ හිදැස් විශ්ලේෂණය කිරීම සහ නාරා ධීවර තොරතුරු මධ්‍යස්ථානය

ගුණාත්මක වැඩ පිළිබඳ දෘෂ්ටිකෝණය ඉතා වැදගත් වන අතර එය පුළුල් පරාසයක කර්මාන්තයේ ශ්‍රම ගැටළු සහ ධීවර සුරක්ෂිත සේවා කොන්දේසි විශ්ලේෂණය කිරීමට ඉඩ සලසයි. රැකියා සහ ව්‍යවසාය සංවර්ධනය, සමාජ ආරක්ෂණය, ප්‍රමිතීන් සහ රැකියාවේ අයිතිවාසිකම් ප්‍රවර්ධනය කිරීම සහ සමාජ සංවාදය ගුණාත්මක වැඩ පිළිබඳ සංකල්පයේ මූලික කරුණු 4 වශයෙන් ජාත්‍යන්තර කම්කරු සංවිධානය විසින් පෙන්වාදෙයි. ඒ අනුව ශ්‍රී ලංකාවේ සාගර හා ධීවර කර්මාන්තයේ ගුණාත්මක/ යහපත් වැඩ පිළිවෙත් සහ හිදැස් හඳුනා ගැනීම සඳහා සමාජ-ආර්ථික හා අලෙවි පර්යේෂණ අංශය මගින් මෙම පර්යේෂණය සිදු කරයි. මීගමුව, මඩකලපුව, මාතර, යාපනය සහ පුත්තලම යන සාමුද්‍රික ධීවර දිස්ත්‍රික්ක පහක සියලුම ධීවර යාත්‍රා කාණ්ඩ මෙහෙයවන ධීවර නියමුවන් සහ ධීවරයින්ගෙන් මූලික දත්ත රැස් කරන ලදි. ධීවර කර්මාන්තයේ යහපත් වැඩ පිළිවෙත් පිළිබඳ ධීවරයින්ගේ සංජානනය සහ ඒ සඳහා ඇති බාධාවන් හඳුනා ගැනීමට මීගමුව, මඩකලපුව, යාපනය සහ පුත්තලම ධීවර දිස්ත්‍රික්කවල දැනුවත් කිරීමේ වැඩසටහන් හතරක් පවත්වන ලදී. දත්ත රැස් කිරීමේ ක්‍රියාවලියේදී, ධීවරයින් බහුතරයක් මසුන් ඇල්ලීමේ කටයුතු සිදු කිරීමේදී බෝට්ටුවේ සෞඛ්‍ය සහ ආරක්ෂක පහසුකම් පිළිබඳව සෑහීමකට පත් නොවන බව පර්යේෂක කණ්ඩායම විසින් හඳුනා ගන්නා ලදි. සාමුද්‍රික ධීවර නියමුවන් සහ ධීවරයන් ඔවුන්ගේ ශ්‍රමය ඵලදායී බව විශ්වාස කරන නමුත් ඔවුන් සිය ජීවිතය වැඩි දියුණු කිරීමට ප්‍රමාණවත් ආදායමක් නොලබන බව විශ්වාස කරයි. තවද ගැඹුරු සම්මුඛ සාකච්ඡා සහ සහභාගිත්ව ගැමි පිවිසුම (PRA) මගින් අනාවරණය වූයේ වෘත්තීය සුරක්ෂිතභාවය සහ සෞඛ්‍යය පහසුකම් ප්‍රමාණවත් නොවීම, සමාජ ආරක්ෂණය සහ දුක්ගැනවිලි විසඳීමේ යාන්ත්‍රණයන් අවම වීම, ඉන්ධන මිල අධික වීම, ධීවර ආම්පන්නවල අධික පිරිවැය, නීතිවිරෝධී, වාර්තා නොකළ සහ නියාමනය නොකළ මසුන් ඇල්ලීම සහ ධීවර කර්මාන්තයේ අවිනිශ්චිතතාවයේ ස්වභාවය ශ්‍රී ලංකාවේ සාමුද්‍රික ධීවර කර්මාන්තයේ ගුණාත්මක වැඩ පිළිවෙත් පවත්වා ගෙන යාමට හේතුවන ප්‍රධාන බාධක වේ.

ජලජ සම්පත් තිරසාර කළමනාකරණය සඳහා ඵලදායී තොරතුරු හුවමාරු කිරීම වැදගත් වේ. නාරා ධීවර තොරතුරු මධ්‍යස්ථානය (FIC) ස්ථාපිත කර ඇත්තේ ධීවර ආශ්‍රිත ගැටලු පිළිබඳ කාලෝචිත හා නිවැරදි තොරතුරු සැපයීම සඳහාය. මෙම වසරේ අගෝස්තු මාසය වන විට නාරා ධීවර තොරතුරු මධ්‍යස්ථානයෙහි (FIC) ක්ෂණික ඇමතුම් අංකය හරහා විවිධ ප්‍රතිචාර දැක්වූවන්ගෙන් සම්පූර්ණ විමසුම් 37ක් ලැබී ඇත. නාරා ආයතනයේ විද්‍යාඥයින් සහ රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතනවල නිලධාරීන්ගේ සහය ඇතිව ලැබුණු සියලු විමසීම් සාර්ථකව විසඳා ඇත. ධීවර අංශයේ පාර්ශවකරුවන් අතර තොරතුරු මධ්‍යස්ථානය ප්‍රවර්ධනය කිරීම සඳහා මීගමුව, හලාවත, දික්ඕවිට, කල්පිටිය සහ වාලච්චේන ධීවර වරායන්හි බැනර් 5ක්, අත් පත්‍රිකා 200 ක් සහ පෝස්ටර් බෙදා හරින ලදි. නාරා ධීවර තොරතුරු මධ්‍යස්ථානය (FIC) මගින් තීරණාත්මක තොරතුරු සැපයීමෙන් සහ ප්‍රශ්න කාර්යක්ෂමව විසඳීමෙන් ධීවර ප්‍රජාවගේ සහ අනෙකුත් ප්‍රතිචාර දැක්වූවන්ගේ අවශ්‍යතා සපුරාලීමට සාර්ථකව කටයුතු කර ඇත.

රූපය 18. ඉලක්කගත කණ්ඩායම් සමග සිදුකරනු ලැබූ සම්මුඛ සාකච්ඡා

ප්‍රාදේශීය පර්යේෂණ මධ්‍යස්ථානයන් මගින් ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘතීන්

7. ප්‍රාදේශීය පර්යේෂණ මධ්‍යස්ථානය- කප්පරතොට (රු.මි.2.50)

ව්‍යාපෘතිය 7.1: මරුවැල් පන්නයට හසුවන කෙලවල්ලන් සමුද්‍ර ක්ෂීරපායින් විසින් කා දැමීම වැළැක්වීම සඳහා විකර්ශක පින්ගර් භාවිතයේ යෝග්‍යතාවය අධ්‍යනය සහ සමුද්‍ර සහ ධීවර කර්මාන්තය අතර අන්තර් ක්‍රියාකාරකම් පිළිබඳ අධ්‍යනය

මරුවැල් පන්නයට හසුවන වටිනාකමින් වැඩි මත්ස්‍ය විශේෂ වෙනත් විශේෂයන් විසින්ගොදුරුකරගැනීම සමුද්‍රීය මරුවැල් පන්නයේ යෙදෙනෙ ධීවර ප්‍රජාවට මහත් අභියෝගයකි. මෙම ගැටලුව නිසා ආර්ථික හානි, විලෝපිකයින් විසින් කාදැමීම නිසා අස්වැන්න වර්තානොවීම, එමෙන්ම ගොදුරුකර ගැනීමට පැමිණෙන විලෝපික විශේෂ කොකුවල පැටලීමේ අවධානම යන කාරණා තිරසාර ධීවර කර්මාන්තයක් පවත්වාගැනීම කෙරෙහි බලපෑම් ඇති කරයි.මෙම අධ්‍යයනයේ අරමුණ වන්නේ එම ක්‍රියාවලියේ සංකීර්ණතා අවබෝධ කර ගැනීම පමණක් නොව ඉන් වන හානිය අවම කිරීමේ උපාය මාර්ග සැකසීමයි.එවන් උපක්‍රම හඳුනා ගැනීම ඉතාමත් වැදගත් වන්නේ මේ තුලින් තිරසාර ධීවර කර්මාන්තයක් ඇති කිරීම සහ සමුද්‍ර ක්ෂීරපායින් අතර සමතුලිතතාවයක් පවත්වාගත හැකි නිසාවෙනි.

මෙම අධ්‍යනයට අනුව වාර්ෂිකව ශ්‍රී ලංකාවේ සමුද්‍රීය මරුවැල් පන්න ධීවර කර්මාන්තයෙන් අල්ලාගනු ලබන කහවරල් කෙලවල්ලන්ගෙන් 25% කට ආසන්න ප්‍රමාණයක් සමුද්‍ර ක්ෂීරපායින් විශේෂ හතරක් විසින් විනාශකරන බව සොයා ගෙන ඇත.එහි ප්‍රතිඵලයක් ලෙස විලොපිකතා දර්ශකය (depredation index), හානියට පත් අනුපාතිකය (damage rate) සහ විලෝපිකතා අනුපාත (depredation rate) පිළිවෙලින් 1.25%, 26% සහ 33% වේ. ඇස්තමේන්තු ගත ක්ෂයවීම් දර්ශක අවධාරනය කරන්නේ මරුවල් පන්නයට හසුවන මසුන් විලෝපිකයින් විසින් කා දැමීම, එම කර්මාන්තයට සිදුවන සැලකිය යුතු අභියෝගයක් බවයි.තවද ප්‍රශ්නාවලි මත පදනම්ව සිදු කරන ලද සමීක්ෂණයේ දී 2023 වසරේදී එකදු සමුද්‍ර ක්ෂීරපායී සතෙකු හෝ අනපේක්ෂිත ලෙස මරුවැල් පන්නවලට හසුවී නොමැත.තවද පින්ගර් භාවිතා කොට සිදු කරන ලද සමීක්ෂණයෙන් ලබා ගන්න ලද දත්ත වලට අනුව විලෝපිකතාවය වලක්වා ගැනීම සඳහා ඒවායේ සාර්ථකභාවය පිළිබඳව නිශ්චිත නිගමනයකට පැමිණිය නොහැක. එයට හේතුව වන්නේ අප සතු පින්ගර් ප්‍රමාණය ඉතාමත් අඩු බැවින් ඒවා යොදාගෙන සිදුකරන ලද සමීක්ෂණ වාර ගණන අඩුවීමයි. ලංකාවට ආසන්න බෙංගාල බොක්ක සහ අරාබි මුහුද හා සසඳන විට සමක කලාපයේ කෙලවල්ලන්ට සිදුවන හානියේ කැපී පෙනෙන වර්ධනයකට මුහුණ දී සිටියද, ධීවරයින් මෙම අභියෝගාත්මක කලාපය සඳහා වැඩි කැමැත්තක් දක්වති. එයට හේතුව වන්නේ එම කලාපයේ හානිය වැඩි වුවද වැඩි මසුන් ප්‍රමාණයක් කොකුවලට හසුවන බැවිනි.ලංකාවේ සංවේදී කලාපයක් වන මිරිස්ස අවට ප්‍රදේශයේ මුහුදු ප්‍රදේශයේ සමුද්‍ර ක්ෂීරපායි විවිධත්වය සහ සුලබතාවය පිළිබඳව (යෝජිත මිරිස්ස සමුද්‍රීය සංරක්ෂිත කලාපය තුල) තල්මසුන් නැරඹීමේ යාත්‍රා භාවිතාකොට සිදුකරනලද සමීක්ෂණයට අනුව

එම කලාපයේ 2023 වසරේදී සමුද්‍ර ක්ෂීරපායි විශේෂ 13ක් පමණ වාර්තා විය. නමුත් 2023 වසරේදී වෙනත් වසර වලට සාපේක්ෂව නිල් තල්මසුන්ගේ (*Balaenoptera musculus indica*) සාපේක්ෂ සුලබතාවය ඉතාමත්ම අඩු විය. එම වසරේ සැප්තැම්බර් මස මුල සිට දෙසැම්බර් මස අග දක්වා කාලයේදී අවස්ථා 18කදී හමුවී ඇත්තේ නිල් තල්මසුන් 18 දෙනෙකි. එය වරකදී එක සතෙකු පමණක් බැගිනි.මෙම අඩුවීම එක්ස්ප්‍රස් පර්ල් නැවෙන් සිදුවූ පාරිසරික හානිය හේතුවෙන් සිදුවූ මාධ්‍ය කාලීන බලපෑමක්ද විය හැකි බැවින් ඒ පිළිබඳව අවධානය යොමුකොට පර්යේෂණ සිදුකිරීම කල යුතුය.

රූපය 19. මෙම අධ්‍යනයේදී හඳුනාගන්නා ලද නිල් තල්මසුන්ගේ ශරීර කොටස්

ව්‍යාපෘතිය 7.2: ස්වභාවික පරිසරයෙන් මුහුදු පැළෑටි අස්වැන්න නෙලාගන්නා ක්‍රම සහ ඒ සඳහා බලපැවැත්වෙන නීති රෙගුලාසි ඇඟයීමට ලක්කිරීමත්, එනයින් සම්පත්හි තිරසාර පැවැත්ම සඳහා පරිසර හිතකාමී කළමනාකරණ ක්‍රමවේදයක් සකස් කිරීම.
සාර්ගසම්, ග්‍රැසිලාරියා සහ සැලිකෝනියා වැනි ඇල්ගී වර්ග ප්‍රාථමික ආහාර නිෂ්පාදනය, කාබන් තිර කිරීම, පෝෂක ද්‍රව්‍යය චක්‍රීකරණය, වාසස්ථාන සැපයීම, ජෛව විවිධත්වයට ඉඩ සැලසීම සහ ධීවර කර්මාන්තයට උදව් කිරීම වැනි පාරිසරික සේවාවන් ගණනාවක් ඉටුකර දේ.

මෙම ඇල්ගී ස්වභාවික පරිසරයෙන් එකතු තරගෙන අපනයනය කිරීම නිසා පාරිසරික ගැටළු රාශියක් ඇතිවී තිබේ. එම හානියේ තීව්‍රතාවය අස්වැන්න නෙලාගන්නා ක්‍රමය සහ නෙලාගනු ලබන ප්‍රමාණය මත තීරණය වේ. මෙම අධ්‍යයනයේදී තහවුරු වූයේ වර්තමානයේ නෙලාගනු ලබන වාර්ෂික අස්වැන්න 31,540.13 Kg පමණ වන අතර එය පවතින ජෛව ස්කන්ධය 5% පමණ වේ. එමෙන්ම වර්ග මීටරයක වපසරිය තුල සෘතුවකට නෙලා ගැනීමට යෝග්‍ය වනුයේ 5 Kg පමණ අස්වැන්නක් බව සොයාගන්නා ලදී. මෙම වසරේ මාර්තු අප්‍රේල් කාලය තුල ස්වභාවික පරිසරයෙන් මුහුදු පැළෑටි 180,000 Kg ඉවත්කර ඇති අතර ජනවාරි - පෙබරවාරි මාස දෙකෙහි මුහුදු පැළෑටි ටොන් 100 ක් අපනයනය කර තිබේ. ස්වභාවික පරිසරයෙන් කිසියම් විශේෂයෙන් 5% ප්‍රමාණය ඉක්මවා ඉවත්කරන විට වෙනත් ආගන්තුක විශේෂ එම පරිසරය ආක්‍රමණය කිරීම ජෛව විවිධත්වයට සහ වෙනත් පාරිසරික ගැටළු ඇතිවීමට බලපාන බැවින් ස්වභාවික වාසස්ථාන වල ඇති ශාක ඉවත් කරනු වෙනුවට වෙරළ තීරයට ඉබේ ගසාගෙන එනු ලබන ද්‍රව්‍යය එකතුකර අලෙවි කිරීම නිර්දේශ කරනු ලැබේ.

සංචිත ජෛව ස්කන්ධය (කි.ගෑ)	වාර්ෂික අස්වැන්න (1.28% ජෛව ස්කන්ධය/ dx90 දින)	යෝජිත වාර්ෂික අස්වැන්න (කි.ගෑ)	නෙලා ගන්නා ප්‍රමාණය ජෛව ස්කන්ධයේ ප්‍රතිශතයක් ලෙස
630,802.74	72,668.47	31,540.13	5%

8. ප්‍රාදේශීය පර්යේෂණ මධ්‍යස්ථානය - කඩොල්කැලේ (රු.මි.1.50)

ව්‍යාපෘතිය 8.1. කඩොලාන ව්‍යාප්තිය සඳහා තාක්ෂණික ක්‍රම සංවර්ධනය කිරීම සහ කඩොලාන පරිසර පද්ධතිය පිළිබඳ දැනුම බෙදා හැරීම
කඩොලාන ධීවර කර්මාන්තය සඳහා වාසස්ථාන, සංස්කෘතික හා ආගමික වටිනාකම්, පරිසර සංචාරක, පෙරීම සහ භූමිඡය ගලායාම, කුණාටු වලට එරෙහිව වෙරළ තීරය ස්ථාවර කිරීම, කාබන් ගිලා බැසීම් සහ හරිතාගාර වායු ඉවත් කිරීමෙන් දේශගුණික විපර්යාස අවම කිරීම වැනි වටිනා පරිසර පද්ධති සේවාවන් සපයයි. ශ්‍රී ලංකාව 2012 දී හෙක්ටයාර 15,670 ක කඩොලාන ආවරණයක් ලෙස ඇස්තමේන්තු කර ඇත. ශ්‍රී ලංකාවේ කඩොලාන විශේෂ 21 ක් හඳුනා ගනී.

කඩොල්කැලේ ප්‍රාදේශීය පර්යේෂණ මධ්‍යස්ථානය විසින් කඩොලාන පරිසර පද්ධති සංරක්ෂණය සඳහා සැලකිය යුතු උත්සාහයක් ගෙන ඇති අතර, දුර්ලභ හා වඳවීමේ තර්ජනයට ලක්ව ඇති කඩොලාන විශේෂ කිහිපයක් ව්‍යාප්ත කිරීම කෙරෙහි අවධානය යොමු කර ඇත. ප්‍රචාරණය කරන ලද විශේෂ අතර IUCN විසින් ලැයිස්තුගත කර ඇති බරපතල වඳවීමේ තර්ජනයට ලක්ව ඇති කඩොලාන *Lumnitzera littorea* ලෙසද වඳවීමේ තර්ජනයට ලක්ව ඇති කඩොලාන සහ දුර්ලභ කඩොලාන විශේෂයක් වන *Scyphiphora hydrophyllacea*, an endangered true mangrove also listed by the IUCN, and *Xylocarpus granatum*, වේ. වායු ස්ථර ශාක ප්‍රචාරණ තාක්‍ෂණය මගින් ප්‍රචාරණය ලබා ගන්නා ලදී. මෙය ප්‍රකාශන තුනක ලේඛනගත කර ඇත.

රූපය 20. ලේයර් තාක්‍ෂණය මගින් ලබා ගන්නා ලද කඩොලාන පැල

රූපය 21. වායු ස්ථර ශාක ප්‍රචාරණ තාක්‍ෂණය මගින් ලබා ගන්නා ලද පැල

මීගමුව කලපුවේ කඩොලාන ව්‍යාප්තිය සම්බන්ධයෙන් දත්ත නොමැතිකම හේතුවෙන් මීගමුවේ කඩොලාන ව්‍යාප්තිය සහ විවිධත්වය සිතියම් ගත කිරීමට තීරණය විය. අධ්‍යයනය සඳහා ස්ථාන පහක් තෝරා ගන්නා ලද අතර, එම ස්ථාන වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් සංරක්ෂණ ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත් කරන ලද ස්ථාන වේ. විශේෂ ව්‍යාප්තිය කෙරෙහි පාංශු ලවණතාවයේ බලපෑම විමර්ශනය කිරීම සඳහා ලවණතාවය මනිනලදී. දේශගුණික විපර්යාස සඳහා වගකිව යුතු ප්‍රධාන සංරචකය කඩොලාන වන බැවින්, තෝරාගත් ප්‍රදේශ සඳහා නිල් කාබන් විශ්ලේෂණය සිදු කරන ලදී. එක් එක් දූපත්වල කඩොලාන ඝනත්වය සමඟ මූලික සිතියම නිම කරන ලදී.

9. ප්‍රාදේශීය පර්යේෂණ මධ්‍යස්ථානය - කල්පිටිය (රු.මි.2.00)

ව්‍යාපෘතිය 9.0. පුත්තලම කලපුවේ දෙපියන්බෙල්ලන් හා කකුළුවන් මත්ස්‍ය කර්මාන්තය අධීක්ෂණය හා තක්සේරු කිරීම: විශේෂ අවධානය කල්පිටිය කලාපයට/ කල්පිටිය කලාපය ආශ්‍රිතව
ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව (DFAR) විසින් කරන ලද ඉල්ලීම මත ආරම්භ වූ මෙම ව්‍යාපෘතිය පුත්තලම කලපුවේ සහ කල්පිටිය ප්‍රදේශයේ ක්‍රියාත්මක වෙමින් පවතී. මෙම ව්‍යාපෘතියේ මූලික අරමුණු වනුයේ දෙපියන් බෙල්ලන් සඳහා ධරණීය කළමනාකරණය, ප්‍රදේශය, ප්‍රමාණය, සහ ඍතු පාදක කරගනිමින් සිදුකිරීමත්, කල්පිටිය ප්‍රදේශයේ මඩ කකුළු සම්පත් තිරසාර ලෙස භාවිතය සඳහා උපාය මාර්ග එහි පරිසර විද්‍යාව සහ ජීව විද්‍යාව ඇසුරින් නිර්දේශ කිරීමත් වේ. දෙපියන් බෙල්ලන් මත්ස්‍ය කර්මාන්තය සිදුකරන අස්වනු නෙළීමේ බිම් 09ක් පමණ හඳුනාගෙන ඇති අතර, එම ධීවර බිම්වල

බහුලතාවය තක්සේරු කිරීම සඳහා සිව්රැසි නියැදි තාක්ෂණය යොදා ගන්නා ලදී. scallops, clams, mussels සහ oyster ඇතුළුව දෙපියන් බෙල්ලන් විශේෂ 06ක් හඳුනා ගන්නා ලදී. ඒ අතරින් විශේෂ 03ක්; *Marcia hiantina* (kokkumatti), *Marcia opima* (bolamatti) සහ *Gafrarium tumidum* (Varimatti) වාණිජමය අරමුණු සඳහා බහුල ලෙස යොදාගන්නා බව දක්නට ලැබේ. වඩදිය උච්චාවචනයන් සහ මිරිදිය ගලා එන කාල සීමාවන් සක්‍රීය මසුන් ඇල්ලීමේ කාලයට බෙහෙවින් බලපායි. අස්වනු නෙලීමේ තාක්ෂණය (පහළ වැලි හැරීමට කුඩා අත් සවල සහ දෙපියන් බෙල්ලන් ලබාගැනීම සඳහා පෙරනයක් භාවිතා කිරීම), මුහුදු තෘණ මත සැලකිය යුතු බලපෑමක් ඇති කරන අතර එය පරිසර හිතකාමී මෙන්ම කාර්යක්ෂම අස්වනු නෙලීමේ මෙවලමක් මගින් ප්‍රතිස්ථාපනය කළ යුතුය. ධීවර කර්මාන්තය සම්බන්ධයෙන්, අපි අවධානය යොමු කරන්නේ මඩ කකුළුවන් (Scylla serrata), ඔවුන්ගේ ජීව විද්‍යාව, මසුන් ඇල්ලීමේ ක්‍රම සහ ඍතුමයභාවය ගැන පමණි. ප්‍රදේශයේ මඩ කකුළුවන් ඇල්ලීමේ ස්ථාන ලෙස බහුලව පැතිරී ඇති ස්ථාන 23ක් පමණ දැකගත හැකි විය. මඩ කකුළුවන් ඉලක්ක කිරීම සඳහා බහුලව භාවිතා වන දැල් ප්‍රමාණය 12.7cm සහ විවිධ ප්ලයි ප්‍රමාණය (06 සහ 04) සහිත කරමල් දැල්/ කකුළු දැල්වේ. එයට අමතරව සමහරවිට අවස්තාවලදී වෙනත් කරමල් දැල් වර්ග භාවිතයට ගනී (මෝර දැල්, මඩු දැල් සහ සීබාස් දැල්). අල්ලා ගන්නා ලද කකුළුවන් ප්‍රමාණයෙන් ග්‍රෑම් 250 සිට ග්‍රෑම් 1000 දක්වා ප්‍රමාණයෙන් යුක්ත වන අතර එහිදී ධීවරයින් විසින් ප්‍රමාණය අනුව පවත්වාගෙන යනු ලබන ශ්‍රේණිගත කිරීම් වර්ග හයක් ඇති අතර ඒ අනුව අපනයන සමාගම්වලට (> ග්‍රෑම් 500 පුද්ගලයින්ට) හෝ දේශීය වෙළෙඳපොළට (< පුද්ගලයන් 500 ග්රෑම්) ලබාදීම සිදුකරයි. මඩ කකුළුවන් ධීවර කර්මාන්තය සඳහා ඍතුමයභාවය බෙහෙවින් බලපාන අතර ඔක්තෝබර් - මාර්තු / අප්‍රේල් මාසවල වඩා හොඳ අස්වැන්නක් ලැබෙන අතර මැයි - සැප්තැම්බර් (ප්‍රධාන වශයෙන් නිරිතදිග මෝසම් වලදී) ඉතා සුළු වශයෙන් කකුළුවන් අස්වැන්නක්ලැබෙන අවාර සමයකි.

10. ප්‍රාදේශීය පර්යේෂණ මධ්‍යස්ථානය - පනාපිටිය (රු.මි.2.00)

ව්‍යාපෘතිය 10.1: කළුතර දිස්ත්‍රික්කයේ විසිතුරු මත්ස්‍යය වගාකරුවන් බලගැන්වීම

නාරා ආයතනයේ පනාපිටිය ප්‍රාදේශීය පර්යේෂණ මධ්‍යස්ථානය මූලිකව මත්ස්‍ය ආහාර පිළිබඳව පර්යේෂණ කිරීම, විසිතුරු මත්ස්‍ය ආහාර නිපද වීම හා විසිතුරු මසුන් අභිජනනය හා වර්ධනය කිරීම සිදු කරනු ලබයි.මෙහිදී විසිතුරු මත්ස්‍ය ආහාර වට්ටෝරු අදාල වගාකරුවන්ට සැපයීම, දැනට නිෂ්පාදනය කරන මත්ස්‍ය ආහාරවල තත්වය වැඩිදියුණු කිරීමට උපදෙස් සැපයීම සහ අතිරික්ත නිෂ්පාදනය වගාකරුවන්ට අළෙවි කිරීම මෙම මධ්‍යස්ථානය මඟින් සිදු කරයි.

දේශීය මත්ස්‍ය ආහාර නිෂ්පාදකයන්ට ප්‍රධාන ගැටළුවක් වන්නේ උසස් තත්වයේ fishmeal සඳා ගත නොහැකි වීමයි.තවද fishmeal වෙනුවට ලොව පවතින ප්‍රධාන තිරසාර විකල්පය වන්නේ insect meal වේ. ලංකාවේ ජලජීවී වගා ප්‍රගමනයට වැදගත්විය හැකි insect meal යොදා මත්ස්‍ය ආහාර සෑදීම පිළිබඳ පර්යේෂණ මාලාවක් මේ වසර තුල නිම කර ඇත.තවද ක්ෂේත්‍රයේ කාලීන ගැටළුවක් විසිතුරු මත්ස්‍ය මේදය තැන්පත් වීම (fatty liver) වැලැක් වීම සඳහා හින්බෝව්ටියා ශාකමය ආකලනයක් ලෙස යොදා ගැනීම පිළිබඳව පර්යේෂණ නිමාකර ඇත.මීට අමතරව විසිතුරු මසුන් නිෂ්පාදනය කර මව් සතුන් වගාකරුවන්ට සැපයීම හා අනෙක් වර්ධන අවස්ථා අළෙවි කිරීමද මෙම මධ්‍යස්ථානය මඟින් සිදු කරනු ලබයි.

මේ වසර තුල ජාත්‍යන්තර පර්යේෂණ පත්‍රිකා දෙකක් පළ කර ඇත.දේශීය විශ්ව විද්‍යාල මගින් සිදුකරන පර්යේෂණ වලදී ඒකාබද්ධව කටයුතු කිරීම මෙන්ම සහයෝගය දැක්වීමද මධ්‍යස්ථානය මඟින් සිදු කරයි.උතුරු පළාතට අනන්‍ය ශාකයක් වන තල් පළතුරු සාරයෙන් විසිතුරු මසුන්ගේ වර්ධනය වැඩිදියුණු කිරීමට යාපනය විශ්ව විද්‍යාලය මගින් සිදු කරන ලද පර්යේෂණයක් සඳහා මධ්‍යස්ථානය මඟින් වර්ණ විශ්ලේෂණය සඳහා තාක්ෂණික සහය ලබා දී ඇත.තවද සබරගමුව විශ්ව විද්‍යාලය මඟින් සිදු කරන ලද පර්යේෂණයක් සඳහා අවශ්‍ය පර්යේෂණ ආහාර නිෂ්පාදනය කර ඇත.මෙයට අමතරව මේ වසර තුල පේරාදෙණිය, රුහුණු, සාගර,තාක්ෂණික පර්යේෂණ යන විශ්ව විද්‍යාල වල ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට පුහුණුව ලබා දී ඇත.

11. ප්‍රාදේශීය පර්යේෂණ මධ්‍යස්ථානය - පූනරින් (රු.මි.1.80)

ව්‍යාපෘතිය 11.1: යාපනය සිට කල්පිටිය වෙරළ ආශ්‍රිත කලාපයේ මුහුදු කුඩැල්ලන් පැටවුන්ගේ පැවැත්ම, වර්ධනය සහ තිරසාර නිෂ්පාදනය විශ්ලේෂණය කිරීම සහ කළමනාකරණය

මුහුදු කුඩැල්ලන්, පාරිසරිකව සහ ආර්ථිකමය වශයෙන් වැදගත් අපෘෂ්ඨ වංශිකයකු වන අතර, ඔවුන්, වෙරළ ආශ්‍රිත පරිසරය සමබරව පවත්වාගෙන යාමට දායකවේ. මෑත කාලයේදී, යාපනය සිට කල්පිටිය වෙරළ ආශ්‍රිත කලාපයේ මුහුදු කුඩැල්ලන් පැටවුන් අධික ලෙස ඇල්ලීම සිදුකරන බැවින්, එම සම්පත තිරසාර ලෙස භාවිතා කරමින්, එම කර්මාන්තයේ නියුතු ධීවර ප්‍රජාවගේ යහපැවැත්ම සඳහා මෙම තත්වය විශ්ලේෂණය කිරීම වැදගත් වේ.

2024 ජූලි මස 31 වනවිට මෙම පර්යේෂණ අධ්‍යනයෙන්, 60% ක ප්‍රමාණයක් සම්පූර්ණ කර ඇති අතර, මෙහි ප්‍රධාන අරමුණ වනුයේ, මුහුදු කුඩැල්ලන් පැටවුන්ගේ වර්ධනය, ජීවන අනුපාතය විශ්ලේෂණය කිරීම වැනි සාධක මත, තිරසාර ලෙස අස්වනු ලබාගැනීමේ ශක්‍යතාවය අධ්‍යනය කිරීමයි. මෙම පර්යේෂණ අධ්‍යනය සඳහා, මුහුදු කුඩැල්ලන් බහුලව වාසය කරන යාපනය සිට කල්පිටිය වෙරළ ආශ්‍රිත කලාපය තෝරාගත් අතර, මෙමගින්, කාලානුරූපී පාරිසරික පරාමිතීන් වන ජලයේ මතුපිට උෂ්ණත්වය, ලවණතාවය සහ පෝෂණ මට්ටම අධ්‍යනය කිරීම මගින්, පැටවුන්ගේ ව්‍යාප්තියට බලපානු ලබන සාධක අධ්‍යනය කරනු ලැබේ.

මේ වන තෙක් ලබාගත් දත්ත මගින්, මැයි - ජූනි (මෝසම් කාලයට පෙර) ලබාගත් දත්ත අනුව, ජලයේ උෂ්ණත්වයට අනුව ගහනයේ ධනාත්මක සහ සම්බන්ධතාවයක් පෙන්නුම් කළේය. ළවණතාවය සහ පෝෂණ මට්ටම මේ වන තෙක් ප්‍රශස්ත මට්ටමක පවතී.

ධීවරයන් සමග පැවැත්වූ සමාජ-ආර්ථික අධ්‍යයනයන් මගින්, මුහුදු කුඩැල්ලන් පැටවුන්ගේ විශාල අඩුවීමක් පවතින බව අවධාරණය කළ අතර, එය අධික පාරිභෝජනය නිසා සිදුවන බවට තහවුරු විය. ඔවුන් පවසන පරිදි, එයට හේතු වූයේ දැඩි ආර්ථික ගැටළු බවටද තහවුරු විය. එබැවින්, මෙම කර්මාන්තය අඛණ්ඩව පවත්වා ගැනීම සඳහා තිරසාර කළමනාකරණ ක්‍රියාවලියක් අවශ්‍ය වේ.

ඉදිරි කාලයේදී, තවදුරටත් මෙම පර්යේෂණය සඳහා සාම්පල ලබා ගැනීම සහ මෝසම් කාලයේදී මෙම ජීවීන්ගේ හැසිරීම අධ්‍යනය කරනු ලැබේ. එමෙන්ම මෙම කර්මාන්තය තිරසාරව කළමනාකරණය කිරීම සඳහා පාරිසරික සහ සමාජ විද්‍යාත්මක දත්ත ඒකාබද්ධ කිරීම අත්‍යාවශ්‍ය වන අතර, මෙම පර්යේෂණ මගින්, කල්පිටිය ආශ්‍රිත ප්‍රදේශය අවට නව ගොවිපල පිහිටුවීමේ ශක්‍යතාවයද අධ්‍යනය කරනු ලැබේ. එමෙන්ම, එම ජීවීන්ගේ ආර්ථික තිරසරභාවය සහ ස්වභාවික පරිසරයට සිදුවන බලපෑම අධ්‍යනය කරයි.

මෙම පර්යේෂණය මගින්, මුහුදු කුඩැල්ලන්ගේ ගහණය පිළිබඳ අවබෝධයක් ලබාගත හැකි අතර, දිගුකාලීන තිරසර කළමනාකරණ අවස්තාවක් ලබාගැනීම තහවුරු කිරීම සිදුකරයි. තවද, මෙම ක්ෂේත්‍රය තුළ නියලෙන්නන් සහ විද්‍යාත්මක තහවුරුකිරීම් මගින්, වෙරළාශ්‍රිත ජ්‍රජාවගේ ආර්ථික යහපැවැත්ම තහවුරු කිරීම අරමුණු වේ.

12. ප්‍රාදේශීය පර්යේෂණ මධ්‍යස්ථානය - රැකව (රු.මි.2.00)

ව්‍යාපෘතිය 12.1: ග්‍රාමීය ප්‍රජාවගේ ජීවන තත්ත්වය නඟා සිටුවීමේ අරමුණින් සහ දූෂණයෙන් තොර මුහුදු තීරයක් සහතික කිරීම සඳහා ක්‍රියාත්මක කරනු ලබන පර්යේෂණය

වත්මන් ව්‍යාපෘතිය තුළින් ශ්‍රී ලංකාවේ දකුණු පළාතේ වෙරළබඩ පරිසර පද්ධතිය තිරසාර කිරීම සහ ජලජීවී වගා ප්‍රවර්ධනය කිරීම කෙරෙහි අවධානය යොමු කර ඇත. ව්‍යාපෘතිය සංරචක තුනකින් සමන්විත වේ.

i). රත්ගම කලපුවේ ජලජීවී වගාව

ග්‍රාමීය ප්‍රජාවගේ ජීවන තත්ත්වය නඟා සිටුවීමේ අරමුණින් රත්ගම කලපුවේ කූඩු තුළ ඉස්සන්ඇති කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කරන ලදී. දිළිඳු ධීවර පවුල් සඳහා විකල්ප සහ අතිරේක ආදායම් මාර්ගයක් සපයමින් දිළිඳුකම තුරන් කිරීමේ අරමුණින්මෙම වැඩසටහන සැලසුම් කර ඇත. මෙහිදී *Penaeus vannamei* යන ඉස්සන් වර්ගය, 50 m^2 (දිගxපළල) ප්‍රමාණයේ කූඩු3කට (SD1,SD2,SD3) 1650, 1250,

සහ 850ක් බැගින් කූඩුවල ගබඩා කරන ලදී. *Penaeus vannamei* යන ඉස්සන් වගාව සඳහා කලපුවේ යෝග්‍යතාවය තහවුරු කර ගැනීම සඳහා කලපුවේ ලවණතාව, උෂ්ණත්වය, ද්‍රාවිත ඔක්සිජන් (DO), ජෛව රසායනික ඔක්සිජන් ඉල්ලුම (BOD) සහ ගැඹුර ඇතුළු පාරිසරික පරාමිතීන් මාසිකව නිරීක්ෂණය කරන ලදී. මෙම ඉස්සන් සාර්ථකව වගා කිරීම සඳහා මනින ලද සියලු පරාමිතීන් ප්‍රශස්ත පරාසයක පවතින බව ප්‍රතිඵල පෙන්නුම් කළේය.

ඉස්සන්ගේ එක් ජීවන චක්‍රයක් සම්පූර්ණ කරන ලද අතර, රූපය 20 හි දැක්වෙන පරිදි අස්වැන්නේ සැලකිය යුතු වර්ධනයක් පෙන්නුම් කළේය. මෙම ප්‍රතිඵල අනුව එළඹෙන නිගමනය වන්නේ රත්ගම කලපුවේ කූඩුවල වගා කිරීමට *Penaeus vannamei* යන ඉස්සන් වර්ගය සුදුසු බවයි. අස්වැන්න තවත් වැඩිකර ගැනීම සඳහා මීළඟ වගා චක්‍රයේ වෙනස් කිරීම් කිහිපයක් ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වේ.



රූපය 22. කූඩුවල ගබඩා කර ඇති ඉස්සන්ගේ බර අනුව වර්ධනය නිරූපණය කරන සමුච්චිත සංඛ්‍යාත වක්‍රය

රූපය 23. රත්ගම කලපුවේ කූඩු තුළ ඉස්සන් වගාව

ii). මුහුදු ස්නානය කරන ස්ථානවල ජල තත්ත්ව තක්සේරු කිරීම

ස්නානය සහ අනෙකුත් විනෝද ක්‍රියාකාරකම් සඳහා දූෂණයෙන් තොර මුහුදු තීරයක් සහතික කිරීම සඳහා හම්බන්තොට දිස්ත්‍රික්කයේ පරවිවැල්ල සහ හිරිකැටිය යන ජනප්‍රිය මුහුදු නාන ස්ථාන දෙකක ජල තත්ත්ව පරාමිතීන් නිරීක්ෂණය කරන ලදී. පරවිවැල්ල සහ හිරිකැටිය යනු දෙස් විදෙස් ජනතාව භාවිත කරන මුහුදු නෑමට හා දිය මත ලිස්සා යාම වඩාත් ප්‍රසිද්ධ ස්ථානයන් දෙකකි.

